**පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 19**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
නවවැනි පාර්ලිමේන්තුව
(සිව්වැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව

(2021.11.11 සිට 2021.12.08 දක්වා)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා විසින්

2023 මාර්තු මස 24වැනි දින ඉදිරිපත් කරන ලදී

*2023 මාර්තු මස 24වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී*

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව</u>**

**<u>නවවැනි පාර්ලිමේන්තුව (සිව්වැනි සභාවාරය)</u>**

2023 පෙබරවාරි මස 22 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 හි විධිවිධාන සහ 2023 පෙබරවාරි මස 10 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 31දෙනෙකු පත් කරන ලදී.

1. ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා, පා.ම., (සභාපති)
2. ගරු ජගත් පුෂ්පකුමාර මහතා, පා.ම.,
3. ගරු ජානක වක්කුඹුර මහතා, පා.ම.,
4. ගරු ලොහාන් රත්වත්තේ මහතා, පා.ම.,
5. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා, පා.ම.,
6. ගරු ඩී. වී. චානක මහතා, පා.ම.,
7. ගරු ශාන්ත බණ්ඩාර මහතා, පා.ම.,
8. ගරු අනුර දිසානායක මහතා, පා.ම.,
9. ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා, පා.ම.,
10. ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා, පා.ම.,
11. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම.,
12. ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
13. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.,
14. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා, පා.ම.,
15. ගරු නිමල් ලාන්සා මහතා, පා.ම.,
16. ගරු ජයන්ත සමරවීර මහතා, පා.ම.,
17. ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා, පා.ම.,
18. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.,
19. ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.,
20. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම.,
21. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.,
22. ගරු සංජීව එදිරිමාන්න මහතා, පා.ම.,
23. ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා, පා.ම.,
24. ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා, පා.ම.,
25. ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා, පා.ම.,
26. ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා, පා.ම.,
27. ගරු එම්. රාමේෂ්වරන් මහතා, පා.ම.,
28. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා, පා.ම.,
29. ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය, පා.ම.,
30. ගරු නීතිඥ මධුර විතානගේ මහතා, පා.ම.,
31. ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා, පා.ම.,

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව**

**නවවැනි පාර්ලිමේන්තුව (තෙවැනි සභාවාරය)**

2022 ඔක්තෝබර් මස 08 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 හි විධිවිධාන සහ 2022 අගෝස්තු මස 29 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 30දෙනෙකු පත් කරන ලදී.

1. ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා, පා.ම., (සභාපති)
2. ගරු ජගත් පුෂ්පකුමාර මහතා, පා.ම.,
3. ගරු ජානක වක්කුඹුර මහතා, පා.ම.,
4. ගරු ලොහාන් රත්වත්තේ මහතා, පා.ම.,
5. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා, පා.ම.,
6. ගරු ඩී. වී. චානක මහතා, පා.ම.,
7. ගරු ශාන්ත බණ්ඩාර මහතා, පා.ම.,
8. ගරු අනුර දිසානායක මහතා, පා.ම.,
9. ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා, පා.ම.,
10. ගරු පාඨලී චම්පික රණවක මහතා, පා.ම.,
11. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම.,
12. ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
13. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.,
14. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා, පා.ම.,
15. ගරු නිමල් ලාන්සා මහතා, පා.ම.,
16. ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා, පා.ම.,
17. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.,
18. ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.,
19. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.,
20. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම.,
21. ගරු සංජීව එදිරිමාන්න මහතා, පා.ම.,
22. ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා, පා.ම.,
23. ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා, පා.ම.,
24. ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා, පා.ම.,
25. ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා, පා.ම.,
26. ගරු එම්. රාමේෂ්වරන් මහතා, පා.ම.,
27. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා, පා.ම.,
28. ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය, පා.ම.,
29. ගරු නීතිඥ මධුර විතානගේ මහතා, පා.ම.,
30. ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා, පා.ම.,

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
## නවවැනි පාර්ලිමේන්තුව (දෙවැනි සභාවාරය)

2022 පෙබරවාරි මස 08 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(1)හි විධිවිධාන සහ 2022 ජනවාරි මස 21 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් නවවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 22දෙනෙකු පත් කරන ලදී.

1. ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා, පා.ම. (සභාපති)
2. ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා, පා.ම.
3. ගරු මහින්ද අමරවීර මහතා, පා.ම.
4. ගරු අනුර දිසානායක මහතා, පා.ම.
5. ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.
6. ගරු පාඨලී චම්පික රණවක මහතා, පා.ම.
7. ගරු ජගත් පුෂ්පකුමාර මහතා, පා.ම.
8. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම.
9. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
10. ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා, පා.ම.
11. ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා, පා.ම.
12. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම.
13. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා, පා.ම.
14. ගරු ජයන්ත සමරවීර මහතා, පා.ම.
15. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා, පා.ම.
16. ගරු ඩී. වී. චානක මහතා, පා.ම.
17. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.
18. ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.
19. ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා, පා.ම.
20. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා, පා.ම.
21. ගරු මධුර විතානගේ මහතා, පා.ම.
22. ගරු සාගර කාරියවසම් මහතා, පා.ම.

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
## නවවැනි පාර්ලිමේන්තුව (පළමුවැනි සභාවාරය)

2020 සැප්තැම්බර් මස 11 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(1)හි විධිවිධාන ප්‍රකාරව 2020 අගෝස්තු මස 27වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 22දෙනෙකු පත් කරන ලදී.

1. ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා, පා.ම.,(සභාපති)
2. ගරු මහින්ද අමරවීර මහතා, පා.ම.
3. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම.
4. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
5. ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා, පා.ම.
6. ගරු ජයන්ත සමරවීර මහතා, පා.ම.
7. ගරු දිලුම් අමුණුගම මහතා, පා.ම. (2021.09.02 දින සිට ඉල්ලා අස්වන ලදී )
8. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා, පා.ම.
9. ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා, පා.ම.
10. ගරු ඩී. වී. චානක මහතා, පා.ම.
11. ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා, පා.ම.
12. ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා, පා.ම. (2021.09.13 දින සිට ඉල්ලා අස්වන ලදී)
13. ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.
14. ගරු අනුර දිසානායක මහතා, පා.ම.
15. ගරු පාඨලී චම්පික රණවක මහතා, පා.ම.
16. ගරු ජගත් පුෂ්පකුමාර මහතා, පා.ම.
17. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම. (2021.05.04 දින සිට පත් කරන ලදී )
18. ගරු ඉරාන් වික්‍රමරත්න මහතා, පා.ම.
19. ගරු රන්ජන් රාමනායක මහතා, පා.ම. (2021.04.07 දින සිට පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි විය)
20. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.
21. ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.
22. ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා, පා.ම.
23. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා, පා.ම.
24. ගරු මධුර විතානගේ මහතා, පා.ම. (2021.09.02 දින සිට පත් කරන ලදී )

**<u>කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය</u>**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - නිශාන්ති එස්. වික්‍රමරත්න මිය
- ප්‍රධාන නිලධාරී - සී. එම්. සුබසිංහ මිය
- නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. ඒ. එම්. ෂහීඩ් මයා
- නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - ජී. ආර්. යූ. ගමගේ මිය
- සහකාර ප්‍රධාන නිලධාරී - ඩබ්ලිව්. එල්. එස්. ඩී. ද අල්විස් මිය
- සහකාර ප්‍රධාන නිලධාරී - යූ. එස්. ප්‍රභාෂිනී මිය
- පාර්ලිමේන්තු නිලධාරී - ආර්. සී. කුලතිලක මිය
- පාර්ලිමේන්තු නිලධාරී - ජී.එම්. එච්. එස්. ගම්ලත් මිය
- පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මෙය
- පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය

**<u>කාරක සභා වාර්තා</u>**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බා ගත කළ හැක.

www.parliament.lk → සිංහල → ප්‍රකාශන → කාරක සභා වාර්තා

## <u>පටුන</u>


| | | **පිටු අංක** |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ සටහන | xi |
| 2. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරයේ පළමුවැනි වාර්තාව | xiii |
| 3. | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 1 |
| 4. | පොදු ව්‍යාපාර කාරක සභාව මගින් විමර්ශනය කරන ලද විශේෂ විගණන වාර්තා සහ විමර්ශනයට ලක් කරන ලද ආයතන | |
| i | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 3 |
| ii | ජාතික තරුණ සේවා සභාව සහ ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම | 11 |
| iii | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 29 |
| iv | සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | 35 |
| v | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 39 |
| vi | ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය | 51 |
| vii | හිඟුරාන සීනි කර්මාන්තායතනයේ මෙහෙයුම් කටයුතු සඳහා පිහිටුවන ලද සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව | 59 |
| viii | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 67 |
| 5. | ඇමුණුම් | 75–88 |
| 6. | වාර්තාවේ ඇතුළත් ආයතනයන්හි බදු පෙර ලාභය/ (අලාභය) හෝ අතිරික්තය/ (ඌණතාවය) | 89 |

## සභාපතිතුමාගේ සටහන

නවවැනි පාර්ලිමේන්තුවේ දෙවන සභා වාරය තුළදී විමර්ශනයට ලක්කරනු ලැබූ ආයතන සම්බන්ධ තොරතුරු ඇතුළත් මෙම වාර්තාව එම සභා වාරය, වාරාවසාන කිරීමෙන් සභාගත කිරීමට නොහැකි වූ නිසා නවවන පාර්ලිමේන්තුවේ සිව්වැනි සභා වාරයේ පළමුවැනි වාර්තාව ලෙස මවිසින් අද දින සභාගත කරනු ලැබේ.

ඒ අනුව 2021.11.11 වන දින සිට 2021.12.08 වන දින දක්වා කාල සීමාව තුළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් අධීක්ෂණයට ලක් කරන ලද ආයතන 07ක් සහ විගණකාධිපතිගේ විශේෂ විගණන වාර්තාවක් විමර්ශනය කිරීමට අදාළ තොරතුරු මෙම වාර්තාවේ අඩංගු වේ.

විමර්ශනයේදී හඳුනාගත් ගැටලු , ඒ මත කාරක සභාව විසින් ලබා දුන් නිර්දේශ, ඒවායේ වර්තමාන තත්ත්වය සහ එම ආයතන විසින් කාරක සභාවේ නිර්දේශවලට අනුව ක්‍රියාත්මකවීමේ ප්‍රගතිය ද මෙම වාර්තාවේ අඩංගු වේ. තවද මෙම වාර්තාව පරිශීලනය කිරීමේදි වැදගත් විය හැකි, අදාළ ආයතනවල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති මතය සහ අදාළ ඇමුණුම් ලේඛනයක්ද මෙහි දක්වා ඇත.

එසේම, මෙම වාර්තාව මගින් ඉදිරිපත් කර ඇති නිර්දේශ, අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්, ගණන්දීමේ නිලධාරීන් සහ අනෙකුත් වගකිව යුතු නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

අදාළ කාල සීමාවේදී මෙම විමර්ශන කටයුතු සඳහා දායක වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් වෙත මාගේ විශේෂ ස්තුතිය පිරිනමන අතර, මෙම ආයතනවල ගිණුම් විගණනයට ලක් කරමින් විගණකාධිපති ඇතුලු ජාතික විගණන කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් පොදු ව්‍යාපාර කාරක සභා කාර්යාලයට ලබා දෙන සහයෝගය ද ගෞරවයෙන් සිහිපත් කරමි.

එසේම, මෙම වාර්තාව සකස් කිරීමේදී දායක වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයටත්, පරිවර්තන කටයුතු සිදු කරන ලද පාර්ලිමේන්තුවේ පරිවර්තන අංශයටත් මාගේ ස්තුතිය පළ කරන අතර, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ කළමනාකරණ දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන් විසින් කාරක සභාවේ කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා නොමඳව දෙන සහයෝගය ද අගය කරමි.

**මහාචාර්ය රංජිත් බණ්ඩාර, පා.ම.**
**සභාපති**
**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව**

## නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය
## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එහි නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරයේ පළමුවැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව අනුව විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලබන ආණ්ඩුවේ සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඒවායේ ගිණුම් ද, පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් පරීක්ෂාවට භාජනය කරනු ලබයි.

ඒ අනුව, 2021.11.11 වන දින සිට 2021.12.08 වන දින දක්වා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමර්ශනයට ලක් වූ ආයතනවලට සහ විශේෂ විගණනවලට අදාළ නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

**2021.11.11 දින සිට 2021.12.08 දක්වා පොදු ව්‍යාපාර කාරක සභාව මඟින් විමර්ශනය කරන ලද ආයතන හා විමර්ශනයට ලක් කරන ලද කාල සීමාව**

| | ආයතනය | විමර්ශනය කරන ලද දිනය | විමර්ශනයට ලක් කරන ලද කරුණ |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 2021.11.11 | නව අපනයන සැකසුම් කලාප පිහිටුවීමේ ක්‍රියාවලියේ කාර්යසාධන ඇගැයීම |
| 2 | ජාතික තරුණ සේවා සභාව සහ ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම | 2021.11.16 | 2016 සිට 2020 දක්වා වූ මූල්‍ය වර්ෂයන් සඳහා විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය |
| 3 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2021.11.07 | 2017, 2018 හා 2019 මූල්‍ය වර්ෂයන් සඳහා වූ විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය |
| 4 | සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | 2021.11.24 | 2018 හා 2019 මූල්‍ය වර්ෂයන් සඳහා වූ විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය |
| 5 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 2021.11.26 | 2018 හා 2019 මූල්‍ය වර්ෂ සඳහා විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය |

| | | | |
|---|---|---|---|
| 6 | ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය | 2021.12.02 | 2015 සිට 2019 දක්වා මූල්‍ය වර්ෂ සඳහා විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය |
| 7 | i. වැවිලි අමාත්‍යාංශය<br>ii. උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුලු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය<br>iii. සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | 2021.12.06 | හිඟුරාන සීනි කර්මාන්තායතනයේ මෙහෙයුම් කටයුතු සඳහා පිහිටුවන ලද සී/ස ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව |
| 8 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 2021.12.08 | 2019 මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව සහ වර්තමාන කාර්යසාධනය |

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය

එක් එක් ආයතනය විසින් 2018, 2019 සහ 2020 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිගේ මතය පහතින් දක්වා ඇත.

1. **තත්ත්වාගණනය නොකළ මතය (Unqualified Opinion)**
   විගණකාධිපතිට ආයතනයේ ගිණුම් තුළ සැලකිය යුතු උල්ලංඝනය කිරීම් හෝ අවප්‍රකාශයන් හඳුනාගැනීමට නොහැකි බව.

2. **තත්ත්වාගණනය කළ මතය (Qualified Opinion)**
   ආයතනය ඉදිරිපත් කර ඇති මූල්‍ය තොරතුරු ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වාර්තා නොවීම හෝ ඒවා තහවුරු කිරීමට ලේඛනගත සාක්ෂි හඳුනාගැනීමට නොහැකි බව.

3. **මතය ව්‍යාවනය කිරීම (Disclaimer of Opinion)**
   ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

4. **අහිතකර මතය (Adverse Opinion)**
   සාවද්‍ය හෝ විශ්වාස කළ නොහැකි තොරතුරු නිසා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළ සැලකිය යුතු ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් හමු වූ බව.

| | ආයතනය | විගණන මතය | | |
|---|---|---|---|---|
| | | 2018 | 2019 | 2020 |
| 01 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| 02 | ජාතික තරුණ සේවා සභාව | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| 03 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | මතය ව්‍යාවනය | මතය ව්‍යාවනය | මතය ව්‍යාවනය |
| 04 | සීමාසහිත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | ලැබීමට නියමිතය |
| 05 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | මතය ව්‍යාවනය |

| | | | | |
|---|---|---|---|---|
| 06 | ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ | තත්ත්වාගණනය නොකළ |
| 07 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**
**(ජනාධිපති කාර්යාලය )**

**විමර්ශනය කරන ලද දිනය: 2021.11.11**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

**01. වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම**

2020 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබීම.

**නිර්දේශ**

2020 වාර්ෂික වාර්තාව නොපමාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

සභාපති - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

වර්ෂ 2020 සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇති අතර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද වහාම එම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක MAEZD/EZD/1/EZ-COPE7 හා 2021.12.13 දිනැති ලිපිය මඟින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට දැනුම් දී ඇත.

**02. ආයතනික සැලැස්ම**

ආයතනික සැලැස්ම සකස් කිරීමේදී රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ අවධානය යොමුකරමින් ඊට සමගාමීව සකස් කළ යුතු වුවත්, ආයතනය විසින් 2021 වසර සඳහා සකස් කර ඇති ආයතනික සැලැස්ම එසේ සකස් කර නොමැති වීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වීම.

ඉදිරි වසර 05 සඳහා සකස් කිරීමට බලාපොරොත්තු වන ආයතනික සැලැස්ම ඉහත නිර්ණායක සැළකිල්ලට ගනිමින් සකස් කිරීමට කටයුතු කරන බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති විසින් සඳහන් කරන ලදී.

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් ආයෝජන වාතාවරණයේ අවිනිශ්චිතතාවය සහ අස්ථාවරභාවය සැලකිල්ලට ගනිමින් 2021 වර්ෂය සඳහා අන්තර්කාලීන ආයතනික සැලැස්ම සකස් කර ඇති අතර වර්ෂ 2022 -2026 කාලය දක්වා ආයතනික සැලැස්ම පිළියෙළ කිරීමේ කටයුතු අවසන් වෙමින් පවතින බව ද ඉහත ලිපියෙන් කාරක සභාව වෙත දන්වා ඇත.

**03. මිල්ලනිය අපනයන සැකසුම් කලාපය**

මෙහිදී පහත සඳහන් කරුණු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු කරන ලදී.

### 03.1 මිල්ලනිය ඉඩමේ අයිතිය

අපනයන සැකසුම් කලාපය ස්ථාපිත කිරීම සඳහා තෝරාගත් ඉහත සඳහන් මිල්ලනිය ඉඩම, මේ වන විට හොරණ වැවිලි සමාගම සතු ඉඩමක් වීම සහ ප්‍රශ්නගත ඉඩම අත්පත් කර ගැනීමේදී ඇතිවූ විරෝධතා හේතුවෙන් අපනයන සැකසුම් කලාපයේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අගමැති කාර්යාලය විසින් සිදු කරන ලද ඇගයීම් වාර්තා පදනම් කර ගනිමින් මෙම මිල්ලනිය ඉඩම, ආයෝජන කලාපයක් ස්ථාපනය කිරීම සඳහා තෝරා ගත් බවත්, එය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් හොරණ වැවිලි සමාගමට බදු පදනම මත පවරා දී ඇති බවත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති විසින් මෙහිදී අදහස් දක්වන ලදී.

### 03.2 ගිවිසුම්වලට එළඹීමකින් තොරව බාහිර ආයතන වෙත කරන ලද ගෙවීම්

පහත සඳහන් කරුණු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

i. 2017 වර්ෂයේදී මිල්ලනිය අපනයන සැකසුම් කලාපය සහ ඒ සඳහා යටිතල පහසුකම් සැපයීම සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව බාහිර ආයතන වෙත ගෙවීම් සිදුකර තිබීම.

ii. සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් 2017, 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා පිළිවෙළින් රුපියල් මිලියන 336.77, 948.76, 895.00 සහ 120.00 ක මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ලබා දී තිබීම.

iii. මාර්ග සංවර්ධන අධිකාරියට රුපියල් මිලියන 52.7ක් ගෙවීම.

කාරක සභාව විසින් මෙම ගැටළුව දීර්ඝව සාකච්ඡා කළ අතර මෙම සැකසුම් කලාපය ස්ථාපනය කිරීම සඳහා යැයි පවසමින් විශාල මුදල් ප්‍රමාණයක් අනිසි ලෙස වියදම් කර තිබීම සහ නිසි පවරා ගැනීමකින් තොර භූමියක් වෙනුවෙන් මෙවැනි පිරිවැයක් දැරීම පිළිබඳව සිය අප්‍රසාදය පළ කරන ලදී.

මෙහිදී මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කලේ, මිල්ලනිය අපනයන සැකසුම් කලාපයේ ප්‍රවේශ මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මෙම මුදල මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවා ඇති අතර, උක්ත ප්‍රශ්නගත ඉඩම අත්පත් කර ගැනීමේ ගැටළුව නිසා මෙම ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය නිසි ආකාරයෙන් සිදු කිරීමට නොහැකි වී ඇති බවයි.

මෙම මිල්ලනිය අපනයන සැකසුම් කලාපය සඳහා වෙන් කරන ලද මුදලින් සැළකිය යුතු ප්‍රමාණයක් වගවත්ත සහ බිංගිරිය අපනයන සැකසුම් කලාප සඳහා යොදවා ඇති බවත් නිසි පවරා ගැනීමකින් පසුව මිල්ලනිය අපනයන සැකසුම් කලාපයේ වැඩ කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වන බවත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති විසින් මේ සම්බන්ධව සඳහන් කරමින් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අදහස වූයේ;

- අභියාචනාධිකරණයේ තීන්දුව ලැබෙන තෙක් මෙම අපනයන සැකසුම් කලාපයේ වැඩ කටයුතු ආරම්භ කළ නොහැකි බවත්,
- හැකි ඉක්මණින් අභියාචනාධිකරණ නඩු කටයුත්ත අවසන් කර ගැනීමට බලාපොරොත්තු වන බවත්,
- මේ වන විට හොරණ වැවිලි සමාගම විසින් කොන්දේසිවලට යටත්ව මෙම ගැටළුව නිම කිරීමට කැමැත්ත පළ කර ඇති බව සහ එම කොන්දේසි ලිඛිතව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ඉදිරියේදී ලබා දීමට නියමිත බවත් ය.

මිල්ලනිය අපනයන සැකසුම් කලාපය සම්බන්ධයෙන් වන සියලු තීන්දු තීරණ ලිඛිතව සඳහන් කර තිබීමේ වැදගත්කම පෙන්වා දුන් කාරක සභාව අවධාරණය කර සිටියේ මෙම අපනයන සැකසුම් කලාපය ස්ථාපනය කිරීමේ කටයුතු නැවත ආරම්භ කිරීම ඉතාමත් සැලකිල්ලෙන් ගත යුතු තීරණයක් වන බවත් ඒ පිළිබඳ වගකීම ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් භාරගත යුතු බවත්ය.

<u>නිර්දේශ</u>

මිල්ලනිය අපනයන සැකසුම් කලාප ව්‍යාපෘතිය  සම්බන්ධයෙන් (ව්‍යාපෘතියට කැබිනට් අනුමැතිය ලැබුණු දින සිට මේ දක්වා) සිදු කරන ලද සියලුම ගනුදෙනු පිළිබඳ පහත දැක්වෙන කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් සකස් කරන ලද සම්පූර්ණ වාර්තාවක් මාස 03ක් ඇතුළත කාරක සභාවට එවීම.

- ➢ මෙම ගනුදෙනු සිදුවී ඇති ආකාරය
- ➢ මෙම මුදල් ගෙවීම් සත්‍ය වශයෙන්ම සිදු කර තිබේද?

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

එච්. එම්. බී. පී. හේරත් මයා - ජනාධිපති අතිරේක ලේකම්
ලේකම් - සංචාරක අමාත්‍යාංශය
ලේකම් - ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
සභාපති - මාර්ග සංවර්ධන අධිකාරිය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

නිර්දේශිත වාර්තාව ඉදිරිපත් කර නොමැති අතර ඒ පිළිබඳ පහත සඳහන් කරුණු වාර්තා කර ඇත.

i. මිල්ලනිය, බිංගිරිය සහ වගවත්ත කලාප සංවර්ධනය කිරීම සඳහා 2017, 2018, 2019 සහ 2020 වර්ෂවල, එවකට සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් මාර්ග සංවර්ධන අධිකාරියට, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සහ විදුලිබල මණ්ඩලයට සෘජුවම මුදල් ලබා දී ඇති බව.
ii. එවැනි සංවර්ධන කටයුතු සඳහා භාණ්ඩාගාරය විසින් ආයෝජන මණ්ඩලය වෙත මුදල් වෙන් කර/ ප්‍රදානය කර නොමැති බව.
iii. එවැනි සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් කිසිඳු මුදලක් වැය කර නොමැති බව.

iv. එම සියලු ගිණුම් කටයුතු සිදු කරන ලද්දේ සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් බව.

v. මිල්ලනිය කලාපයේ සංවර්ධන කටයුතු සඳහා ලබාදුන් මුදල්වල ඉතිරි මුදල් බිංගිරිය සහ වගවත්ත කලාපවල බාහිර යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යොදවන ලෙස අමාත්‍යාංශය විසින් ඉහත රාජ්‍ය ආයතනවලට උපදෙස් ලබා දී තිබූ බව.

## 04. <u>බිංගිරිය අපනයන සැලසුම් කලාපය</u>

බිංගිරිය අපනයන සැකසුම් කලාපය සම්බන්ධයෙන් පහත කරුණු පිළිබඳව කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය.

### i) <u>බිංගිරිය අපනයන සැකසුම් කලාපය සඳහා දරන ලද වියදම්</u>

බිංගිරිය අපනයන සැකසුම් කලාපය සඳහා 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා පිළිවෙළින් රු. මිලියන 154.54, 792.85, 895 සහ 105ක මුදල් ප්‍රමාණයක් වියදම් කර තිබීම පිළිබඳව සහ එහි වර්තමාන තත්ත්වය පිළිබඳව කාරක සභාව විමසා සිටියාය.

මේ වන විට බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතින බවත්, එක් කර්මාන්ත ශාලාවක ඉදිකිරීම් කටයුතු අවසන් බව සහ තවත් කර්මාන්තශාලා කිහිපයක් ඉදි වෙමින් පවතින බවත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති විසින් මෙහිදී පැවසීය.

### ii) <u>බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ වර්තමාන තත්ත්වය</u>

කාරක සභාව විසින් බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ සංවර්ධන කටයුතුවල වර්තමාන තත්ත්වය පිළිබඳ විමසා සිටි අතර එහිදී පහත කරුණු අනාවරණය විය.

- ව්‍යාපෘතියේ පළමු අදියරේ වැඩ කටයුතු මේ වන විට අවසන්ව ඇති බව.
- කලාපයේ පිවිසුම් මාර්ගයේ වැඩ කටයුතු තවමත් අවසන්ව නොමැති බව.
- අපනයන සැකසුම් කලාපය සම්බන්ධයෙන් යටිතල පහසුකම් සඳහා සේවා සපයන ආයතන සමඟ කටයුතු කර ඇත්තේ ගිවිසුම්ගත වීමකින් තොරව බව.
- මේ වන විට එම ආයතන සමඟ අවබෝධතා ගිවිසුම්වලට (Memorandum of Understanding) එළඹීමෙන් එම කටයුතු නිත්‍යානුකූල තත්ත්වයට පත් කරගෙන ඇති බව.

## 05. <u>අපනයන සැකසුම් කලාපවලින් ඇති වන පාරිසරික බලපෑම</u>

මේ පිළිබඳව කාරක සභාව විමසා සිටි අතර එහිදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති විසින් පහත කරුණු සඳහන් කරන ලදී.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු කර්මාන්තපුර 14න් 7ක් සඳහා මධ්‍යම පාරිසරික අධිකාරිය වෙතින් පාරිසරික බලපත්‍ර ලබා ඇති බව.
- කර්මාන්තපුර 03ක් සඳහා පාරිසරික බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති බව.
- ප්‍රධාන කර්මාන්තපුර 2ක් වන සීතාවක සහ හොරණ කර්මාන්තපුරයන්හි පාරිසරික ගැටළු කිහිපයක් හඳුනාගෙන ඇති අතර මේ වන විට ඒවාට විසඳුම් ලබා ගනිමින් පවතින බව.

තවද, ''කැලණි ගඟේ ජල දූෂණය සම්බන්ධ පරිසර විගණන වාර්තාව'' පිළිබඳව පෙර පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා සාකච්ඡාවකදී අනාවරණය වූ, සීතාවක කර්මාන්තපුරයේ පොදු අප ජල පිරිපහදු මධ්‍යස්ථානය සම්බන්ධයෙන් පවතින ගැටලුව සමනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අවධානය යොමු නොකරන බවට කාරක සභාවේ අදහස වූ අතර, මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු සැලැස්වීමේ වැදගත්කම කාරක සභාව විසින් අවධාරණය කරන ලදී.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

ලේකම් - ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

අපනයන සැකසුම් කලාපවල පාරිසරික අනුකූලතාවයේ වත්මන් තත්ත්වය/ පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

නිර්දේශිත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 01)**

## 06. <u>බඳවා ගැනීම්</u>

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නව තනතුරු 29ක් නිර්මාණය කරමින් ඒවාට ඉතා ඉහළ මට්ටමේ වැටුප් ප්‍රදානය කර තිබීම පිළිබඳ කාරක සභාවේ ප්‍රශ්නගත වූ අතර, එම තනතුරු 29න් පුද්ගලයන් 07 දෙනෙකු මේ වන විට ආයතනයට බඳවා ගෙන ඇති බවත් තවත් 22ක් බඳවා ගැනීමට නියමිත බවත් කාරක සභාවට වැඩිදුරටත් අනාවරණය විය.

මෙම පත්කිරීම් පිළිබඳ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු අදහස් දක්වමින් සඳහන් කළේ මෙම පත්වීම්වලට අදාල වැටුප් පරිමාණ අනුමත කළ නොහැකි ඒවා බව යි.

තවද ඉහළ වැටුප් තලයන්හි පිහිටුවමින් නව තනතුරු ඇති කිරීම, ආයතනය තුළ දැනට සේවය කරන සේවකයන් තුළ පසුබෑමක් ඇති කිරීමට හේතුවක් වන බවත් මෙම තත්ත්වය ආයතනයේ ඉදිරි පැවැත්මට තර්ජනයක් විය හැකි බවත් කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.

මේ පිළිබඳව කාරක සභාව විසින් දීර්ඝව සාකච්ඡා කළ අතර කාරක සභාවේ අදහස වූයේ ඉහත සඳහන් කැබිනට් පත්‍රිකාව සකස් කිරීමේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ප්‍රයෝගකාරී ලෙස අදාළ වැටුප් පරිමාණ සහ අවශ්‍ය සුදුසුකම් ඇමුණුමක අවසාන පේළියේ ඒ පිළිබඳ අවධානය යොමු නොවන අයුරින් ඇතුළත් කොට ඇති බවයි.

මෙම කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සභාපති විසින් පවසන ලද්දේ, විශේෂඥ දැනුම ලබා ගැනීම සහ එම දැනුම හරහා ආයතනයේ අභිවෘද්ධිය සළසා ගැනීමට තමාට ලැබුණු මහපෙන්වීමක් මත මෙම බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළ බවත්, කාරක සභාව විසින් ලබා දුන් මඟ පෙන්වීම් ගැන අවධානය යොමු කරමින් අදාළ පාර්ශ්වයන් සමඟ ද සාකච්ඡා කිරීම තුළින් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට බලාපොරොත්තු වන බවත් ය.

මේ පිළිබඳ තවදුරටත් අදහස් දැක්වූ කාරක සභාව දක්වා සිටියේ, විදේශ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට තනිව කිරීමට අසීරු බවත් ඒ සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ වාණිජ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ වී කටයුතු කිරීම මඟින් එම තත්ත්වය මඟ හරවා ගත හැකි බවත් ය.

<u>නිර්දේශ</u>

i. කැබිනට් සංදේශය අනුමත වී ඇති ආකාරය සහ එය ක්‍රියාත්මක වී ඇති ආකාරය පිළිබඳව අවධානය යොමු කරමින් ආයතනයේ අභ්‍යන්තර සේවකයන්ගේ ආතතිය අවම කරමින් අදාළ කැබිනට් තීරණය ක්‍රියාත්මක කළ හැකි ආකාරයේ වාර්තාවක්/ සැලැස්මක් සකස් කිරීම සහ ඒ පිළිබඳ මාසයක් ඇතුළත කාරක සභාව දැනුවත් කිරීම.

ii. මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් ආයතනය තුළ ඇති සියලු ලිපි ලේඛන උක්ත සැලැස්ම සකස් කිරීම සඳහා ලබා දීම.

iii. මෙම බඳවා ගැනීම් ගැන තම අදහස්/ විසඳුම් (Comments & Solutions) මෙම සැලැස්මෙහි ඇතුළත් කිරීම.

iv. ඉහත අංක (i) හි සඳහන් වාර්තාව /සැලැස්ම කාරක සභාව වෙත ඉදිරිපත් කරන තුරු ප්‍රශ්නගත තනතුරු 22 සඳහා බඳවා ගැනීම කල්දැමීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

එච්. එම්. බී. පී. හේරත් මයා - ජනාධිපති අතිරේක ලේකම්

ලේකම් - ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ප්‍රගතිය වාර්තා කර නොමැත.

## 07. <u>24 සහ 27 මහල් නවීකරණය</u>

ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ (WTC) පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු 24 සහ 27වන මහල් නවීකරණය කිරීමට පියවර ගැනීම පිළිබඳව කාරක සභාව විමසා සිටියාය.

ආයතනයට පැමිණෙන ආයෝජකයන් පිළිගැනීම සඳහා සහ විවිධ සාකච්ඡා පැවැත්වීම සඳහා මෙම මහල් භාවිතා කරන බවත්, මේ වන විට අබලන් තත්ත්වයේ පැවතීම නිසා එම මහල් නවීකරණය කිරීමට කටයුතු කරන බවත්, ආයතනය අභ්‍යන්තරයෙන් මතු වූ විරෝධතා නිසා මෙම නවීකරණ කටයුතු කිහිප අවස්ථාවකදීම ඇණ හිටි බවත්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති විසින් පවසන ලදී.

<u>**නිර්දේශ**</u>

ආයතනයේ අභ්‍යන්තර සේවකයන් සමඟ එකඟතාවයකට පැමිණීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

සභාපති - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

නව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව අදාළ තීරණ ක්‍රියාත්මක කිරීමට ප්‍රසම්පාදන කමිටුව නියෝග කර ඇති අතර ඒ දක්වා ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි 24වන සහ 27වන මහල ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ වන විට අත්හිටුවා ඇති බවත් කාරක සභාව වෙත දන්වා ඇත.

**08.** <u>**අනුමැතියෙන් තොර දීමනා**</u>

**i)** 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් පරිදි අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2015 – 2020 කාල සීමාව තුළ පහත ගෙවීම් සිදු කර තිබිණි.

- ප්‍රවාහන දීමනා - රු. 170, 028, 126/-
- කාර්යසාධන ගෙවීම් - රු. 2, 265, 728, 340/-
- ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු මුදල් කර ගැනීමේ දීමනා - රු. 413, 927, 180/-

මෙම සියලු ගෙවීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ සිදු කර ඇති බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති විසින් කරන ලද ප්‍රකාශයට පිළිතුරු දෙමින් කාරක සභාව පවසා සිටියේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උල්ලංඝණය කරමින් තීරණ ගැනීමට කිසිදු අධ්‍යක්ෂ මණ්ඩලයකට හැකියාවක් නොමැති බවයි.

<u>**නිර්දේශ**</u>

මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මෙම තත්ත්වය නිවැරදි කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

සභාපති - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

ප්‍රගතිය වාර්තා කර ඇත.

**ii)** නිල වාහනයක් හිමි නිලධාරියෙකු ප්‍රවාහන දීමනාවක් සහ මාසික ඉන්ධන දීමනාවක් ලබා ගන්නේ නම් ඔහු හෝ ඇය, රියදුරෙකු සහ රියදුරු දීමනාවකට හිමිකම් නොකියන බව රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ (2016.10.27 දිනැති අංක පීඊඩී/1/2015(1)) මඟින් දක්වා ඇතත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 2020 වර්ෂය තුළ නිලධාරීන් 28දෙනෙකුට රියදුරු දීමනාව ලෙස රු. 8, 950, 064/-ක් ගෙවා තිබීම පිළිබඳව කාරක සභාවේ විශේෂ අවධානය යොමු වූ අතර නිසි අනුමැතියකින් තොරව රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අභිබවා යමින් කරනු ලබන මෙවැනි දීමනා පිළිබඳ කාරක සභාව සිය බලවත් අප්‍රසාදය පළ කළාය.

**iii)** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ උපදේශකවරියක වශයෙන් සේවය කිරීමට ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරිය, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බඳවාගෙන ඇති බවත් ඇය වෙනුවෙන් වර්ෂ 2020 මැයි මස සිට 2021 අප්‍රේල් මස දක්වා නිල වාහනයක් සමඟ වැටුප්, ඉන්ධන දීමනා සහ රියදුරු දීමනා ලෙස රු. 13,771,103/-ක් ගෙවා තිබීමත් පිළිබඳ කාරක සභාව විමසා සිටියාය.

මෙවැනි පත් කිරීමක් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වුවත් එවන් අනුමැතියක් මෙම පත් කිරීම සඳහා ලබා ගෙන නොමැති බව කාරක සභාවට අනාවරණය විය.

**<u>නිර්දේශ</u>**

ප්‍රශ්නගත බඳවා ගැනීම පිළිබඳ අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා නිර්ණේය කරුණු (Terms of Reference) සහිතව සම්පූර්ණ වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත එවීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

එච්. එම්. බී. පී. හේරත් මයා - ජනාධිපති අතිරේක ලේකම්

ලේකම් - ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**09.** **<u>මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ මාර්ගයේ ඉදිකිරීම</u>**

කිලෝ මීටර් 10.8ක් දිග මීටර් 33ක් පළල මෙම මාර්ගය ඉදිකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට රු. 516,964,785/-ක මුදලක් ගෙවා තිබුණත් මේ වන විට මෙම මාර්ගය භාවිතා කළ නොහැකි තත්ත්වයේ පැවතීම පිළිබඳ කාරක සභාව විමසා සිටියාය.

**<u>නිර්දේශ</u>**

මෙම තත්ත්වය පිළිබඳ සොයා බලා මාර්ගය භාවිතා කිරීමට හැකි ආකාරයට පත් කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

සභාපති - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

සභාපති - මාර්ග සංවර්ධන අධිකාරිය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇත. **(ඇමුණුම 02)**

**<u>ජාතික තරුණ සේවා සභාව සහ ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම</u>**

*(තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය)*

**විමර්ශනය කළ දිනය - 2021.11.16**

**<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>**

**01. <u>ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය</u>**

ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනට සාමාජිකයින් 24 දෙනෙකුගෙන් සමන්විත බව කමිටුව නිරීක්ෂණය කළේය.

මෙහිදී අමාත්‍යාංශ ලේකම් විසින් සඳහන් කරන ලද්දේ 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතට අනුව එවකට තරුණ හා රැකියා අමාත්‍යවරයා විසින් 1986.03.10 දිනැතිව පනවා ඇති රෙගුලාසියට අනුව නිල බලයෙන් සාමාජිකයින් තිදෙනෙකු (03) සහ අනෙකුත් සාමාජිකයින් විසි (20)දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ හැකි බවත්, ඒ අනුව දැනට අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් 24දෙනෙකු සිටින බවත් ය.

**02. <u>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර ගණන</u>**

ජාතික තරුණ සේවා සභාව සහ ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම යන ආයතන දෙකෙහිම අදාළ මූල්‍ය වර්ෂ සඳහා සීමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාවක් පවත්වා ඇති බව කමිටුවේ අවධානයට ලක් විය.

**<u>නිර්දේශ</u>**

උක්ත ආයතන දෙකෙහිම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවම වශයෙන් මසකට වරක්වත් පැවැත්විය යුතු බවට කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
සභාපති - ජාතික තරුණ සේවා සභාව
සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

මෙම කරුණ සම්බන්ධ ප්‍රගතිය වාර්තා කරමින් අංක MOYS/ACC/A1/6/COPE-NYSC හා 2022.10.27 දිනැති ක්‍රීඩා හා යෞවන කටයුතු ලේකම්ගේ ලිපියෙන් සඳහන් කර ඇත්තේ 2022 වර්ෂයට අදාළව සෑම මසකට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම සඳහා පියවර ගෙන ඇති බවත් 2022 වර්ෂය සඳහා මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07ක් පවත්වා ඇති බවත්ය.

**03. <u>සංයුක්ත සැලැස්ම</u>**

ජාතික තරුණ සේවා සභාව 2017-2020 වසර සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද, ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු

වක්‍රලේඛවලට අනුකූලව සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කර නොමැති බව කමිටුව නිරීක්ෂණය කළේය.

ජාතික තරුණ සේවා සභාවේ 2022-2026 වසර සඳහා වූ සංයුක්ත සැලැස්ම ද මේ වන විට කෙටුම්පත් කර ඇති බව හා තරුණ සේවා සමාගමේ පෙර කළමනාකාරීත්වයේ දුර්වලතා හේතුවෙන් ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ සංයුක්ත සැලැස්ම සකස් කිරීමට නොහැකි වූ බව මෙහිදී ජාතික තරුණ සේවා සභාවේ සභාපති විසින් සඳහන් කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. ජාතික තරුණ සේවා සභාවේ 2022-2026 කාල පරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්ම 2022 ජනවාරි මාසය වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

ii. ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ සංයුක්ත සැලැස්ම නොපමාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

i. ඉහත නිර්දේශ අංක (i)ට අදාළව ප්‍රගතිය වාර්තා කර ඇත.

ii. ඉහත නිර්දේශ අංක (ii)ට අදාළව ප්‍රගතිය වාර්තා කර නොමැත.

**04. <u>වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම</u>**

ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් පවතින අතර ශ්‍රී ලංකා තරුණ සේවා පෞද්ගලික සමාගම 2015 වසරේ සිට වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොමැති බවත් මෙහිදී අවධානයට ලක් විය.

**<u>නිර්දේශ</u>**

ජාතික තරුණ සේවා සභාවේ සහ ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමෙහි වාර්ෂික වාර්තා මාසයක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇත.

**05. <u>විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම සහ රැස්වීම් පැවැත්වීම</u>**

ජාතික තරුණ සේවා සභාව 2020 වසර සඳහා පවත්වා ඇත්තේ රැස්වීම් දෙකක් පමණක් බවත්, සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම වර්ෂ 2015 සිට 2021.10.31

දක්වා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබූ බවත් කමිටුව නිරීක්ෂණය කළේය.

**<u>නිර්දේශ</u>**

ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක්වත් පැවැත්වීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ක්‍රීඩා හා යෞවන කටයුතු ලේකම්ගේ අංක MOYS/ACC/A1/6/COPE-NYSC හා 2022.10.27 දිනැති ලිපියෙන් මෙහි ප්‍රගතිය වාර්තා කර ඇති අතර 2022 වර්ෂයට අදාළව කමිටු වාර 03ක් පවත්වා ඇති බවත් එමඟින් සඳහන් කර ඇත.

**06.** **<u>සේවක සංඛ්‍යා තොරතුරු</u>**

ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ (පාලන), අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂ (සංවර්ධන), අධ්‍යක්ෂ (තාක්ෂණික හා වෘත්තීය පුහුණු) සහ අභ්‍යන්තර විගණක යන තනතුරු පුරප්පාඩු වී ඇති අතර ඒවා ස්ථිර පදනමින් පුරවා නොමැති බව කාරක සභාව විසින් නිරීක්ෂණය කළ අතර පහත කරුණු වැඩිදුරටත් අනාවරණය විය.

i. වැඩබලන අධ්‍යක්ෂ (පාලන), අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ ද වැඩබැලීමට කටයුතු කරන බව.
ii. ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ මාණ්ඩලික ශ්‍රේණියේ පුරප්පාඩු 06ක් සහ මාණ්ඩලික නොවන ශ්‍රේණියේ පුරප්පාඩු 13ක් පවතින බව.

**<u>නිර්දේශ</u>**

i. නිසි ක්‍රමවේදයට අනුව පුරප්පාඩු පිරවීමට කඩිනම් ක්‍රියාමාර්ගයක් ගැනීම.
ii. එසේ පත් කරන ලද නිලධාරීන්ගේ ලැයිස්තුව මාස තුනක් ඇතුළත ලිඛිතව කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ජාතික තරුණ සේවා සභාවේ කාර්ය මණ්ඩලයේ පවතින ගැටලු/ අක්‍රමිකතා සම්බන්ධව සොයා බැලීම පිණිස තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරන ලද පංච පුද්ගල කමිටු වාර්තාව තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOYS/ADM/4/4/8 හා 2022.03.28 දිනැති ලිපිය සමඟ කාරක සභාව වෙත ඉදිරිපත්

කර ඇති අතර ක්‍රීඩා හා යෞවන කටයුතු ලේකම්ගේ අංක MOYS/ACC/A1/6/COPE-NYSC හා 2022.10.27 දිනැති ලිපිය මගින් ප්‍රගතිය වාර්තා කර ඇත.

**<u>2013.12.03 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ගෙන ඇති නියෝග ක්‍රියාත්මක කිරීම</u>**

**07. <u>ඡේද අංක 07</u>**

ජාතික තරුණ සේවා සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ ගිණුම් විගණනය නොකිරීම.

ආයතන අතර සහයෝගීතාවක් නොමැතිකම හේතුවෙන් සමාගමේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් පසුගිය කාරක සභාවේදී ගත් තීරණ ක්‍රියාත්මක කිරීමට අපහසු වී ඇති බව කමිටුව නිරීක්ෂණය කළේය.

**<u>නිර්දේශ</u>**

2013 වසරේ සිට මේ දක්වා විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නැවත කාරක සභාවට වාර්තා කිරීමට කටයුතු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇත.

**08. <u>ඡේද අංක 08</u>**

උප සමාගම් වන සීමිත නැටුම් සමාගම සහ සීමාසහිත සංගීත සමාගම, 2007 නව සමාගම් පනත යටතේ ලියාපදිංචි කර නොතිබීම හේතුවෙන් අකර්මණ්‍ය වීම.

මෙහිදී නව සමාගම් පනත යටතේ ඉහත අනුබද්ධ සමාගම් දෙක (සීමිත නැටුම් සමාගම සහ සීමාසහිත සංගීත සමාගම) ලියාපදිංචි කර නොමැති බව කමිටුව නිරීක්ෂණය කළ අතර රු. 2,333,190/-ක මුදලක් කවුන්සිලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2014.07.10 දින මෙම සමාගම්වල ආයෝජනය සඳහා වියදම් කර තිබුණි.

**<u>නිර්දේශ</u>**

විධිමත් ක්‍රියා පටිපාටියට අනුව ඉහත සමාගම් දෙක ලියාපදිංචිය අවසන් කර මාස තුනක් ඇතුළත ප්‍රගතිය කාරක සභාවට වාර්තා කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර ඇත.

## 09. ඡේද අංක 12

රු. 6,873,642/-ක් වූ ණය ශේෂ 144ක් කපා හැරීමට/ ලියා අත්හැරීමට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොතිබීම.

**නිර්දේශ**

රු. මිලියන 144 ක ණය ශේෂයන් කපා හැරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගැනීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

නිර්දේශිත පරිදි කටයුතු කරමින් පවතින බවට කාරක සභාව වෙත වාර්තා කර ඇත.

## 10. ඡේද අංක 14

ජාතික තරුණ සේවා සභාවට අයත් නොවන ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තු කිරීම වෙනුවෙන් 2012.12.31 දිනට රු. මිලියන 261.3ක මුදලක් වියදම් කර ඇති බව හා එම දේපළවලට හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතු බව.

**නිර්දේශ**

ඉහත කරුණ පිළිබඳව විගණකාධිපතිවරයාට ලිඛිතව දැනුම් දී මෙම තත්ත්වය නිරවුල් කිරීම අවශ්‍ය කටයුතු කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර ඇත.

## 11. ඡේද අංක 17

හෙයියන්තුඩුව ගෘහස්ථ ක්‍රීඩාංගනය නවීකරණය කිරීම සඳහා රු. 2,432,464/-ක මුදලක් වියදම් කර තිබුණ ද, කොන්ත්‍රාත්කරු විසින් මේ දක්වා වැඩ අවසන් කර නොමැති බව කමිටුව නිරීක්ෂණය කිරීම.

**<u>නිර්දේශ</u>**

හෙයියන්තුඩුව ගෘහස්ථ ක්‍රීඩාංගනයේ වත්මන් තත්ත්වය පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

නිර්දේශිත වාර්තාව තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOYS/ACC/A1/6/COPE-NYSC හා 2022.02.07 දිනැති ලිපිය සමඟ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**12. <u>ඡේද අංක 18</u>**

තරුණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2000 වර්ෂයේ ජූලි මාසයේ දී රු. 3,330,000/-ක පිරිවැයට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගෙන තිබුණු බේරුවල ඉඩම සඳහා රු.3,398,200/-ක මුදලක් වියදම් කර තිබුණ ද, එහි සංවර්ධන කාර්යයන් මේ දක්වා සිදු වී නොමැති බව නිරීක්ෂණය කිරීම.

මෙහිදී ජාතික තරුණ සේවා සංගමයේ සභාපති විසින් සඳහන් කරන ලද්දේ, මෙම බේරුවල ඉඩම ජලයෙන් යට වූ ඉඩමක් ලෙස හඳුනාගෙන ඇති බවයි.

**<u>නිර්දේශ</u>**

මෙම කරුණ පිළිබඳව නව තාක්ෂණික කමිටුවකට යොමු කරන ලෙසත්, මෙම ව්‍යාපෘතිය වසා දැමීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් හරහා භාණ්ඩාගාරයට වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

මෙම ඉදිකිරීම්වලට අදාළව සැලැස්ම සහ ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර අවසන් කර ඇති අතර ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 181ක් වන බවත්, ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වූ බවත්, ප්‍රතිපාදන ලද විගස අදාළ කටයුතු ආරම්භ කළ හැකි බවත් ක්‍රීඩා හා යෞවන කටයුතු ලේකම්ගේ අංක MOYS/ACC/A1/6/COPE-NYSC හා 2022.10.27 දිනැති ලිපිය මඟින් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

**13. ඡේද අංක 23**

වර්ෂ 2011 ජනවාරි මාසයේ දී නාවලපිටිය ජයතිලක ක්‍රීඩාංගනය තුළ අත්පන්දු ක්‍රීඩා පිටියක් ඉදිකිරීමට රු. 1,287,440/-ක මුදලක් වියදම් කර තිබුණ ද, එම ව්‍යාපෘතිය මාස 07කට පසු ඉවත් කරගෙන තිබුණි. රු. 361,000/-ක් වටිනා නැවත භාවිතා කළ හැකි අමුද්‍රව්‍ය ඌන උපයෝජනය කර තිබූ අතර ඒ හේතුවෙන් රු. 926,440/-ක අනාර්ථික වියදමක් සිදු වූ බව කාරක සභාව නිරීක්ෂණය කිරීම.

නාවලපිටිය ජයතිලක ක්‍රීඩාංගණයේ වොලිබෝල් පිට්ටනියක් ඉදිකිරීම සඳහා යොදාගෙන තිබූ භාණ්ඩ නාවලපිටිය නගර සභාව වෙත භාරදී ඇති බව මෙහිදී කාරක සභාවට අනාවරණය විය.

**නිර්දේශ**

i. මේ සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කිරීම.
ii. මීට අමතරව, පසුගිය පොදු ව්‍යාපාර පිළිබඳ රැස්වීමේ ඇතුළත් සියලු කරුණු සඳහා පිළිතුරු ඉතා ඉක්මනින් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
සභාපති - ජාතික තරුණ සේවා සභාව
සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ඉහත නිර්දේශ අංක (i)ට අදාළව නිර්දේශිත වාර්තාව ඉදිරිපත් කර නොමැති අතර ප්‍රගතිය වාර්තා කර ඇත.

**2016-2020 වසර සඳහා විගණන වාර්තා වලින් පැන නැගුනු කරුණු**

**ජාතික තරුණ සේවා සභාව**

**14. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ලබාගෙන තිබූ ගෝනහේන ඉඩම**

1996.10.09 දින ජාතික තරුණ සේවා සභාව මඟින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩමක් ලබාගෙන ඇතත් එම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන වසර 25 කට වැඩි කාලයක් තිස්සේ එය අක්‍රියව පවතින බව කමිටුව නිරීක්ෂණය කළේය.

ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් නඩුවක් පවතින බැවින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි වූ බවත් මේ වන විට එම අධිකරණ තීන්දුව සභාවට වාසිදායක ලෙස ලැබී ඇති බවත් ආයතනයේ සභාපති විසින් මෙහිදී සඳහන් කරන ලදී.

**නිර්දේශ**

මෙම කරුණ සම්බන්ධයෙන් සහ මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධයෙන් කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

නිර්දේශිත වාර්තාව ඉදිරිපත් කර ඇත.

**15. <u>නිල්වලා යොවුන් උද්‍යානය</u>**

මාතර නිල්වලා යොවුන් උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් රු. මිලියන 100ක් පමණ වැය කර තිබුණද ඒ සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොමැති බව කමිටුව නිරීක්ෂණය කළ අතර මෙම ඉදිකිරීම් හා වන්දි ක්‍රියාවලිය සඳහා රු. මිලියන 150ක් වෙන් කර තිබූ අතර එම පරිශ්‍රය තවමත් අක්‍රියව පැවතීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

දැනට එම පරිශ්‍රය නිෂ්ක්‍රීයව නොපවතින බවත් ලබන වසරේ තවත් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට යෝජිත බවත් ආයතනයේ සභාපති විසින් ප්‍රකාශ කළේය.

**<u>නිර්දේශ</u>**

මෙම කරුණ සම්බන්ධ වත්මන් තත්ත්වය පිළිබඳ වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපතිට යොමු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

නිර්දේශිත වාර්තාව ඉදිරිපත් කර ඇත.

**16. <u>හැඩිගම ප්‍රදේශයේ නේවාසිකාගාරයක් සහ ක්‍රීඩා පිටියක් ඉදිකිරීම</u>**

හැඩිගම, මාදංගහවත්ත නම් ඉඩමේ නේවාසිකාගාරයක් සහ ක්‍රීඩා පිටියක් ඉදිකිරීමේ මූල්‍ය සැලැස්ම සඳහා රු. 2,400,601/-ක් ගෙවීම් කර තිබුණද එහි ඉදිකිරීම් ආරම්භ කර නොතිබීම පිළිබඳව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

නිස්කෝ තරුණ සමුපකාරය මේ වන විට යළි ස්ථාපිත කර ඇති අතර මෙම ස්ථානය නිස්කෝ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස භාවිත කිරීමට බලාපොරොත්තු වන බවත් ආයතනයේ සභාපති විසින් සඳහන් කරන ලදී.

**<u>නිර්දේශ</u>**

i. මෙම කරුණ සම්බන්ධ වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

ii. මෙවැනි ව්‍යාපෘති සකස් කිරීමේදී දීර්ඝ කාලීන ඉලක්ක සහ සැලසුම් මත ක්‍රියා කිරීමට කටයුතු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇත.

## 17. බෙල්වුඩ් සෞන්දර්ය නිවහන නවීකරණය සහ නව ඉදිකිරීම

රු. මිලියන 100 සිට රු. මිලියන 200දක්වා ප්‍රසම්පාදන සඳහා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය යටතේ එළැඹිය යුතු නමුත්, බෙල්වුඩ් සෞන්දර්ය නිවහනේ ඉදිකිරීම් සම්බන්ධ කොන්ත්‍රාත්තුවක් රු. මිලියන 99.66ක් සහ රු. මිලියන 97.79ක් ලෙස කොටස් දෙකකට බෙදා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සහිතව එකම කොන්ත්‍රාත්කරුවෙකුට අදාළ කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු කිරීම.

**<u>නිර්දේශ</u>**

මෙම කරුණ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමු කරන අතර වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සඳහා බාහිර පරීක්ෂණ නිලධාරියෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇති බවත් ක්‍රීඩා හා යෞවන කටයුතු ලේකම් විසින් කාරක සභාව වෙත දැනුම් දී ඇත.

## 18. "යොවුන්පුර" වැඩසටහන

වර්ෂ 2018 හා 2019 වර්ෂවල පැවැත් වූ යොවුන්පුර වැඩසටහන් සඳහා අනුමත ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 350ක් වුවද, එය ඉක්මවා රු.80,560,914/-ක් වැය කර තිබීමත්, රු. 2,227,400/-ක් වැඩිපුර ගෙවමින් ගබඩා ඩෝම්ස් දෙකක් කුලී පදනම මත ලබාගැනීමත්, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයෙන් තොරව වැඩසටහන් පවත්වන ලද දිනට පසුව ටී ෂර්ට් 1773ක් සඳහා රු. 1,932,500/-ක් ගෙවා තිබීම සම්බන්ධවත් කාරක සභාවේ අවධානය යොමු විය.

මේ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා 2020.12.30 වන දින අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළ බවත්, මේ වන විට එම කමිටුවේ

නිර්දේශ මත මෙම කාරණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත් අමාත්‍යාංශ ලේකම් විසින් පවසන ලදී.

**<u>නිර්දේශ</u>**

i. මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් ආරම්භ කිරීම.
ii. පොලිස් පරීක්ෂණය ඉදිරියට සිදු කරගෙන යාම.
iii. මෙම ගැටළුව විසඳන තුරු යොවුන්පුර වැඩසටහනට අදාළ ගෙවීම් සම්බන්ධයෙන් ඉල්ලීම් සිදු නොකිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

මෙම කරුණ සම්බන්ධව ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කර ඇත. **(ඇමුණුම 03).**

**19.** **<u>තරුණ තොරතුරු පත්‍රිකා</u>**

වර්ෂ 2017 දී පිරිවැය රු.1,822,400/-ක් වූ තරුණ තොරතුරු පත්‍රිකා 268,000ක් මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් මහජන මුදල් අවභාවිත කළ නිලධාරීන් හඳුනා ගැනීමට කටයුතු කර නොමැති බව කමිටුව නිරීක්ෂණය කළේය.

**<u>නිර්දේශ</u>**

i. මෙම කාරණය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමට කමිටුවක් පත් කර ඔවුන්ට එරෙහිව සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම.
ii. මාස තුනක් ඇතුළත අවසන් තීරණය පිළිබඳව කාරක සභාවට වාර්තා කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

i. නිර්දේශ අංක (i) පරිදි කටයුතු කරමින් පවතින බව කාරක සභාවට වාර්තා කර ඇත. **(ඇමුණුම 04)**
ii. නිර්දේශ අංක (ii)න් අපේක්ෂිත ප්‍රගතිය වාර්තා කර නොමැත.

**20.** **<u>බාහිර ආයතන හතරකින් ලැබුණු අරමුදල්</u>**

2015 වර්ෂයේ සිට බාහිර ආයතන 04ක් විසින් ප්‍රදානය කරන ලද රු. 4,959,409/-ක අරමුදල්, අදාළ කාර්යය සඳහා උපයෝජනය කර නොතිබීම සහ ඉන් රු. 1,005,000/-ක මුදලක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනනුකූලව රාජ්‍ය නොවන සංවිධානයකට ගෙවා තිබීම.

**<u>නිර්දේශ</u>**

i. එකල ගිණුම් භාර නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් පවත්වා මාසයක් ඇතුළත වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම.
ii. ප්‍රගතිය කාරක සභාවට දැනුම්දීමට කටයුතු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
සභාපති - ජාතික තරුණ සේවා සභාව
සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇත. **(ඇමුණුම 05)**

**21. <u>ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති දෙකක් අත්හිටුවා තිබීම</u>**

ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ රු. 84,216,614/- ක වටිනාකමින් යුතු ව්‍යාපෘති දෙකක් කොන්ත්‍රාත්කරු විසින් වැඩ ප්‍රමාද කිරීම හේතුවෙන් 2018 අගෝස්තු මස සිට නවතා දමා තිබූ අතර නැවත වැඩ ආරම්භ කර නොතිබීම.

**<u>නිර්දේශ</u>**

මෙම කරුණ සම්බන්ධ වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
සභාපති - ජාතික තරුණ සේවා සභාව
සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

නිර්දේශිත වාර්තාව ඉදිරිපත් කර ඇත.

**22. <u>ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 16ක් සම්බන්ධයෙන් අමතර ගෙවීම්</u>**

ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 16කට අදාළව, බිල්පතෙහි සඳහන් ගෙවීම් ක්‍රමය නොසලකා හැර, රු. 1,147,245/-ක් (ශ්‍රමිකයන් සඳහා වන වන්දි රක්ෂණාවරණය සඳහා එකතුව) වැඩිපුර ගෙවා තිබීම සහ රු. 4,253,750/-ක් (ලංසු වටිනාකම මත එකතුව) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබීම.

මේ සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලයෙන් උපදෙස් ලබාගෙන ඇති බවත්, උපදෙස් පරිදි වඩාත් සුදුසු ආකාරයට ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන අතර, වැඩිපුර ගෙවා ඇති මුදල අය කර ගැනීමට කටයුතු කරන බවත් ආයතනයේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

<u>**නිර්දේශ**</u>

අදාළ නිවැරදි කිරීම් ක්‍රමවේදයේ වත්මන් ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

නිර්දේශිත වාර්තාව ඉදිරිපත් කර ඇති අතර ප්‍රගතිය වාර්තා කර ඇත.

<u>**ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම**</u>

**23.** <u>**සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වීමට කොටස් 100ක් මිල දී ගෙන තිබිය යුතු වීම**</u>

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 66වන වගන්තිය ප්‍රකාරව සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට අවම වශයෙන් කොටස් 100ක් මිල දී ගෙන තිබුය යුතු වුවද, සමාගමේ දැනට සිටින අධ්‍යක්ෂවරුන් විසින් කොටස් මිලදී ගැනීමට කටයුතු නොකිරීම.

<u>**නිර්දේශ**</u>

සමාගමේ අධ්‍යක්ෂවරයකු වීමට කොටස් 100ක් මිලදී ගැනිය යුතු වීම යන අවශ්‍යතාවය ඉවත් කරමින් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ වගන්ති සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**24.** <u>**සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය අඩුවෙන් ප්‍රේෂණය කිරීම**</u>

සමාලෝචිත වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය සඳහා රු. 8,509,233/-ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබීම.

ආයතනයේ කාරක ප්‍රාග්ධනය සම්බන්ධයෙන් ඇති වූ ගැටලුවක් හේතුවෙන් එය සිදුවූ බවත් ඉදිරියේදී අදාළ සියලු දායක මුදල් නිසි පරිදි ගෙවීමට සැලසුම් කර ඇති බවත් ආයතනයේ සභාපති විසින් මෙහිදී සඳහන් කරන ලදී.

**නිර්දේශ**

මෙම කරුණ සම්බන්ධයෙන් මාසයක් ඇතුළත වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**25. වාර්ෂික මහා සභා රැස්වීම**

2016 සිට 2021 ඔක්තෝබර් 30 දක්වා වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා නොමැති බව කමිටුව නිරීක්ෂණය කළේය.

**නිර්දේශ**

සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම් වසරකට වරක් පැවැත්වීමට අවශ්‍ය පියවර ගැනීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**26. ආදායම් බදු නොගෙවීම**

දේශීය ආදායම් පනතේ 113 වගන්තියට අනුව සමාගම විසින් ආදායම් බදු ගෙවා නොමැති බවත්, සමාලෝචිත වර්ෂය සඳහා සහ පසුගිය වසර 05ට අදාළව ආදායම් බදු වාර්තා ඉදිරිපත් කර නොතිබීමත්, එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.10,981,533/-ක් වෙන් කර තිබීම පිළිබඳවත් කාරක සභාවේ අවධානය යොමු විය.

**නිර්දේශ**

මෙම කරුණ සම්බන්ධව වහාම පරීක්ෂා කර මාස තුනක් ඇතුළත මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**27. ආර්ථික සේවා ගාස්තු නොගෙවීම**

2006 අංක 13 දරන ආර්ථික ගාස්තු (සංශෝධන) පනත අනුව සමාගමක කාර්තුමය පිරිවැටුම රු. මිලියන 50ක් ඉක්ම වූ විට ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වුවද, මෙම සමාගමේ කාර්තුමය පිරිවැටුම රු. මිලියන 50ක් ඉක්මවා තිබූ අතර, පනත යටතේ ලියාපදිංචි කර නොතිබීම ද කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

**28. කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ ධූර කාලයට අදාළ නොවන ගෙවීම**

කළමනාකාර අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩු වූ 2019.03.02 සිට 2019.11.07 දක්වා කාල සීමාව වෙනුවෙන් රු. 336,740/-ක් කලින් එම තනතුර දැරූ නිලධාරියාට ගෙවා තිබීම.

**නිර්දේශ**

මෙය විශේෂ කරුණක් ලෙස සලකා අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීම සහ ඒ අනුව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**29. පුද්ගලික බැංකුවක ස්ථාවර තැන්පතු**

අංක 2/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව සමාගම සතු රු.1,463, 856/-ක් වටිනා ස්ථාවර තැන්පතු පෞද්ගලික වාණිජ බැංකුවක තැන්පත් කර තිබීම.

**නිර්දේශ**

මෙවැනි කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් නිසි පරිදි දැනුවත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**30. ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය තහවුරු කිරීමට හෝ කඩිනම් කිරීමට අපොහොසත් වීම**

2020.10.20දිනට මුද්‍රණ අංශයේ රු.10,520,015ක් වූ මුළු ණයගැති ශේෂයෙන් 91.5%ක් 2015-2019 කාලසීමාව සඳහා හිඟ ණය ශේෂයන් වූ අතර ණය ආපසු අයකර ගැනීම

තහවුරු කිරීමට හෝ කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොමැති ව කාරක සභාවේ නිරීක්ෂණයට ලක් විය.

**නිර්දේශ**

මෙම කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කර එළදායී තීරණයක් ගැනීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**31. මූල්‍ය රෙගුලාසි වලට අනුකූල වීමට අපොහොසත් වීම**

සමාගම් නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් සමාගමට සිදු වී ඇති එකතුව රු.1,644,253/-ක් වන අලාභය සම්බන්ධව මූල්‍ය රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු කළ යුතු විශේෂ කරුණු සහ ආයතනයේ වත්මන් කාර්යසාධනය**

**ජාතික තරුණ සේවා සභාව**

**32. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සැකසීමට අපොහොසත් වීම**

ජාතික තරුණ සේවා සභාවේ 98% කට වැඩි කොටස් හිමිකාරීත්වයක් සහිතව, ශ්‍රී ලංකා තරුණ සේවා (පුද්ගලික) සමාගම 1981 දී ආරම්භ කර තිබුණද, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර නොතිබීම මෙන්ම සභාව විසින් 2018, 2019 හා 2020 වර්ෂ සඳහා රු. මිලියන 417ක් වටිනා කාර්යයන් ප්‍රමාණයක් සමාගම තුළින් සිදු කර ගෙන තිබීම.

සමාගමෙහි 98% ක අයිතිය කවුන්සිලය සතු වුවද, සමාගම කවුන්සිලයේ පාලනයෙන් තොර බවත්, සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීම අසාර්ථක වීම හේතුවෙන් ඒකාබද්ධ ගිණුම් සැකසීම අසාර්ථක වී ඇති බවත් කාරක සභාව මෙහිදී නිරීක්ෂණය කළේය.

**<u>නිර්දේශ</u>**

කාරක සභාව විසින් පහත උපදෙස් ලබා දෙන ලදී.

i. සමාගමේ මූල්‍ය විනිවිදභාවය සුරක්ෂිත කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

ii. අමාත්‍යාංශය හරහා සමාගමේ ක්‍රියාවලිය ඇගයීම.

iii. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම.

iv. සමාගමේ ක්‍රියාකාරකම් සහ අනෙකුත් කාර්යයන් පිළිබඳව කවුන්සිලයේ අධ්‍යක්ෂවරුන් වෙත කාර්තුමය වාර්තාවක් ඉදිරිපත් කිරීම.

v. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

vi. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයා හරහා සමාගමේ මූල්‍ය තත්ත්වය අධීක්ෂණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

**මෙම කරුණ සම්බන්ධව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් තරුණ සේවා පුද්ගලික සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සිදු කරනු ලැබූ විගණනයේ සංක්ෂිප්ත වාර්තාවක් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOYS/ACC/A1/6/COPE-NYSC හා 2022.07.15 දිනැති ලිපියෙන් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.**

## 33. <u>අභ්‍යන්තර චක්‍රලේඛ අංක DA/Office 10/08</u>

සභාපති විසින් අංශ ප්‍රධානීන් වෙත 2021.10.08 දින නිකුත් කර තිබූ අභ්‍යන්තර චක්‍රලේඛ අංක DA/Office 10/08 මඟින් ආයතනයට අදාළ තොරතුරු බාහිර පාර්ශ්ව වෙත ලබා නොදිය යුතු බවට අවධාරණය කරමින් නියෝගයක් ලබා දීම හේතුවෙන් 2021.11.01 දින තෙක් කිසිඳු අංශයක් විසින් සභාපති අවසරය ගන්නා තෙක් ලිපි ගොනු හා තොරතුරු ලබා නොදීමට කටයුතු කිරීම.

කිසිදු රාජ්‍ය නිලධාරියෙකුට විගණකාධිපතිවරයාට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටිය නොහැකි බව කාරක සභාව මෙහිදී අවධාරණය කරන ලදී.

**<u>නිර්දේශ</u>**

උක්ත චක්‍රලේඛය නිවැරදි කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇත.

## 34. "Be Happy with Youth" වැඩසටහන

මෙම වැඩසටහන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර, ට්‍රක් රථයක සවිකර ඇති වීඩියෝ බිත්තියක් කුලියට ගැනීම සඳහා රු. 847,000/-ක් ගෙවා තිබීමත්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව, එම වැඩසටහන සඳහා සහභාගී වන ශිල්පීන් 28දෙනෙකු සඳහා රු.1,500,000/-ක් ගෙවා තිබීම.

මහල් නිවාසවල ජීවත්වන තරුණ තරුණියන්ගේ මානසික සෞඛ්‍යය නංවාලීම සඳහා කොවිඩ් - 19 වසංගතය නිසා රට අගුලු දැමීමේ (Lockdown) කාලය තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇති බවත් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති බවත් ආයතනයේ සභාපති විසින් මෙහිදී සඳහන් කරන ලදී.

## 35. සුහුරු ගෙවත්ත (Smart Garden) වැඩසටහන සඳහා මුදල් අවභාවිතය

ඉහත ව්‍යාපෘතියේ සමාරම්භක වැඩසටහන සඳහා අත්‍යවශ්‍ය නොවන මිල දී ගැනීම් වෙනුවෙන් රු.764,000/-ක් වැය කර තිබීම සහ ටී ෂර්ට් 5453ක තොගයක් ගබඩාවේ තිබියදීත් රු.643,500/-ක් වටිනා අමතර ටී ෂර්ට් 900 ක් මිලදී ගෙන තිබීමත්, නියමිත දිනට වැඩසටහන නොපැවැත්වීම හේතුවෙන් රු.225,050/-ක අතිරේක මුදලක් පෞද්ගලික ආයතනයකට ගෙවීම පිළිබඳවත් කාරක සභාවේ වැඩිදුර අවධානය යොමු විය.

**නිර්දේශ**

i. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු අවම මූල්‍ය සීමාවක් නියම කරමින් මාර්ගෝපදේශ ලබා දීම.
ii. උක්ත මාර්ගෝපදේශ පිටපතක් විගණකාධිපති වෙත යැවීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර ඇත.

## 36. CISCO පරිගණක ජාලකරණ පාඨමාලාව

මෙම පරිගණක ජාලකරණ පාඨමාලාව ආරම්භ කිරීමට මූලික පහසුකම් සපුරා ගැනීමටත් පෙර එනම්, 2021.07.29 දින රු.15,708,178/-ක් වැය කර ඉහත වැඩසටහන සඳහා උපකරණ මිල දී ගෙන ඇති අතර ඒවා 2021.10.29 දින වන විටත් නිෂ්කාර්යව පැවතීම.

ගුරුවරුන් බඳවා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් පාඨමාලාව ආරම්භ කිරීම ප්‍රමාද වූ බවත් පරිගණක ජාලකරණ පාඨමාලාව 2022 ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බවත් මෙහිදී ආයතන සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

**<u>නිර්දේශ</u>**

ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමෙහි ව්‍යුහය, ව්‍යාපාරය සහ මූල්‍ය වගවීම ප්‍රතිසංවිධානය කිරීමට සහ අනුබද්ධ සමාගමක් තිබීමේ අවශ්‍යතාවය නැවත සලකා බැලීමට අවශ්‍ය පියවර ගැනීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇත.

**ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම**

**37.** **<u>සමාගම විසින් කවුන්සිලයේ ගොඩනැගිල්ල භාවිතා කිරීම</u>**

ගබඩාවක් සහ රියදුරන් 50කට පමණ නේවාසිකව සිටීමට ඉදිකරන ලද පිරිවැය රු.107,526,046ක් වූ නව ගොඩනැගිල්ලේ දෙවන මහල අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් නොමැතිව සභාපති විසින් ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ලබා දී තිබීම.

**38.** **<u>ආදායම සහ වියදම්</u>**

"තරුණ සංවර්ධනය සඳහා වන වියදම්" යන කාණ්ඩය යටතේ සැලකිය යුතු වියදමක් ඇතුළත් වුවද, එම වර්ගීකරණය නිශ්චිත නොවන බව කාරක සභාව නිරීක්ෂණය කළේය.

**<u>නිර්දේශ</u>**

විශේෂ ව්‍යාපෘති සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් කෙටුම්පත් කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

සභාපති - ජාතික තරුණ සේවා සභාව

සභාපති - ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇති නමුත් නිර්දේශිත මාර්ගෝපදේශ කෙටුම්පත කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

**<u>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව</u>**

*(ඉඩම් අමාත්‍යාංශය)*

**විමර්ශනය කරන ලද දිනය: 2021.11.17**

**<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>**

**01. <u>ඉඩම් කොමිෂන් සභාවෙහි මූලික රාජකාරිය</u>**

කොමිෂන් සභාවේ වත්මන් තත්ත්වය සහ එහි මූලික අරමුණු සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු කරන ලදී.

2022 වසර වන විට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා වසර 50 සම්පූර්ණ වීමට ආසන්න බවත්, මෙතෙක් අත්පත් කර ගෙන ඇති සියලුම ඉඩම් ප්‍රමාණය පිළිබඳව පැහැදිලි සංඛ්‍යා ලේඛන නොමැති වුවද, පවතින මූලාශ්‍රවලට අනුව රජය විසින් මේ වන විට අත්පත් කර ගෙන ඇති මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 1,750, 990ක් පමණ වන බව ආයතනයේ සභාපති විසින් සඳහන් කරන ලදී.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙහි මෙහෙයුම් ශක්තිමත් කිරීම සහ එහි මූලික වත්කම් හඳුනා ගැනීම සඳහා සවිස්තර දත්ත සහිත ඉඩම් ලේඛනයක අවශ්‍යතාවය කාරක සභාව මෙහිදී අවධාරණය කළේය.

මෙහිදී ආයතනයේ සභාපති විසින් සඳහන් කරන ලද්දේ ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ දත්ත පද්ධතියක් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටින අතර එම ලේඛනයේ කටයුතු වලින් 50%ක් සම්පූර්ණ කර ඇති බවත්, අත්පත් කර ගන්නා අවස්ථාවේදී ප්‍රකාශ කරන ලද ඉඩමේ තොරතුරු සත්‍ය ඉඩම් ප්‍රමාණයට හා ඒවාට අදාළ ලියකියවිලිවලට පටහැනි බැවින් දැනට ආයතනය සතු ලේඛනවලට අනුව සැබෑ ඉඩම් ප්‍රමාණය සොයා ගැනීමට අසීරු වී ඇති බවත් ය.

කෙසේ වෙතත්, කාරක සභාවේ අදහස වූයේ ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් නිශ්චිත, විශ්වාසදායක ලියවිල්ලක් ආයතනය සතුව තිබිය යුතු බවත්, අමාත්‍යාංශය සහ කොමිෂන් සභාව විසින් මෙම ගැටලුව හැකි ඉක්මනින් විසඳීමට සැලැස්මක් සකස් කළ යුතු බවත්ය. මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් මැනීම සඳහා ඩ්‍රෝන කැමරා වැනි නවීන තාක්ෂණය යොදා ගන්නා බව ද මෙහිදී කමිටුව නිරීක්ෂණය කළේය.

**<u>නිර්දේශ</u>**

මේ සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් නොපමාව කාරක සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - ඉඩම් අමාත්‍යාංශය

සභාපති - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**02. <u>කොමිෂන් සභාවේ සංයුතිය සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම</u>**

කොමිෂන් සභාවේ සංයුතිය, දැනට සිටින සාමාජිකයින් සංඛ්‍යාව සහ 2015 - 2019 කාල පරිච්ඡේදය තුළ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තා සහ වාර්ෂික වාර්තා නියමිත කාලය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබීම පිළිබඳව ද කාරක සභාවේ අවධානය යොමු විය.

<u>**නිර්දේශ**</u>

කාර්ය සාධන වාර්තා සහ වාර්ෂික වාර්තා නොපමාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

**ලේකම් - ඉඩම් අමාත්‍යාංශය**

**සභාපති - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව**

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**03. <u>අතිරේක සේවක සංඛ්‍යාව ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කිරීම</u>**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිසි අනුමැතියකින් තොරව, ව්‍යාපෘතියක් සඳහා බඳවාගෙන ඇති, 2018 වර්ෂයේදී ආයතනයට අන්තර්ග්‍රහණය කරන ලද අතිරේක සේවක සංඛ්‍යාව 214ක් වීම පිළිබඳ ගැටලුව කාරක සභාව විසින් කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන ලදී.

මෙම සේවක සංඛ්‍යාව "Oppu Dasalaksaya" නම් ව්‍යාපෘතිය සඳහා බඳවා ගත් බවත්, මෙම සේවකයින් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීමට අනුමැතිය ලබා දී ඇත්තේ කොමිෂන් සභාවේ හිටපු සභාපති විසින් බවත් මෙහිදී අනාවරණය විය .

කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පටිපාටියට කාරක සභාවේ දැඩි විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී.

<u>**නිර්දේශ**</u>

අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා මෙම ගැටලුව නිරාකරණය කිරීමට කටයුතු කර මාසයක කාලයක් ඇතුළත කාරක සභාවට වාර්තා කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

**ලේකම් - ඉඩම් අමාත්‍යාංශය**

**සභාපති - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව**

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර ඇත.

## 04. මීට පෙර 2018.08.23 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමෙහි දී ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීම

### 04.1 ස්ථිර ඉඩම් ලේඛනයක් සකස් කිරීම

ඉඩම් පිළිබඳ සවිස්තරාත්මක ලේඛනයක් සකස් කිරීම සම්බන්ධයෙන් 2018 අගෝස්තු 23 වැනි දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශය පිළිබඳව අවධානය යොමු වූ අතර ඒ සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ද කාරක සභාව විසින් යෝජනා කළ අතර, මෙම ලේඛනය ඉඩම් පිළිබඳ කොමිෂන් සභාව සතු විය යුතු මූලික ලියවිල්ලක් විය යුතු බවට ද කාරක සභාවේ අදහස විය.

සංවර්ධනය වන ඉඩම්, වෙනත් පාර්ශ්වයන් විසින් අන්සතු කරන ලද ඉඩම් සහ ඉදිරියේදී සංවර්ධනය කළ හැකි ඉඩම් පිළිබඳව ද දිස්ත්‍රික් පදනමින් පැහැදිලි ලේඛනයක් තිබිය යුතු බව විගණකාධිපති විසින් ද නිරීක්ෂණය කළේය.

### 04.2 අතුරුදහන් ගොනු

අස්ථානගත වූ සහ අස්ථානගත වූ බව කියන ලිපිගොනු 200ක් පිළිබඳව කාරක සභාව විමසන ලදී.

**නිර්දේශ**

මේ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ගැනීම සහ එහි ප්‍රගතිය මාසයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

**ලේකම් - ඉඩම් අමාත්‍යාංශය**
**සභාපති - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව**

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 3/1/45 හා 2022.07.07 දිනැති ලිපියෙන් මෙම කරුණ සම්බන්ධ වර්තමාන තත්ත්වය පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කර ඇත.

### 04.3 2002-2004 කාලය තුළ ඉඩම් අන්සතු කිරීමේ ගැටලුව

2002 - 2004 කාල පරිච්ඡේදය තුළ බදු දී ඇති සහ නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකළ ඉඩම් අන්සතු කිරීමේ සිද්ධීන් 528ක් සම්බන්ධයෙන් 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙහි අංක 7 දරන අයිතමය පිළිබඳව කමිටුවේ අවධානය යොමු විය. කොමිෂන් සභාවෙහි නිසි අනුමැතියකින් තොරව විශාල ඉඩම් ප්‍රමාණයක් පරිහරණය කරන මෙවැනි සිද්ධීන්ට විසඳුම කුමක්දැයි කාරක සභාව ප්‍රශ්න කරන ලදී.

මෙම පනත යටතේ ප්‍රකාශිත ඉඩම් සහ විවිධ අවශ්‍යතා සඳහා අන්සතු කර ඇති ඉඩම පිළිබඳව සොයා බැලීමටත්, එම ඉඩම් හඳුනාගැනීමේ යාන්ත්‍රණයක් සැකසීමටත්, එම මෙහෙයුම් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකා කිරීමේ අවශ්‍යතාවයත්, දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව කාරක සභාව විසින් අවධාරණය කළේය.

**නිර්දේශ**

එවැනි ඉඩම් සුදුසු පරිදි වර්ගීකරණය කිරීමට කටයුතු කර මාසයක කාලයක් ඇතුළත නැවත කාරක සභාවට වාර්තා කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - ඉඩම් අමාත්‍යාංශය

සභාපති - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපි අංක 3/1/45 හා 2022.02.09 දිනැති ලිපිය මඟින් නිර්දේශිත සවිස්තර වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**04.4 ඉඩම් තක්සේරු කිරීම**

කොමිෂන් සභාව සතු ඉඩම්වල වටිනාකම පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළ අතර මීට වසර 15කට පෙර සිටම මීට පෙර කමිටුවල කිහිප වතාවක්ම මේ පිළිබඳව සාකච්ඡා කළ නමුත් ඵලදායි විසඳුමක් නොලැබුණු බවද විගණකාධිපතිගේ අදහස විය.

**නිර්දේශ**

මේ සම්බන්ධයෙන් විශේෂ කමිටුවක් පත් කර, කොමිෂන් සභාව සතු ඉඩම් නැවත තක්සේරු කර මෙම ගැටළුව වහා නිවැරදි කර මාස හයක් ඇතුළත කාරක සභාවට වාර්තා කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - ඉඩම් අමාත්‍යාංශය

සභාපති - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**05. කමිටුව විසින් සාකච්ඡාවට කැඳවන ලද විගණන වාර්තාවල කරුණු**

**(i) ව්‍යාපෘති අංශයේ ආදායම**

කොමිෂන් සභාව සතු ඉඩම්වල පවතින සම්පත් පිළිබඳව ද කාරක සභාව අවධානය යොමු කළ අතර කොමිෂන් සභාව විසින් එවැනි සම්පත් ක්‍රමානුකූලව හඳුනාගෙන තිබේද යන්න පිළිබඳව විමසීම.

**නිර්දේශ**

අම්පාර, නුවරඑළිය, හයින්ෆෝර්ඩ් වත්ත ආදී ඉඩම් කට්ටිවලට අදාළ අක්‍රමිකතා පිළිබඳව පරීක්ෂා කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - ඉඩම් අමාත්‍යාංශය

සභාපති - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**(ii) කොමිෂන් සභාවේ නීති අංශය**

කොමිෂන් සභාවේ නීතිමය සිද්ධීන් පිළිබඳවත්, කොමිෂන් සභාව සතු ඉඩම් බදු දීම සහ උකස් කිරීම සම්බන්ධ ගැටලු සහ අක්‍රමිකතා පිළිබඳවත් කාරක සභාවේ අවධානය යොමු වීම.

**නිර්දේශ**

i. කොමිෂන් සභාවේ නඩු එලදායි ලෙස හැසිරවීමට හැකි වන ආයතනයේ නීති අංශය බලාත්මක කිරීම.
ii. රජය විසින් ඉඩම් පවරා ගැනීම යටතේ 1972-1974 කාලය තුළ අගතියට පත් වූවන්ගේ ගැටලුවලට පිළියම් යෙදීම සඳහා විශේෂ උපකාරක කවුළුවක් විවෘත කර අදාළ ගැටලුවලට වහාම අවධානය යොමු කිරීමට කටයුතු කිරීම.
iii. මාස හයක කාලයක් ඇතුළත මෙම ගැටලුව විසඳා කාරක සභාවට ප්‍රගතිය වාර්තා කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - ඉඩම් අමාත්‍යාංශය

සභාපති - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**06. බදු දී ඇති සමහර ඉඩම් සම්බන්ධ ගැටළු**

පාසිකුඩා, (අක්කර 269 මඩකලපුව), කොහිලවගුරුවත්ත (අක්කර 320, ගාල්ල), ඔලබොඩුව, යහල කැලේ සහ ඉන්ග්‍රිය වත්ත (අක්කර 22) මැද්දේගෙදර වත්ත (අක්කර 4), ඉරණවිලවත්ත (අක්කර 40) වැනි කොමිෂන් සභාවට අයත් ඉඩම් පිළිබඳව ද ඉඩම් බදු දීම සම්බන්ධ ගැටලු සහ කොමිෂන් සභාව වෙත ලැබිය යුතු විශාල බදු මුදල් සහ හිඟ මුදල් නොලැබීම නිසා රාජ්‍ය ආදායමට විශාල පාඩුවක් සිදු වීම පිළිබඳව ද කාරක සභාවේ අවධානය යොමු විය.

**<u>නිර්දේශ</u>**

විවිධ අරමුණු සඳහා අත්සතු කරන ලද ඉඩම්, ඉතිරි ඉඩම් ප්‍රමාණය, මුල් අයිතිකරුවන්ට ලබා දිය යුතු ඉඩම් ප්‍රමාණය ආදිය පිළිබඳ සවිස්තරාත්මක ලේඛනයක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - ඉඩම් අමාත්‍යාංශය

සභාපති - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

නිර්දේශිත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**07. <u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විශේෂ අවධානයට යොමු වූ කරුණු</u>**

උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29ක් ආවරණය වන පරිදි අලුතින් ආරම්භ කරන ලද කාබනික පොහොර නියමු ව්‍යාපෘතිය සම්බන්ධව කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය.

**<u>නිර්දේශ</u>**

සති දෙකක කාලයක් ඇතුළත මේ පිළිබඳ සවිස්තර වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - ඉඩම් අමාත්‍යාංශය

සභාපති - ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 3/1/45 හා 2021.12.02 දිනැති ලිපිය මඟින් සවිස්තරාත්මක විස්තර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## හිඟුරාන සීනි කර්මාන්තායතනයේ මෙහෙයුම් කටයුතු සඳහා පිහිටුවන ලද සී/ස ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

**විමර්ශනය කරන ලද ආයතන:** i. වැවිලි අමාත්‍යාංශය

ii. උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

iii. හිඟුරාන සීනි කර්මාන්තායතනය

**විමර්ශනය කරන ලද දිනය:** 2021.11.24

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

**01. නිලධාරීන් නොපැමිණීම**

කම්ටුව නිරීක්ෂණය කළේ ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ආචාර්ය ඒ. දිසානායක මහතා කාරක සභාවේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන කාරක සභා රැස්වීමට පැමිණ සිටියේ නැත.

**නිර්දේශ**

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ආචාර්ය ඒ. දිසානායක මහතා කාරක සභා රැස්වීමට නොපැමිණීමට හේතු සතියක් ඇතුළත ලිඛිතව කාරක සභාවට දැනුම් දීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - වැවිලි අමාත්‍යාංශය

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

කාරක සභාවට වාර්තා කර ඇත.

**02. අමාත්‍ය මණ්ඩල තීරණ**

පහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණ 4ක් කෙරෙහි කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය.

i. 2006 ජූලි 19 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් හිඟුරාන සීනි කර්මාන්තායතනය නව ආයෝජකයෙකුට පැවරීමේ ගෙන තිබූ තීරණය
ii. 2006 දෙසැම්බර් 06 - ගල්ඔය සමාගමේ කළමනාකරණය, ශ්‍රී ලංකා රජයේ සහයෝගීතාවය සහිතව පෞද්ගලික කොටස්කරුවන් වූ Browns සහ LOLC සමාගම්වලින් සැදුම්ලත් ඒකාබද්ධ ව්‍යාපාරයකට පැවරීමේ තීරණය

iii. 2006 ඔක්තෝබර් 11 - ගල්ඔය වැවිලි සමාගම (පුද්ගලික) සංස්ථාගත කිරීමට ගත් තීරණය
iv. 2009 මාර්තු 18 - කොටස් හිමියන්ගේ ගිවිසුම අත්සන් කිරීමට ගත් තීරණය සහ කළමනාකරණ ගිවිසුම අත්සන් කිරීම

**03. <u>පොදු - පුද්ගලික හවුල්කාරිත්වය</u>**

කොටස් හිමියන්ගේ ගිවිසුමට අනුව දෙපාර්ශ්වයම (රාජ්‍ය අංශය සහ ලංකා ඔරික්ස් ලීසිං සමාගම සහ බ්‍රවුන් ඇන්ඩ් කම්පැනි පීඑල්සී) විසින් ආයෝජනය කරන ලද මුදල පිළිබඳව කමිටුව අවධානය යොමු කරන ලදී.

එහිදී අනාවරණය වූයේ, හිඟුරාන සීනි සමාගමට අයත් ගොඩනැගිලි පිහිටි ඉඩම් හෙක්ටයාර් 277.75ක් වසර 30ක බදු කාලයක් සඳහා රු. මිලියන 294කට ද අනෙකුත් චංචල දේපොළ රු. මිලියන 222කට ද තක්සේරු කර රු. මිලියන 516ක රජයේ හිමිකාරීත්වය මත 51%ක හිමිකම් ලෙස පවරා තිබූ අතර ඉතිරි 49%ට සමාන රු. මිලියන 495ක් ලෙස සී/ස බ්‍රවුන්ස් සමාගම සහ සී/ස ඔරික්ස් ලීසිං සමාගම විසින් භාරගෙන තිබූ බවයි.

**04. <u>ගල්ඔය හෝල්ඩිංගිස් (පුද්ගලික)සමාගම</u>**

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ කළමනාකරණ කටයුතු සිදු කිරීම සඳහා ඉහත සඳහන් සමාගම පිහිටුවා ඇති බව කාරක සභාවට අනාවරණය විය.

මෙහිදී පහත සඳහන් කරුණු පිළිබඳව කාරක සභාවේ අවධානයට යොමු කරන ලදී;

i. කළමනාකරණ ගිවිසුම වසර 10 ක කාලයක් සඳහා 2010 අප්‍රේල් මස 26 දින අත්සන් කර තිබීම.
ii. එම ගිවිසුමේ කාලය අවසන් වීමට වසර 05ක කාලයත් තිබිය දී 2014 වර්ෂයේ දී, ඉහත කී ගිවිසුම, වර්ෂ 2029.08.29 දින දක්වා දීර්ඝ කර තිබීම.
iii. ඉහත දිගුවට අදාළ අවසර ලිපිය ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම හෝ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සතුව නොතිබීම.

එකී ගිවිසුම දීර්ඝ කිරීම රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කළ බවත් එය ගල්ඔය වැවිලි සමාගමේ (පුද්ගලික) ඉල්ලීම මත සිදු කළ බවත් මේ පිළිබඳව පිළිතුරු දෙමින් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් සඳහන් කළ අතර එම අවස්ථාවේ ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමට කළ ආයෝජනයක් හේතුවෙන් කළමනාකරණ ගිවිසුම දීර්ඝ කිරීමට සිදුවූ බව ආයතනයේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී, විගණකාධිපතිවරයා විමසීමකින් තොරව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ගිවිසුම් සඳහා සංශෝධන සිදුකිරීමේ ප්‍රායෝගිකභාවය පිළිබඳවත්, එවැනි ගිවිසුම් අවසන් කිරීමට භාණ්ඩාගාර ලේකම්වරයාට හෝ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලයක් තිබේද යන්න පිළිබඳව ප්‍රශ්න ගත විය.

**නිර්දේශ**

රාජ්‍ය -පෞද්ගලික හවුල්කාරිත්වයක් ඇති සමාගම් විසින් එළැඹි එවැනි කළමනාකරණ ගිවිසුම් අවසන් කිරීමට හෝ අවසන් කිරීමට බලය ඇත්තේ කාටද යන්න සොයා බැලීම සඳහා විමර්ශනයක් සිදු කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**05. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**

ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් සමන්විත වන අතර එයට රාජ්‍ය අංශයේ අධ්‍යක්ෂවරුන් 5 දෙනෙකු සහ Lanka ORIX Leasing Company සහ Brown & Company PLC හි අධ්‍යක්ෂවරුන් 4 දෙනෙකු ඇතුළත් බව කාරක සභාව සඳහන් කළේය.

**06. සමාගම් ලේකම් තනතුර**

සමාගම් ලේකම් තනතුර සම්බන්ධයෙන් කාරක සභාව අවධානය යොමු කළ අතර එය ලංකා ඔරික්ස් ලීසිං සමාගම විසින් දරනු ලැබූවක් බව අනාවරණය කළ අතර සමාගමට වැදගත් තනතුරක් වූ සමාගම් ලේකම් තනතුර ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගමට හිමි නොවීම සම්බන්ධයෙන් සිය බලවත් අප්‍රසාදය පළ කළේය.

**නිර්දේශ**

ආයතනයේ සමාගම් ලේකම් තනතුර රඳවා තබා ගැනීමේ වැදගත්කම කාරක සභාව විසින් අවධාරණය කරන ලද අතර එම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - වැවිලි අමාත්‍යාංශය

ලේකම් - උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**07. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ**

ගල්ඔය වැවිලි සමාගමේ (පුද්ගලික) අධ්‍යක්ෂ මණ්ඩලයේ වත්මන් තත්ත්වය පිළිබඳව කමිටුව විමසා සිටියේය.

**08. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම නැවත කැඳවීම**

විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද "හිගුරාන සීනි කම්හලේ මෙහෙයුම් සඳහා පිහිටුවා ඇති ගල්ඔය වැවිලි (පුද්) සමාගමේ මෙහෙයුම් කටයුතු පිළිබඳ විශේෂ විගණන

වාර්තාව" සලකා බැලීමට සහ ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම නැවත කැඳවීමට කමිටුව තීරණය කළේය.

**<u>නිර්දේශ</u>**

විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ආයතනය කාරක සභාව හමුවට කැඳවන තෙක් ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම සම්බන්ධයෙන් සැලකිය යුතු මූල්‍ය තීරණ නොගැනීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - වැවිලි අමාත්‍යාංශය

ලේකම් - උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද "හිඟුරාන සීනි කම්හලේ මෙහෙයුම් සඳහා පිහිටුවා ඇති ගල්ඔය වැවිලි (පුද්) සමාගමේ මෙහෙයුම් කටයුතු පිළිබඳ විශේෂ විගණන වාර්තාව" සලකා බැලීම සඳහා ගල්ඔය වැවිලි (පුද්) සමාගම 2021.12.26 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හමුවට කැඳවීම.

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

*(සංචාරක අමාත්‍යාංශය)*

**විමර්ශනය කරන ලද දිනය: 2021.11.26**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

**01. අධිකාරියට සම්බන්ධ ආයතන 4, එක් ආයතනයක් බවට පත් කිරීම**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් පහත දැක්වෙන ආයතන 04 එක් ආයතනයක් බවට පත් කිරීම පිළිබඳව කාරාක සභාවේ අවධානය යොමු විය.

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (Sri Lanka Tourism Development Authority)
- ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය (Sri Lanka Convention Bureau)
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (Sri Lanka Tourism Promotion Bureau)
- ශ්‍රී ලංකා සංචාරක හෝටල් හා කළමනාකරණ ආයතනය (Sri Lanka Institute of Tourism & Hotel Management)

මේ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

- ඉහත ආයතන 4ම දැනට එක් සභාපතිවරයෙක් යටතේ පාලනය වන බවත්,
- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකාරිත්ව ආයතනය (හෝටල් පාසල) හැර සෙසු ආයතන 3, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ලෙස එක් ආයතනයක් බවට පත් කිරීමටත් සැලසුම් සකසා ඇති බවත්,
- මෙම ඒකාබද්ධ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත්
- ඒ අනුව පනතේ අදාළ සංශෝධන කිරීමට බලාපොරොත්තු වන බවත්,
- සංශෝධිත පනත 2022 වසරේ අප්‍රේල් පමණ වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව සහ
- ආයතනයේ දේපළ සහ මානව සම්පත සඳහා එමගින් කිසිදු බලපෑමක් සිදු නොවන බව.

**නිර්දේශ**

i. මෙම ආයතන 4 ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලවල යම් විරෝධතා ඇති බව පෙනී යන බැවින් ඒවා හැකි ඉක්මනින් නිරාකරණය කිරීම.
ii. මෙම ආයතන 4හිම ප්‍රධාන ගණන් දීමේ නිලධාරී ලෙස මෙම ඒකාබද්ධ කිරීම පිළිබඳව ඉතා ඉක්මනින් තීරණයක් ගැනීම.
iii. ඒකාබද්ධ කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමු කර 2022 අප්‍රේල් මස වන විට අදාළ සංශෝධිත පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. සංශෝධනය කරන ලද පනත් කෙටුම්පත 2022 අප්‍රේල් මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව සංචාරක අමාත්‍යාංශ ලේකම්ගේ අංක **MT/IAI/1/4/COPE-SLTDA** හා 2022.01.10 දිනැති ලිපියෙන් කාරක සභාව වෙත දන්වා ඇත.

ii. අධිකාරියේ ඉල්ලීම පරිදි අදාළ පනත සංශෝධනය කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා 2022 ජූලි මස දක්වා කාලය දීර්ඝ කර ඇත.

iii. ප්‍රගතිය වාර්තා කර නොමැත.

**02.** <u>**වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම**</u>

**2019** වසර සඳහා වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

<u>නිර්දේශ</u>

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර, වාර්ෂික වාර්තාව ඉතා ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2019 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපි අංක **MT/IAI/1/4/COPE-SLTDA** හා 2022.08.29 දිනැති ලිපියෙන් කාරක සභාවට වාර්තා කර ඇත.

**03.** <u>**සංයුක්ත සැලැස්ම**</u>

සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් කාරක සභාව අවධානය යොමු කිරීම.

<u>නිර්දේශ</u>

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක හෝටල් හා කළමනාකරණ ආයතනය යන ආයතන 4න්ම කණ්ඩායම් 4ක් යොදවා සංයුක්ත සැලැස්ම ඉතා ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

සංයුක්ත සැලැස්ම සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇති බව කාරක සභාවට වාර්තා කර ඇත.

**04. <u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් නොවීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

මේ වන විට එය සකස් කර එයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත් බවත්, අමාත්‍යාංශයට භාර දුන් බවත්, කාරක සභාවට අනාවරණය විය.

**<u>නිර්දේශ</u>**

ක්‍රියාකාරී සැලැස්ම තුළ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරන ආකාරය ඇතුළත් විය යුතු බවත්, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර ක්‍රියාකාරී සැලැස්ම හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇති බව කාරක සභාවට වාර්තා කර ඇත.

**<u>2016.09.09 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම</u>**

**05. <u>නිර්දේශ අංක 04</u>**

කල්පිටිය ව්‍යාපෘතියේ දූපත් 12 නිසි පරිදි උපයෝජනය නොවීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

**<u>නිර්දේශ</u>**

කල්පිටිය ව්‍යාපෘතියේ දූපත් 12, විශේෂ ව්‍යාපෘතියක් ලෙස සලකා සංවර්ධනය කිරීම සඳහා සාදන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඉක්මන් පියවර ගැනීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

මෙම කරුණ සම්බන්ධ වර්තමාන ප්‍රගතිය අමාත්‍යාංශ ලේකම්ගේ ලිපි අංක **MT/IAI/1/4/COPE-SLTDA** හා 2022.08.29 දිනැති ලිපියෙන් කාරක සභාවට වාර්තා කර ඇත. **(ඇමුණුම 06)**

**06. <u>නිර්දේශ අංක 07 (i)</u>**

අධිකාරියට අයත් කතරගම සංචාරක නිවාඩු නිකේතනයේ කාමර 30ක කළ අළුත්වැඩියාවක් වෙනුවෙන් රුපියල් මිලියන 4.8ක් වැඩිපුර ගෙවීම සහ එය අනුමත කළ නිලධාරියා/ නිලධාරීන් පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

නීතිපතිවරයා විසින් සිවිල් නඩුවක් පැවරීමට නඩු නිමිත්තක් උපවය වී නොමැති බවත්, පොදු දේපළ පනත යටතේ නඩු පැවරීමට ඇති හැකියාව සොයා බලන ලෙසත්, උපදෙස් ලබා දී තිබුණ ද නඩු පැවරීමට කටයුතු කර නොමැති අතර එම නිලධාරියාට අවවාද කිරීමේ ලිපියක් පමණක් නිකුත් කර ඇත.

<u>නිර්දේශ</u>

i. මේ පිළිබඳව අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා එහි වාර්තාව කාරක සභාවට ලබා දීම.
ii. මේ පිළිබඳව ආයතනය මඟින් මෙතෙක් ගන්නා ලද පියවර සහ තවදුරටත් ගත යුතු පියවර පිළිබඳ මාස 3ක් ඇතුළත වාර්තා කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සංචාරක අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. ඉහත අංක (i)න් නිර්දේශිත වාර්තාව සංචාරක අමාත්‍යාංශ ලේකම් විසින් 2022.04.05 දිනැතිව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත යවා ඇති බවත්, ඒ අනුව කොන්ත්‍රාත්කරු හා අදාළ නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර ඇති බවත් කාරක සභාවට වාර්තා කර ඇත.
ii. නමුත් එම වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.
iii. මෙම කරුණ පිළිබඳ පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර ඇත.

**07. <u>නියෝග අංක 07 (ii)</u>**

කල්පිටිය, තොරෙයිඅඩි ජැටිය සහ වන්නිමුන්දලම කලපුව අසල පාර ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 10ක් ගෙවා ඇතත්, එම ද්‍රව්‍ය භෞතිකව භාර ගත් බවට සාක්ෂි නොමැති වීම.

මේ පිළිබඳව නීති අධ්‍යක්ෂ දැනුවත් වී නොමැති බව කාරක සභාවට අනාවරණය වූ අතර, තමන්ට ද නොමඟ යවන සුළු තොරතුරු ලබා දී ඇති බව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් පැවසීය.

එසේම කරුණු හොඳින් අධ්‍යයනය කර කාරක සභාවට පැමිණිය යුතු බවත්, ආයතනයේ පරිපාලනමය ගැටළුකාරී තත්ත්වයක් තිබෙන බව පෙනී යන බවත්, කාරක සභාව නිරීක්ෂණය කළාය.

**නිර්දේශ**

මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා අදාළ ආයතනය/ ආයතන වෙතින් නිරීක්ෂණ ලබාගෙන ඒවා කාරක සභාවට ලබා දීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර ඇත.

## 08. කාරක සභාවේ අවධානයට ලක් වූ 2018, 2019 වර්ෂ සහ වර්තමාන තත්ත්වයට අදාළ විශේෂ විගණන නිරීක්ෂණ

යාල, කල්පිටිය, කුච්චවේලි සහ දෙද්දුව සංචාරක සංවර්ධන ප්‍රදේශ ලෙස අධිකාරිය සතුව පවතින ව්‍යාපෘති කිහිපයේ වර්තමාන තත්ත්වය කාරක සභාවේ අවධානයට යොමු විය.

### 08.1 යාල සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය

අක්කර 1106 න් බදු දුන් ඉඩම් අක්කර 69ක් ආයතන 8කට බදු දී ඇති බවත්, මේ වනවිට එයින් සමාගම් 4ක් පමණ මෙහෙයුම් කටයුතු කරගෙන යන බවත්, කාරක සභාවට අනාවරණය විය.

### 08.2 කුච්චවේලි සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය

අක්කර 49ක් සමාගම් 3කට බදු දී ඇති අතර ඉන් එක් සමාගමක් 2021.10.31 වන විටත් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

**නිර්දේශ**

i. කුච්චවේලි සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පිළිගත හැකි සාක්ෂි සහිතව වාර්තාවක් විගණකාධිපතිට ලබා දීම.
ii. ප්‍රගතිය වාර්තා කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

වර්තමාන තත්ත්වය වාර්තා කර ඇත.

### 08.3 දෙද්දූව සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය

මෙයට අදාළ සංචාරක සංවර්ධන ප්‍රදේශය නිසි පරිදි උපයෝජනය නොකළේ මන්දැයි කාරක සභාව ප්‍රශ්න කළ අතර, මෙම ප්‍රදේශයට අයත් සීමා මායිම් තවමත් ලකුණු කර නොමැති බවත්, අක්කර 1732 න් අක්කර 600ක් සංවර්ධන කටයුතු සඳහා උපයෝගී කර ගත හැකි භූමි ප්‍රමාණය බවත් කාරක සභාවට අනාවරණය විය.

**නිර්දේශ**

සීමා නිර්ණය කර කුඩා හෝ මහා පරිමාණ සංවර්ධන කටයුතු සිදු කිරීම

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - සංචාරක අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදාළ සංවර්ධන කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව කාරක සභාව දැනුවත් කර ඇත.

**09. ප්‍රකාශිත සංචාරක ප්‍රදේශ සඳහා නියෝග සෑදීම**

මේ පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වූ අතර නිශ්චය කර ඇති නියෝග/ මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය බව කාරක සභාව අවධාරණය කළාය.

**10. යාල සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය**

යාල පලටුපාන වනජීව සංචාරක කලාපයේ ලොට් අංක **D1** සහ **D2** අදාළ අක්කර 7ක භූමි භාගයක් 2014දී පුද්ගලික සමාගමකට බදු දී ඇති අතර, එහි මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරිමට නොහැකි බව දන්වමින් අතුරු තහනම් නියෝගයක් ලබාදීම පිළිබඳවත් නඩු කටයුතු සඳහා පෞද්ගලික නීතිඥවරුන්ගේ සේවය ලබා ගැනීම පිළිබඳවත් එසේම පෞද්ගලික නීතිඥවරුන්ගේ සේවය ලබා ගැනීමට ආයතනයේ සමහරුන්ගේ අකමැත්ත ප්‍රකාශ වූ බවත් අනාවරණය විය.මෙහි වර්තමාන තත්ත්වය පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

අධිකාරිය මෙම නඩුවට විශාල මුදලක් වැය කරමින් පෞද්ගලික නීතිඥයින්ගේ සහාය ලබා ගෙන නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය නොපැතුවේ මන්දැයි කාරක සභාව විමසන ලදී.

නීතිඥ ගාස්තු ලෙස මෙලෙස මුදල් ගෙවීම නිසා අධිකාරිය තුළ විශාල මූල්‍ය ප්‍රශ්නයක් ඇති විය හැකි බව නිරීක්ෂණය විය.

අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකු විසින් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට එරෙහිව ආයතනයට විරුද්ධව පවරා ඇති නඩු 2ක් සම්බන්ධයෙන් පෞද්ගලික නීතිඥයින්ගේ සහාය ලබා ගැනීමට කටයුතු කිරීම.

අවසන් වරට ආයතනයේ සේවය කළ සමාගම් ලේකම් **(Company Secretary)** සමඟ නීතිපති රාජකාරිමය වශයෙන් සම්බන්ධවී වැඩ කටයුතු කිරීම නිසා එමඟින් ලබැඳියාව පිළිබඳ ගැටුමක් **(Conflict of Interest)** ඇතිවන බව දක්වමින් මෙම නඩු වෙනුවෙන් පෙනී සිටීම නීතිපති විසින් ප්‍රතික්ෂේප කළ බව නීති නිලධාරි පැවසීය.

**නිර්දේශ**

i. නඩු කටයුතු වෙනුවෙන් පුද්ගලික නීතිඥවරු යොදා ගැනීම පිළිබඳව වාර්තාවක් මාසයක් තුළ කාරක සභාව වෙත එවීම.

ii. රජයේ මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය බව.
iii. මෙවැනි තත්ත්වයක් ආයතනය තුළ ඉදිරියට ඇති නොවීමට වග බලා ගැනීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - සංචාරක අමාත්‍යංශය
සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>
මෙම තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීමේ වාර්තාවක් අමාත්‍යංශ ලේකම් විසින් 2022.01.10 දිනැතිව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**11.** <u>ඉඩම් ලේඛනය</u>
පවරා ගැනීම්, අත්පත් කරගැනීම හෝ රජයේ ප්‍රදාන ආකාරයෙන් අයිතිය හිමි වූ සියලු ඉඩම් ඇතුළත් වූ ඉඩම් රෙජිස්ටරයක් (ලේඛනය) අධිකාරිය සතුව නොමැතිවීම.

<u>නිර්දේශ</u>
මෙම ලේඛනය සැකසීම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - සංචාරක අමාත්‍යංශය
සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>
අදාළ ලේඛනය අමාත්‍යංශ ලේකම්ගේ ලිපි අංක **MT/IAI/1/4/COPE-SLTDA** හා 2022.08.29 දිනැති ලිපියෙන් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

**12.** <u>කැළිඩෝ වෙරළ උද්‍යාන</u>
**2013** වසරේදී පූර්ව ශක්‍යතා අධ්‍යනයකින් තොරව ආරම්භ කළ කැළිඩෝ වෙරළ උද්‍යාන ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී අතරමඟ නවතා තිබූ අතර, ඒ සඳහා ගෙවූ අත්තිකාරම් රු.19,990,021/- 2020 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මඟින් කපා හැරීමට කටයුතු කිරීම.

<u>නිර්දේශ</u>
මේ පිළිබඳව භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන කාරක සභාවට සහ විගණකාධිපති වෙත වාර්තා කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - සංචාරක අමාත්‍යංශය
සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

භාණ්ඩාගාර අනුමැතිය ලද පසුව වාර්තා කිරීමට කටයුතු කරන බව කාරක සභාවට දැනුම් දී ඇත.

**13. <u>අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන</u>**

අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන 4හි 2019 වර්ෂයේ එකතු අලාභය රු.27,003,697/- වූ අතර 2020 වර්ෂය සඳහා එකතු වූ අලාභය රු.46,016,794/- වූ අතර, ඉකුත් වර්ෂයට සාපේක්ෂව අලාභ වර්ධනය 70%ක් වීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

<u>**නිර්දේශ**</u>

මේ පිළිබඳව විශේෂ අධ්‍යයනයක් සිදු කර තීරණය කාරක සභාව වෙත වාර්තා කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

ප්‍රගතිය වාර්තා කර ඇත.

**14. <u>අධිකාරිය සතු තානායම්</u>**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් පවරන ලද තානායම් 37න් 2021.10.31 දින වන විට තානායම් 09ක් මාස 5 සිට මාස 52 දක්වා කාලයක් බදු දී නොතිබීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

හෙට්ටිපොළ තානායම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් තක්සේරු **(valuation)** වාර්තාව පැමිණි පසු බදු දිමට බලාපොරොත්තු වන බවත්, උලන්කුලම, ගල්ගමුව තානායම බදු දී ඇති අතර ඒ සම්බන්ධයෙන් යම් යම් ගැටළු සහගත තත්ත්වයක් ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

<u>**නිර්දේශ**</u>

මේ පිළිබඳව විශේෂ අධ්‍යයනයක් සිදු කර කාරක සභාව වෙත වාර්තා කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

ප්‍රගතිය වාර්තා කර ඇත. **(ඇමුණුම 07)**

**15. <u>මාර්ගගත ක්‍රමයෙන් නිවාඩු නිකේතන හෝ තානායම් වෙන්කරවා ගැනීම</u>**

නිවාඩු නිකේතන හෝ තානායම් කිසිවක කාමර සංචාරකයින්ට මාර්ගගත ක්‍රමයෙන් වෙන් කරවා ගැනීමේ පහසුකම් මේ දක්වා සකස් කර නොතිබීම.

<u>**නිර්දේශ**</u>

මෙම පහසුකම සැලසීමේ හැකියාව සොයා බලා කාරක සභාව වෙත වාර්තා කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

ප්‍රගතිය වාර්තා කර ඇත.

**16.** <u>**මදුරන්කුලියේ සංචාරක මධ්‍යස්ථානයක් සහ දූන්හිද ඇල්ල මාර්ගයේ වෙළඳ කුටි 20ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය**</u>

**2016, 2017** වසර වල මදුරන්කුලියේ සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරිම සහ දූන්හිද ඇල්ල මාර්ගයේ වෙළඳ කුටි 20ක් ඉදිකිරීමේ ව්‍යාපෘති අතරමග නවතා දැමීම.

<u>**නිර්දේශ**</u>

මෙහි ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

ප්‍රගතිය වාර්තා කර ඇත.

**17.** <u>**භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මුදල් ආයෝජනය**</u>

රුපියල් බිලියන 1ක මුදලක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම.

භාණ්ඩාගාර නියෝජිත ප්‍රකාශ කළේ ආයතනයේ එදිනෙදා කටයුතු සඳහා භාවිතයට ගැනීමට **Call Deposit** එකක මෙම මුදල් තැන්පත් කර තිබූ බවත්, රජයේ විගණනයෙන් එය ස්ථාවර තැන්පතුවක තැන්පත් කිරීමට උපදෙස් දුන් නිසා ඒ අනුව කටයුතු කළ බවත්ය.

<u>**නිර්දේශ**</u>

භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර මෙම ආයෝජනය සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ප්‍රගතිය වාර්තා කර ඇත.

**18. <u>විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම</u>**

ගනුදෙනු කිහිපයක් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම ගනුදෙනුවල නිවැරදිභාවය හා පැවැත්ම තහවුරු කර ගත නොහැකි වීම.

මේවා වසර ගණනාවකට පෙර ගනුදෙනු බවත්, එය නිවැරදි කර ගැනීමට භාණ්ඩාගාරයට යොමු කර ඇති බවත්, කාරක සභාවට අනාවරණය විය.

<u>නිර්දේශ</u>

මේ පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කිරීමට කටයුතු කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සංචාරක අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ප්‍රගතිය වාර්තා කර ඇත.

**19. <u>විදේශයන්හි කාර්යාල කුලී වෙනුවෙන් තැන්පත් කළ ලැබිය යුතු තැන්පතු නිරවුල් නොකිරීම</u>**

1989 සිට 2007 වර්ෂය දක්වා විදේශයන්හි කාර්යාල කුලී වෙනුවෙන් තැන්පත් කරන ලද රු.3,661,031/-ක ලැබිය යුතු තැන්පතු 2021 වර්ෂය අවසානය දක්වා නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබීම සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.

මේ සඳහා සාක්ෂි නොමැති බැවින් ඉදිරියේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට නියමිත බව කාරක සභාවට අනාවරණය විය.

**20. <u>Digital Nomads</u>**

අප රටේ සංචාරක ක්ෂේත්‍රය තුළ ආදායම කොවිඩ් වසංගත තත්ත්වයෙන් පසුව පහළ බැස ඇති බවත්, ඒ සඳහා ලොව තුළ **digital nomads** නම් සංකල්පය විලක්පයක් ලෙස භාවිතා කරන බවත්, එම සංකල්පය මෙරට ක්‍රියාත්මක කිරීම සඳහා මෙතක් ගත් ක්‍රියාමාර්ග හා සැලසුම් කවරේදැයි කාරක සභාව ප්‍රශ්න කළාය.

ඒ සඳහා මේ වනවිට කැබිනට් අනුමැතිය ලබා ගත් බවත්, ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නිර්ණායක ගැනීමට අවශ්‍ය බවත්, ඒ සඳහා අවශ්‍ය නිර්ණායක සමඟ යෝජනාවක් කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.

<u>**නිර්දේශ**</u>
සංචාරක ව්‍යාපාරයේ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු දියුණු කිරීමට කටයුතු කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>
ලේකම් - සංචාරක අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>
ප්‍රගතිය වාර්තා කර ඇත. **(ඇමුණුම 08)**

**21.** <u>**හෝටල් පාසලේ වෘත්තීය වැඩසටහන් වැඩි දයුණු කිරීම**</u>
හෝටල් පාසල උපාධි ප්‍රදානය කරන ආයතනයක් බැවින් මීට වඩා එහි කටයුතු වැඩි දියුණු කිරීම සඳහා **public private partnership** වෙත අවධානය යොමු නොකිරීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

හෝටල් පාසල තුළින් බිහි විය යුත්තේ සංචාරක ක්ෂේත්‍රයේ වෘත්තීය මට්ටමෙන් කටයුතු කළ හැකි වෘත්තිකයන් බවත්, ඒ සඳහා ක්ෂේත්‍රයට අවශ්‍ය ආකාරයට හෝටල් පාසල තුළ අදාළ වැඩසටහන් පෙළ ගස්වා ගත යුතු බවත් කාරක සභාව තවදුරටත් පැවසීය.

<u>**නිර්දේශ**</u>
ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග හැකි ඉක්මනින් ගැනීමට කටයුතු කිරීම.

<u>**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>
ලේකම් - සංචාරක අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>
ප්‍රගතිය වාර්තා කර ඇත.

## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

*(අධ්‍යාපන අමාත්‍යාංශය සහ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය)*

**විමර්ශනය කරන ලද දිනය: 2021.12.02**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

**01. කාර්ය සාධනය**

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ප්‍රාදේශීය කාර්යාල සියල්ලම පාහේ දිවයිනේ දකුණු ප්‍රදේශයේ පිහිටා තිබීම හා එය දිවයිනේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවලට ව්‍යාප්ත කර නොතිබීම සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු වූ අතර දිවයින පුරා සිටින සියලුම ජාතීන්ට වෘත්තීය පුහුණුව සහ උසස් අධ්‍යාපනය ලබා ගැනීමට සාධාරණ අවස්ථා ලබා දීමේ වැදගත්කම අවධාරණය කරන ලදී.

යුද්ධය නිමාවට පත්වීමෙන් පසු යාපනය ප්‍රදේශයේ නව ප්‍රාදේශීය කාර්යාලයක් පිහිටුවීමට උත්සාහ කළද එය සාර්ථක නොවූ බවත්, මේ වන විට රටේ තත්ත්වය සහ වාතාවරණය වෙනස් වී ඇති නිසා ඉදිරි වසර පහ සඳහා මෙම කරුණ තම ආයතනික සැලැස්මට එකතු කර ඒ අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවත් ආයතනයේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙහිදී සඳහන් කරන ලදී.

**නිර්දේශ**

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ප්‍රාදේශීය කාර්යාල දිවයින පුරා ව්‍යාප්ත කිරීම සම්බන්ධව අවධානය යොමු කර ඒ සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය විසින් උතුරු පළාතේ ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් පිහිටුවීමට ශක්‍යතා අධ්‍යයනයක් පැවැත්වීමට තීරණය කර ඇති බවත්, එම ශක්‍යතා අධ්‍යයනය නිරීක්ෂණය කිරීමෙන් පසුව ඉදිරි කටයුතු ආරම්භ කිරීමට යෝජිත බවත් නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ ලිපි අංක **MSVRI/IA(SV)/03/04(2021)** හා 2022.003.04 දිනැති ලිපියෙන් කාරක සභාව වෙත දන්වා ඇත.

**02. වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM) 2014 වසරේ සිට සිය වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොමැති බව සටහන් විය.

2014 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් 2018.08.08 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණද එය සකස් කර නොමැති අතර ලැබුණු උපදෙස් අනුව එය සකස් කර නොමැති බව නිපුණතා සංවර්ධන, වෘත්තීය පුහුණු පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා සඳහන් කළේය. 2021.04.21 දින, එම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතී.

2015, 2016, 2017 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මේ වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත්, 2018 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා වන සංදේශය මේ වනවිට කෙටුම්පත් කරමින් පවතින බවත් ප්‍රධාන විධායක නිලධාරී විසින් වැඩිදුරටත් සඳහන් කළේය.

<u>නිර්දේශ</u>

2015, 2016 සහ 2017 වර්ෂ සඳහා පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සති දෙකක් ඇතුළත අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, 2018, 2019 සහ 2020 වසර සඳහා වන වාර්ෂික වාර්තා කඩිනමින් ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙසත් කමිටුව ප්‍රධාන විධායක නිලධාරීවරයාට නියෝග කළේය.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. වාර්ෂික වාර්තාව - 2014

අවස්ථා කීපයක දී අමාත්‍යාංශ විෂය පථය වෙනස් වීම නිසා මෙම වාර්තාව නියමිත පරිදි පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නොහැකි වූ බවත් මේ වන විට එම කටයුතු සිදු කෙරෙමින් පවතින බව කාරක සභාවට වාර්තා කර ඇත.

ii. වාර්ෂික වාර්තා - 2015, 2016 සහ 2017

අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තු සභානායක කාර්යාලයට භාර දී ඇති බව වාර්තා කර ඇත.

iii. වාර්ෂික වාර්තාව - 2018

වර්ෂයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය 2022.01.04 දින අමාත්‍ය මණ්ඩලය වෙත යවා ඇති බව වාර්තා කර ඇත.

iv. වාර්ෂික වාර්තාව - 2019

අදාළ වාර්තාව අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව වාර්තා කර ඇත.

v. වාර්ෂික වාර්තාව - 2020

මේ වන විට අදාළ වාර්තාවේ කෙටුම්පත අවසන් කර ඇති බව වාර්තා කර ඇත.

**03. <u>කාර්ය මණ්ඩල තොරතුරු</u>**

ජ්‍යෙෂ්ඨ ශ්‍රේණියේ අතිරික්ත සේවක සංඛ්‍යාව නවයක් (9) සහ පුරප්පාඩු හතක් (07) පවතින බව කමිටුව නිරීක්ෂණය කළේය.

අමතර කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සිදු කර ඇත්තේ විෂය පථය පුළුල් කිරීම සහ ඊට අදාළ අනෙකුත් කටයුතු හේතුවෙන් කොන්ත්‍රාත් පදනම මත පමණක් බව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙහිදී ප්‍රකාශ කරන ලදී.

<u>නිර්දේශ</u>

i. සියලුම බඳවා ගැනීම් විධිමත් බඳවා ගැනීමේ පටිපාටියකට අනුව සිදු කිරීම.
ii. කාර්ය මණ්ඩලය තවදුරටත් අවශ්‍ය නම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.
iii. කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට වහාම කටයුතු කිරීම සහ ප්‍රගතිය මාස 03ක් ඇතුළත කාරක සභාවට වාර්තා කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ආයතනයේ කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට හා කාර්ය මණ්ඩලය වැඩි කිරීමට අදාළව අනුමැතිය ලබා ගැනීම සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරන බව කාරක සභාවට වාර්තා කර ඇත.

**04. <u>2014.11.04 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ රැස්වීම - 2.2.1 ඡේදය</u>**

පාලක මණ්ඩලයේ අනුමැතිය පමණක් සහිතව රු.111,977/- ක මුදලක් ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කර ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළ අතර මේ ආකාරයේ ගැටළු නිසි ක්‍රියා පටිපාටියට අනුකූලව සහ මුදල් අමාත්‍යාංශයේ අවසාන අනුමතිය යටතේ සිදු කිරීම වඩාත් යෝග්‍ය බව කාරක සභාවේ අදහස විය.

<u>නිර්දේශ</u>

ඉහත සඳහන් රු. 111,977/-ක මුදල ගිණුම්වලින් කපා හැරීම සම්බන්ධයෙන් අදාළ ලිපි ලේඛන මුදල් අමාත්‍යාංශය වෙත යවා නිවැරදි කර, ප්‍රගතිය මාස තුනක් ඇතුළත කාරක සභාවට සහ විගණකාධිපති වෙත වාර්තා කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය
සභාපති - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇත.

**<u>2014 සිට 2019 දක්වා විගණකාධිපතිවරයාගේ වාර්තාවල මතු වූ කරුණු</u>**

## 05. <u>NVQ සහතිකය ලබා ගැනීම</u>

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය විසින් 70කට ආසන්න පාඨමාලා සංඛ්‍යාවක ප්‍රතීතනය සඳහා අයදුම් කළද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සහතික ලබාගෙන ඇත්තේ පාඨමාලා 03කට පමණක් බව කාරක සභාව නිරීක්ෂණය කළේය.

මෙහිදී අමාත්‍යාංශ ලේකම්ගේ අදහස වූයේ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය විසින් පවත්වනු ලබන ඩිප්ලෝමා පාඨමාලාවල අන්තර්ගතය, ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රමිතීන් සමඟ නොගැලපීමක් පවතින බව යි.

**<u>නිර්දේශ</u>**

i. අදාළ පාඨමාලා සඳහා NVQ සහතිකය ලබාදීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.

ii. ආයතනයේ අරමුණු සහ කාර්යයන් විධිමත් කිරීම සඳහා පහත නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් රැස්වීමක් පැවැත්වීමට කටයුතු කර මාස 02ක කාලයක් ඇතුළත ප්‍රගතිය කාරක සභාවට වාර්තා කිරීමට කටයුතු කිරීම.

- අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්
- නිපුණතා සංවර්ධන, වෘත්තීය පුහුණු, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති
- ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයෙහි සභාපති
- ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයෙහි අධ්‍යක්ෂ ජනරාල් සහ
- ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනයෙහි (NSBM හරිත සරසවිය) උපකුලපති

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇත.

## 06. <u>විද්‍යා මාවතේ ඉඩමේ නීත්‍යානුකූල අයිතිය</u>

කොළඹ 07, විද්‍යා මාවතේ අංක 120/5 දරන ස්ථානයේ පිහිටි ඉඩම නොමිලේ ප්‍රදානයක් ලෙස ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයට පැවරීමට අමාත්‍ය මණ්ඩලය

අනුමැතිය ලබා දී ඇතත් මේ දක්වා එය නීත්‍යානුකූලව එම ආයතනයට ලැබී නොමැති බව කමිටුව නිරීක්ෂණය කළේය.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණ ද 1971 වසරේ සිට බදු ගෙවීමට අදාළ ලිපි ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට නොහැකි වූ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අදාළ අනුමැතිය නොලැබුණු බව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහන් කරන ලදී.

**<u>නිර්දේශ</u>**

එකී ඉඩමේ සහ පරිශ්‍රයේ නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය ලේඛන ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ලිඛිතව යොමු කිරීම සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අවශ්‍ය නම් ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇත.

**07.** **<u>ගාල්ල ප්‍රදේශයේ පිහිටි ඉඩමේ නීත්‍යානුකූල අයිතිය</u>**

ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමෙන් තොරව ගාල්ල නගරයේ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 321කට අධික මුදලක් වැය කර ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිළිබඳව කාරක සභාව විසින් විමසන ලදී.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් යැයි සැලකෙන එම ඉඩමේ අයිතිය පිළිබඳ ගැටලුවක් පැවති බවත්, ඒ හේතුවෙන් අයිතිය යළි පවරා ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වූ බවත් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාව හමුවේ පවසන ලදී.

**<u>නිර්දේශ</u>**

අදාළ ආයතන සහ අමාත්‍යාංශ සමඟ සහයෝගයෙන් අභ්‍යන්තර යාන්ත්‍රණයක් අනුගමනය කරමින් මෙම ගැටලුව නිරාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ ප්‍රගතිය කාරක සභාවට වාර්තා කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය</u>**

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ගාල්ල කාර්යාලය පවත්වාගෙන යන ගාල්ල පෙට්ටිගලවත්ත ඉඩමේ අයිතිය සම්බන්ධව වාර්තාවක් ලබා දීමට අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ගාල්ල දිස්ත්‍රික් ලේකම් වෙත නියම කර ඇතත් එම වාර්තාව මෙතෙක් ලබා දී නොමැති බැවින්, එම වාර්තාව ලබා දෙන ලෙස සඳහන් කරමින් ගාල්ල දිස්ත්‍රික් ලේකම් වෙත නැවත දැනුම් දී ඇති බවත් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

**08.** **<u>පාරිතෝෂික ගෙවීම</u>**

ආදායමෙන් 11%ක් සහ මෙහෙයුම් ලාභයෙන් 5%ක් ලෙස ගණනය කිරීම හේතුවෙන් ලැබෙන ආදායම මත දිරි දීමනාව දෙවරක් ගණනය වී ඇති බව කාරක සභාව විසින් නිරීක්ෂණය කළේය.

**<u>නිර්දේශ</u>**

විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ සමාලෝචනය කරමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණයෙන් පාරිතෝෂික ගෙවීමේ පදනම දැක්වෙන පිළිගත හැකි ක්‍රමවේදයක් සකස් කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය</u>**

ඉහත කරුණ සම්බන්ධව අමාත්‍යාංශය විසින් අදාළ කටයුතු සිදු කරමින් පවතින බවට කාරක සභාවට වාර්තා කර ඇත.

**09.** **<u>ලබා නොගත් විවේක නිවාඩු සඳහා ගෙවීම්</u>**

ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් හිමි නොවන බව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම් විසින් දන්වා තිබුණ ද වර්ෂ 2016-2019 කාල පරිච්ඡේදය සඳහා රු.24,334,948/-ක මුදලක්, ලබා නොගත් නිවාඩු වෙනුවෙන් ආයතනය විසින් ගෙවීම් කර ඇති බවට කාරක සභාව විසින් නිරීක්ෂණය කිරීම.

මෙහිදී ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සඳහන් කරන ලද්දේ, මේ ආකාරයේ දීමනාවක් ගෙවීමේ එකම අරමුණ සේවකයන්ට නිවාඩු ඉතිරි කර ගැනීමට දිරිගැන්වීම බවත්, 1980 දශකයේ මුල් භාගයේ සිට මෙම ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක වූ බවත් ය.

**<u>නිර්දේශ</u>**

මෙය විශේෂ අවස්ථාවක් ලෙස සලකමින් සහ එය පූර්වාදර්ශයක් ලෙස නොගනිමින්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ද සහයෝගීතාවය ඇතිව, ලබා නොගත් නිවාඩු සම්බන්ධයෙන් ගෙවීම් කිරීම සම්බන්ධයෙන් සුදුසු චක්‍රලේඛයක් කෙටුම්පත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය**

මේ පිළිබඳව අමාත්‍යාංශ මට්ටමේ අධ්‍යයනයක් මේ වන විට සිදු කෙරෙමින් පවතින අතර අමාත්‍යාංශ නිරීක්ෂණ සමඟ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට නියමිත බව කාරක සභාවට වාර්තා කර ඇත.

**වර්තමානයේ උද්ගත වී ඇති කරුණු**

**10. හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ සහ පුහුණු ආයතනයට සතු භූමිය අත්පත් කර ගැනීම**

මෙම අත්පත් කර ගැනීම සඳහා 2017.01.18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණ ද, 2021 ඔක්තෝබර් මාසය වන විටත් ඉහත සඳහන් ඉඩම් කොටස ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය විසින් අත්පත් කර ගෙන නොතිබූ බව කමිටුව නිරීක්ෂණය කළේය.

මෙහිදී ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් සඳහන් කරන ලද්දේ, හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ සහ පුහුණු ආයතනයේ අධ්‍යක්‍ෂ වෙත අමාත්‍යවරයා හරහා ඉල්ලීම් කිහිපයක් යොමු කළද ඔහු විසින් එම ඉඩමේ අයිතිය පැවරීම ප්‍රතික්ෂේප කළ බව යි.

**නිර්දේශ**

i. 2017.01.18 දිනැති CP/17/0018/720/001 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.
ii. එසේ ක්‍රියාකිරීමට නොහැකියාවක් ඇත්නම් ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලයට දැනුම් දෙන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දීම.
iii. මාස දෙකක් ඇතුළත එහි ප්‍රගතිය පිළිබඳව කාරක සභාවට වාර්තා කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය**

ප්‍රගතිය වාර්තා කර ඇත.

**11.** <u>ලාභාංශ නොගෙවීම</u>

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (NSBM) විසින් සිය මව් ආයතනය වන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයට (NIBM) ලාභාංශ ගෙවා ඇත්තේ 2013 වසරේ සිට 2016 වසර දක්වා පමණක් බවත්, 2020 වර්ෂය තුළ රු.468,968,670/-ක ශුද්ධ ලාභයක් උපයාගෙන ඇතත් ලාභාංශ ගෙවීමක් කර නොතිබීම සම්බන්ධයෙන් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

<u>නිර්දේශ</u>

i. මෙම කරුණ සම්බන්ධව අවසාන තීරණයකට එළඹීම
ii. මෙම ආයතන ද්විත්වයේ හැසිරීම සහ ව්‍යුහය අධීක්ෂණය කිරීමට විශේෂඥ මණ්ඩලයක් පත්කිරීම.

<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

ලේකම් - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති - ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය</u>

ප්‍රගතිය වාර්තා කර ඇත.

# හිඟුරාන සීනි කර්මාන්තායතනයේ මෙහෙයුම් කටයුතු සඳහා පිහිටුවන ලද සී/ස ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාව

**විමර්ශනය කරනු ලැබූ ආයතන:** සීමාසහිත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම (GOPL)
ගල්ඔය හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම (GOHL)

**විමර්ශනය කරන ලද දිනය:** 2021.12.06

**<u>සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු</u>**

## 1. සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සහ ගල්ඔය හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම ආරම්භ කිරීම

දේශීය සීනි කර්මාන්තය නඟා සිටුවීමේ අරමුණින් 1960 දශකයේ දී ආරම්භ කරන ලද හිඟුරාන සීනි කර්මාන්ත සමාගම (HSIL) 1993 දී පෞද්ගලීකරණය කරන ලද නමුත්, එය සාර්ථක නොවීම නිසා වර්ෂ 1997 දී එය නැවත රජයට පවරාගෙන එහි නිෂ්පාදන කටයුතු ආරම්භ කළ ද එම වසරේ දීම නිෂ්පාදන කටයුතු නතර කිරීමට සිදු ව තිබිණ.

සේවක පිරිස ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ පදනම මත වර්ෂ 2000-2001 කාලය තුළ දී විශ්‍රාම ගැන්වීමට කටයුතු කර තිබූ අතර 2006 වසරේ දී කර්මාන්තායතනය ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ කර තිබුණි. පෞද්ගලික සමාගම් වන බ්‍රවුන්ස් සහ සමාගම (Browns) සහ ලංකා ඔරික්ස් ලීසිං සමාගම (LOLC) සමඟ එක්ව පිහිටුවාගන්නා ලද සමාගමක් හරහා හිඟුරාන සීනි කර්මාන්තායතනයෙහි කළමනාකාරීත්වය පුනර්ජීවනය කිරීමට සහ ප්‍රතිව්‍යුහගත කිරීමට 2006 වසරේ දී එවකට රජය කැබිනට් අනුමැතිය ලබා ගත්තේය.

ඒ සඳහා 2006.10.11 දින පිහිටුවන ලද පුද්ගලික සමාගමක මෙහෙයුම් කළමනාකරණය යටතේ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයේ ව්‍යාපාරයක් (Public Private Partnership - PPP) ලෙස, පසුව එය ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම (GOPL) නමින් සංස්ථාපිත විය.

**<u>රජයේ සෘජු සහභාගීත්වය ඇතිව ගල්ඔය වැවිලි (GOPL) රාජ්‍ය සමාගම පිහිටුවීම</u>**

2009 වර්ෂයේ දී ශ්‍රී ලංකා රජය සමඟ ඇති කර ගත් ගිවිසුමෙහි පහත සඳහන් කරුණු මූලිකව ඇතුළත් වී තිබුණි.

- ගල්ඔය වැවිලි සමාගමේ කොටස් බහුතරය වන 51%ක අයිතිය රජය වෙත ලබා ගැනීම සහ ඉතිරි 49%ක කොටස Browns & Company සහ LOLC සමාගම වෙත පැවරීම.

- ගල්ඔය වැවිලි සමාගමේ කළමනාකරණය, කළමනාකරණ ගිවිසුමක් මඟින් වසර 10ක් සඳහා එහි කළමනාකරන සමාගමට පවරා ඇත.
- ගල්ඔය වැවිලි සමාගම වෙත පවරනු ලබන රජයේ චංචල දේපලවල, ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද වර්තමාන වෙළඳ වටිනාකම සහ බදු පදනම මත ගල්ඔය වැවිලි සමාගම වෙත ලබා දෙනු ලබන රජයේ දේපළ වල අවුරුදු 30 සඳහා ගණනය කරනු ලබන බදු මුදලේ ශුද්ධ වර්තමාන වටිනාකම, රජයේ 51%ක කොටස් මුදල වශයෙන් යෙදවීම.
- GOPL හි අධ්‍යක්ෂ මණ්ඩලය රජය විසින් පත් කරන ලද සභාපතිවරයාගෙන්, රජයේ නියෝජිතයින් 05 දෙනෙකුගෙන් සහ Browns & Company සහ LOLC හි නියෝජිතයින් 04 දෙනෙකුගෙන් සමන්විත වේ.
- ගල්ඔය වැවිලි සමාගමේ බදු පසු ලාභයෙන් 2%ක් කළමනාකරණ ගාස්තු වශයෙන් කළමනාකරණ සමාගමට ගෙවිය යුතු වීම.

**02. <u>GOPL හි මූලික අරමුදල්</u>**

2009.03.18 දිනැති කැබිනට් තීරණයට අනුව;

- කොටස් හිමියන්ගේ ගිවිසුම නිසි පරිදි ක්‍රියාත්මක කිරීම.
- කළමනාකරණ ගිවිසුම ක්‍රියාත්මක කිරීම.
- හිඟුරානේ සීනි සමාගම සතු හිඟුරානේ පිහිටි නිෂ්පාදනාගාර, කාර්යාලය ඇතුලු අනෙකුත් ගොඩනැගිලි පිහිටි හෙක්ටයාර් 277ක පමණ ඉඩම අවු.30ක කාලයක් සඳහා ගල්ඔය වැවිලි සමාගමට බදු දීම.
- ගල්ඔය වැවිලි සමාගම වෙත පවරනු ලබන චංචල දේපලවල, රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද වර්තමාන වෙළඳ වටිනාකම වන රු. මිලියන 222ක මුදල සහ බදු පදනම මත ගල්ඔය වැවිලි සමාගම වෙත ලබා දෙනු ලබන හිඟරාන සීනි සමාගම සතු නිශ්චල දේපලවල අවු. 30ක් සඳහා ගණනය කරන ලද බදු මුදලේ ශුද්ධ වර්තමාන වටිනාකම වන රු. මිලියන 516ක මුදල රජයේ කොටස වූ 51%ක සඳහා යෙදවීම සහ
- 51%ක රජයේ දායකත්වය සහ ඉතිරි 49%ක දායකත්වය වන රු. මිලියන 495ක මුදල Browns සහ LOLC සමාගම් විසින් මුදලින් 2009.08.28 දින ගිවිසුමකට එළඹ තිබීම සම්බන්ධයෙනුත් කාරක සභාවේ අවධානය යොමු විය.

ඊට පිළිතුරු දෙමින් GOPL හි අධ්‍යක්ෂවරයෙකු ප්‍රකාශ කළේ,

- 2009 වසරේ දී සංස්ථාපිත වූ GOPL සමාගම, LOLC සහ Browns & Co. සතු කොටස් 49% ක් සහ ශ්‍රී ලංකා රජය සතු කොටස් 51% ක එකතුවෙන් ආරම්භයේදී පිහිටුවනු ලැබූ බව,
- 2006 වසරේ දී හිඟුරාන සීනි කර්මාන්තායතනය ප්‍රතිව්‍යුහගත කිරීම සහ එහි වත්කම් තක්සේරු කිරීමේ ප්‍රමාදය හේතුවෙන් නීතිපතිවරයා විසින් එකී ගිවිසුම කෙටුම්පත් කිරීම තවදුරටත් ප්‍රමාද වූ බව සහ
- එහි ප්‍රතිඵලයක් ලෙස නීතිපතිවරයා එම තත්ත්වයන් තම වාර්තාවේ සඳහන් කර නොතිබුණද, 2009 වසරේ කොටස් හිමියන්ගේ ගිවිසුම අනුමත කිරීමට පෙර GOPL පිහිටුවීම සඳහා LOLC සහ Browns & Co. වෙත අරමුදල් ඇරීමට සිදු වූ බව.

මෙහිදී වැවිලි අමාත්‍යාංශයේ ලේකම් විසින් පෙන්වා දුන්නේ කොටස් හිමියන්ගේ ගිවිසුමේ නියමයන්ට අනුකූලව පුද්ගලික කොටස්වලින් 49% ක් මුදලින් ආයෝජනය කළ යුතු බවත් කොටස් හිමියන්ගේ ගිවිසුම අනුමත කිරීමට පෙර අරමුදල් ගැන සඳහනක් නොතිබූ බවත්ය.

මෙම කරුණ සම්බන්ධව අදහස් දක්වමින් විගණකාධිපති විසින් සඳහන්කරන ලද්දේ,

- 2016 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයෙන් GOPL විගණනය කිරීමේ බලය තමාට පැවරුණු බවත්,
- GOPL සංස්ථාගත කිරීම 2009 දී සිදු වූ නිසා 2016 ට පෙර GOPL විගණනය පෞද්ගලික ආයතනයක් විසින් සිදු කරනු ඇති බවත්

කාරක සභාව GOPL පිහිටුවීමට අදාළ අතීත තත්ත්වයන් ද සලකා බැලූ අතර Browns & Co. සහ LOLC විසින් සපයන ලද මූලික අරමුදල් GOHL හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පොලී සමඟ ගෙවිය යුතු ණයක් ලෙස සැලකීමට අනුමත කර ඇති බව ද සඳහන් කළේය.

GOPL හි අධ්‍යක්ෂවරයෙකු විසින් මෙහිදී පැහැදිලි කරන ලද්දේ 2006 - 2009 කාලය තුළ LOLC සහ Browns & Co. විසින් දළ වශයෙන් රු. GOPL හි රු. මිලියන 477 ක් ආයෝජනය කර ඇති බවත් එම මුදල වෙනුවෙන් පොලිය ලෙස රු. මිලියන 312 ක් එම සමාගම් දෙකට ගෙවිය යුතු වන අතර GOHL සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් එය අනුමත කර ඇති බවත්, 2007 - 2009 කාලය තුළ දේශීය ණය පොලී අනුපාත ඉහළ මට්ටමක පැවති බවත්, වෙනත් කිසිදු පෞද්ගලික හෝ රාජ්‍ය ආයතනයක් මූල්‍ය ආධාර කිරීමට අකමැති බවත්ය.

**03.** **<u>ණය මූල්‍යකරණය</u>**

GOPL විසින් රු. මිලියන 440 ක ණය මුදල සඳහා රු. 2014 වසරේ රු. මිලියන 230 ක් ගෙවීම සම්බන්ධව කාරක සභාව විසින් විමසන ලදී.

GOPL හි අධ්‍යක්ෂවරයෙකු පැහැදිලි කළේ 2014 වන විට රු. මිලියන 293, රු. මිලියන 157 ක් සහ රු. මිලියන 217 ක් සඳහා පොලිය ගණනය කර මුළු මුදල ගෙවා තිබුණේ රු. මිලියන 293ක් ලෙස බවයි.

2009 සිට 2014 දක්වා කාලය තුළ Browns & Co. සහ LOLC විසින් ලබාගත් ණය සඳහා ගෙවන ලද ශුද්ධ පොලී මුදල රු. මිලියන 440ක් වූ අතර Browns & Co. සහ LOLC වෙත ගෙවූ පොලිය පමණක් පිළිවෙලින් රු. බිලියන 1 ක් සහ රු. 2010 - 2020 කාලසීමාව සඳහා රුපියල් මිලියන 768 (මුළු මුදල රුපියල් බිලියන 1.7) ක් වූ බවත්, GOPL හි මෙහෙයුම් සඳහා බ්‍රවුන්ස් සහ සමාගම සහ LOLC විසින් එතෙක් ලබාගෙන ඇති ණය ප්‍රමාණය පිළිවෙලින් රු. මිලියන 335 ක් සහ රු. මිලියන 338ක් වූ බවත් මෙහිදී අනාවරණය විය. තවද, GOPL හි අධ්‍යක්ෂවරයෙකු මෙහිදී පැහැදිලි කළේ එවැනි ණය ප්‍රමාණය දළ වශයෙන් රු. බිලියන 9ක් බවයි.

මෙම ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය බැංකු පසුගිය කාලයේ ණය ලබාදීම ප්‍රතික්ෂේප කළ බවත්, ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ පෞද්ගලික පාර්ශ්වයන්ට පෞද්ගලික ණය දෙන ආයතන වෙත යොමුවීමට සිදුවූ බවත් කාරක සභාවේ අවධානයට ලක් විය.

GOPL ආරම්භයේදී පැවති තත්ත්වයට සාපේක්ෂව එහි වත්මන් කාර්ය සාධනය ද කාරක සභාව විසින් ඇගයීමට ලක් කළ අතර සමාගම පසුගිය වසර දක්වා ලාභ නොලැබූ බව ද පෙන්වා දුන්නේය.

මෙහිදී GOPL හි අධ්‍යක්ෂවරයෙකු අදහස් දක්වමින් පවසන ලද්දේ, 2021 ඔක්තෝබර් වන විට GOPL හි ශුද්ධ ලාභය රු. බිලියන 1 ක් වූ අතර 2020 - 2021 මුදල් වර්ෂය සඳහා ලාභය රු. මිලියන 749 ක් සහ ණය සැකසීමෙන් පසු රු. මිලියන 49 ක් වූ අතර මෙම රැස්වීම පවත්වන දින වන විටසමාගමේ ණය ප්‍රමාණය 16% පොලියට රු. මිලියන 9ක් බවයි.

කාරක සභාව නිරීක්ෂණය කළ පරිදි බොහෝ දුරට පුද්ගලික පාර්ශ්ව දෙකට අනුබද්ධ බැංකු කිහිපයකින් සහ අනුබද්ධ මූල්‍ය සමාගම් කිහිපයකින් ණය ලබාගෙන ඇති අතර එය දළ වශයෙන් රු. මිලියන 13.7 කි.

**<u>නිර්දේශ</u>**

GOPL හි කළමනාකාරිත්වය GOHL විසින් හසුරුවන බවට කාරක සභාව විසින් කරන ලද නිරීක්ෂණය සම්බන්ධ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - වැවිලි අමාත්‍යාංශය

ලේකම් - උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය</u>**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**04. <u>කළමනාකරණ සමාගම</u>**

GOHL හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

මණ්ඩලයේ සිටින රජයේ නියෝජිතයන් රජයේ මතය පිළිබිඹු කරන බවත් ඒ අනුව තීරණ ගන්නා බවත් එබැවින් මණ්ඩලයේ තීරණ සඳහා නිරන්තර කැබිනට් අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවක් නොමැති බවත් කාරක සභාව අනාවරණය කර ගන්නා ලදී.

මූල්‍ය කළමනාකරණය, වැටුප්, බඳවා ගැනීම් සහ සීනි මිල ගණන් තීරණය කිරීම ආදිය කොටස් හිමියන්ගේ ගිවිසුම යටතේ GOHL හි අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් නොවන බවත් නව ව්‍යාපෘති සහ සංවර්ධන යෝජනා, ප්‍රතිපත්තිමය තීරණ සහ ණය අනුමත කිරීමේ කටයුතුවල නියැලීම එම මණ්ඩලය විසින් සිදු කරනු ලබන බවත්, GOPL හි අධ්‍යක්ෂවරයෙකු විසින් පෙන්වා දෙනු ලැබීය.

GOPL හි අධ්‍යක්ෂවරයෙකු නොවන ක්‍රියාකාරී කළමනාකරුවෙකු, ප්‍රධාන කළමණාකරු තනතුරුට සහ ප්‍රධාන විධායක නිලධාරි තනතුර සඳහා පිළිගත් අවශ්‍යතා නොසලකා තෝරා ගෙන ඇති බැවින් GOPL හි ප්‍රධාන කළමනාකරු පත් කිරීම මතභේදයට තුඩු දී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා භාණ්ඩාගාරයට ලිඛිතව දැනුම් දී ඇති බවත් මෙහිදී තවදුරටත් අනාවරණය විය.

එවැනි අවස්ථාවන්හිදී අමාත්‍ය මට්ටමින් හෝ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව පාර්ශ්වයෙන් ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයක් නොමැතිකම පිළිබඳව කමිටුව අවධානය යොමු කළ අතර ඉදිරියේදී බේරුම්කරණ මණ්ඩලයක් ලෙස එවැනි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට යෝජනා කරන ලදී.

තවද, GOHL වෙත ලබා දී ඇති වසර 10 ක කොටස් හිමියන්ගේ ගිවිසුම දීර්ඝ කිරීමට රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය පැවරී තිබේද යන්න පිළිබඳව ද කාරන සභාවේ අවධානය යොමු විය.

**<u>නිර්දේශ</u>**

කළමනාකරණ සමාගමට (GOHL) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීමේ දී නියමිත සුදුසුකම් සැලකිල්ලට ගැනීමට කටයුතු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - වැවිලි අමාත්‍යාංශය

ලේකම් - උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය</u>**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**05. <u>අනාගත මූල්‍යකරණය සහ ලාභාංශ ගෙවීම</u>**

විගණකාධිපති විසින් පෙන්වා දුන් පරිදි GOPL හි වගකීම් වත්කම්වලට වඩා වැඩි බවත්, කොටස් හිමියන්ගේ ගිවිසුමට අනුව ලබාගත් ණයවලින් 51% පියවීමට රජය බැඳී සිටින බවත් පිළිබඳව කාරක සභාවේ අවධානයට ලක් වූ අතර විගණකාධිපත් විසින් වැඩිදුරටත් පැහැදිලි කරන ලද්දේ, බංකොලොත් වූ විට ඇපකරුවන් විසින් ණය පියවිය යුතු බවත්, ආරම්භයේදී GOPL සමාගමට සහය වීමට කැමැත්තෙන් ණය දෙන ආයතන නොතිබූ නිසා, LOLC සහ Browns & Co. ආයතනවලට ඔවුන්ගේ අනුබද්ධ මූල්‍ය ආයතන වෙතින් සහාය පැතීමට සිදු වූ බවත් ය.

අනාගතයේදී තම තීරණ සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තු අධීක්ෂණ කාරක සභා වෙත යොමුවීමට වඩා ඉදිරි ණය ලබා ගැනීමේදී ප්‍රවේශම් වන ලෙසත්, ඉදිරි සැලසුම්වල වගකීම භාර ගැනීමටත් සූදානම් වන ලෙසත් කාරක සභාව විසින් මෙහිදී අවධාරණය කරන ලදී.

**06. වර්ධනය සහ ලාභය**

GOPL ආරම්භයේ සිටම සෘණ ලාභයක් පෙන්නුම් කළ ද මෑතකාලීන අනපේක්ෂිත ලාභ පෙන්වීම පිළිබඳව කාරක සභාවේ අවධානයට යොමු විය.

GOPLහි අධ්‍යක්ෂවරයෙකු පැහැදිලි කළේ, විගණකාධිපති වාර්තාවෙන් සමාගමේ සෘණ ශේෂයක් අවධාරණය කළ ද, අවසානයේ දී වත්කම් වටිනාකම වැඩි වී ඇති බවත්, එතෙක් එය ඇගයීමට ලක් නොකළ අතර ඉදිරියේ දී එය ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බවත් ය.

**07. කළමනාකරණ උපායමාර්ග**

රජය විසින් අත්පත් කරගත් ඇතැම් පෞද්ගලික සමාගම් අසාර්ථක බවත් දූෂණය ප්‍රධාන ගැටලුවක් බවත් කාරක සභාව විසින් අවධාරණය කළ අතර GOPLහි අඛණ්ඩ පැවැත්ම සඳහා නිසි ක්‍රමවේදයක් අවශ්‍ය බව කාරක සභාවේ අදහස වූ අතර GOPL ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධව අමාත්‍යාංශය සතු ඉදිරි සැලසුම් පිළිබඳව අවධානය යොමු කරන ලදී.

රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව (Public Private Partnership) ව්‍යාපෘතියක් මඟින් රාජ්‍යයට, පෞද්ගලික පාර්ශ්වයට සහ මහජනතාවට ප්‍රතිලාභ ලැබිය යුතු බව කාරක සභාව විසින් පෙන්වා දෙන ලද අතර GOPL හි කොටස් හිමියන්ගේ ගිවිසුම හෝ ව්‍යාපාර සැලැස්ම කිසිදු පාර්ශවයක් විසින් හොඳින් අධ්‍යයනය කර නොමැති බව ද කාරක සභාවට වැඩිදුරටත් අනාවරණය විය.

**නිර්දේශ**

i. නීතිපතිවරයාගේ වාර්තාව මත නිරීක්ෂණ පිළිබඳව සියලු පාර්ශ්ව සහභාගීත්වයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ද සහයෝගය සහිතව කළමණාකරන සමාගමට අදාළ ගැටලු සාකච්ඡා කර ඒවාට අමාත්‍යාංශ මට්ටමින් යෙදිය හැකි පිළියම් පිළිබඳ යෝජනා පිළිබඳ වාර්තාවක් මාස දෙකක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

ii. අනාගත මූල්‍ය තීරණ ගැනීම සඳහා වෘත්තිකයන්ගේ විශේෂඥ සහාය ලබා ගැනීම.

iii. පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර මාස 2 ක් ඇතුළත කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.

- රජය පිළිගත් පොදු ආයතනයක් ලෙස PPP හි නීතිමය රාමුව;
- PPP හි මූල්‍ය රාමුව සහ ලාභදායීතාවය තීරණය කිරීම සඳහා ගැටළු; හා
- PPP හි කළමනාකරණ සමාගම අඩුපාඩු හඳුනා ගැනීම සහ සමාලෝචනය සඳහා නිවැරදි කිරීම්.

iv. තවද, සමාගම් දෙකෙහිම සමාගම් ලේකම්වරයා එක් අයෙකු වීම මත කොටස් හිමියන්ගේ ගිවිසුමේ නියමයන් උල්ලංඝණය කරන බැවින්, අභිලාෂයන් අතර ගැටුම (Conflict of Interests) විසඳීමට කටයුතු කිරීම.

v. කොටස් හිමියන්ගේ ගිවිසුමේ වලංගුභාවය දීර්ඝ කිරීම නීත්‍යානුකූල ද නැද්ද යන්න පිළිබඳව තහවුරු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - වැවිලි අමාත්‍යාංශය

ලේකම් - උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය</u>**

ප්‍රගතිය වාර්තා කර නොමැත.

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

*(අධ්‍යාපන අමාත්‍යාංශය)*

**විමර්ශනය කරන ලද දිනය: 2021.12.08**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

**01. විශ්වවිද්‍යාල අධ්‍යාපනය කෙරෙහි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි කාර්යභාරය**

ජාතික විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් ඒවාහි අධ්‍යයන සහ පරිපාලනමය ඉදිරි දර්ශනයෙහි ස්වාධීනත්වය පිළිබඳව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි කාර්යභාරය පිළිබඳව කාරක සභාව අවධානය යොමු කරන ලදී.

මෙහිදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ,

- විශ්වවිද්‍යාල පනත යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිහිටුවා ඇති බවත්,
- සියලුම ජාතික විශ්වවිද්‍යාලවල අධ්‍යයන සහ පරිපාලන ක්‍රියාකාරකම් ඇතුලු සියළු ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියාමනය කර අධීක්ෂණය කරනු ලබන බවත්,
- විශ්වවිද්‍යාල මෙහෙයුම් කටයුතු කිරීමේ දී ඔවුන්ගේම ස්වාධීනත්වයක් සහිතව කටයුතු කළ හැකි බවත්,
- විශ්වවිද්‍යාලයේ උත්තරීතර මණ්ඩලය ලෙස සෙනෙට් සභාව විසින් ගනු ලබන තීරණ අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල කවුන්සිලයට යවනු ලබන බවත්,
- ඊට අමතරව අධ්‍යයන කාර්යයේ දී නව පීඨයක් හෝ නව පාඨමාලාවක් සැකසීමේදී විශ්වවිද්‍යාලවලට වැඩි ස්වාධීනත්වයක් ඇති බවත් ය.

විශ්වවිද්‍යාලවල අධ්‍යයන ප්‍රගතිය සොයා බැලීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ස්ථාවර කමිටුවක් හෝ අනු කමිටු තිබේද යන්න පිළිබඳවද කාරක සභාව විමසීම් කරන ලදී.
මෙහිදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

- විශ්වවිද්‍යාලවල විෂය පදනම් කර ගනිමින් ස්ථාවර කමිටු 22ක් තිබෙන බවත්,
- ඒවා නියෝජනය කරන්නේ අදාළ විශ්වවිද්‍යාලයේ අදාළ පීඨාධිපතිවරයා බවත්,
- විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි සාමාජිකයෙකු එවැනි ස්ථාවර කමිටුවක මුලසුන හොබවන බවත්,
- නව පාඨමාලා වැනි සියලුම කරුණු සම්බන්ධ අධ්‍යයන ගැටළු සෙනෙට් සභාවේ සහ කවුන්සිලයේ තත්ත්ව සහතික කිරීමේ ඒකකය විසින් පරීක්ෂා කරනු ලබන අතර, විධිමත් අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන බවත්,

**02.** **විශ්වවිද්‍යාල ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම**

ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම අනුව ශ්‍රී ලංකා රජයේ විශ්වවිද්‍යාලවලට ලැබී ඇති ස්ථාන පිළිබඳව ද කාරක සභාවේ අවධානය යොමු වූ අතර ලෝකයේ පළමු විශ්වවිද්‍යාල 2000 තුළ ඇතුළත් වන්නේ ලංකාවේ විශ්වවිද්‍යාල දෙකක් පමණක් වීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

මෙහිදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ, ලෝකයේ ශ්‍රේණිගත කිරීමේ ක්‍රම කිහිපයක් ඇති බවත්, සාමාන්‍යයෙන් ඒවා වෙබ්මැට්‍රික් ක්‍රමය හරහා ශ්‍රේණිගත කර ඇති බවත්, පසුගිය දශකය තුළ ඔවුන් ශ්‍රේණිගත කිරීම ගැන සැලකිලිමත් නොවූ බවත් ය. ඇත්ත වශයෙන්ම විදේශ රටවල යම් විශ්වවිද්‍යාලයක් සඳහා ඇති ඉල්ලුම එහි ශ්‍රේණිගත කිරීම මත රඳා පවතින නමුත්, ශ්‍රී ලංකාවේ සිසුන් මෙම ශ්‍රේණිගත කිරීම නොසලකා විශ්වවිද්‍යාල තෝරා ගන්නා බවත් මෙහිදී අනාවරණය විය.

විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම හෝ වෙනත් නිර්ණායක මත පදනම්ව සම්පත් වෙන් කරන්නේ කෙසේද යන්න පිළිබඳව කාරක සභාව විමසීම් සිදු කිරීමේ දී කොමිෂන් සභාවේ සභාපති විසින් සඳහන් කරන ලද්දේ,

- එක් එක් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව අනුව සම්පත් බෙදීයාම තීරණය වන බවත්,
- විශේෂයෙන් ශ්‍රේණිගත කිරීමේ දී එම විශ්වවිද්‍යාල ඉදිරියට ගෙනයාමට තීරණය වන බවත්,
- විශ්වවිද්‍යාල සඳහා දිරිගැන්වීම් පැකේජ ද ලබාදෙන බවත්,
- විශ්වවිද්‍යාලය පිහිටුවීමේ කාල සීමාව හෝ ප්‍රදේශය මත විශේෂ අවධානයක් යොමු නොකරන බවත් ය.

**03.** **උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික වාර්තා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි 2019 - 2023 කාලසීමාව සඳහා වූ උපායමාර්ගික සැලැස්ම, 2015 - 2021 කාලසීමාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සහ 2019 සහ 2020 වසර සඳහා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව ද කාරක සභාවේ අවධානය යොමු කරන ලදී

මෙහිදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ,

- 2020 දී අතිගරු ජනාධිපතිතුමා විසින් අධ්‍යාපනය සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කළ බවත්,
- එම කාර්ය සාධක බලකාය විසින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ බවත්,
- එමගින් උසස් අධ්‍යාපනය සඳහා වෙනම අනුකමිටුව පත් කළ බවත්,
- මෙම අනුකමිටුවේ නිරීක්ෂණ සමඟින් සියලුම විශ්වවිද්‍යාල උපකුලපතිවරු විසින් උසස් අධ්‍යාපනයේ අනාගත ගමන් මඟ පිළිබඳ මාර්ගෝපදේශ වාර්තාවක් ප්‍රකාශයට පත් කර තිබූ බවත්,
- එම වාර්තාව උපාය මාර්ග 9ක් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක 64ක් යටතේ සකස් කර ඇති බවත්,

- මෙහි ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) සෑම මාස හයකට වරක් සමාලෝචනය කරන බවත් ය.

**නිර්දේශ**

i. 2019 සහ 2020 වසර සඳහා වාර්ෂික වාර්තා නොපමාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

ii. උසස් අධ්‍යාපනයේ අනාගත ගමන් මඟ පිළිබඳ මාර්ගෝපදේශ වාර්තාව කාරක සභාවට සහ අදාළ අමාත්‍ය උපදේශක කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
සභාපති - විශ්වවිද්‍යාල කොමිෂන් සභාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

i. ඉහත නිර්දේශ අංක (i)ට අදාළව, 2019 වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව 2021.12.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බවත්, 2020 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2022.02.08 දින අමාත්‍යාංශ අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත්, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක HE/FIN/02/COPE-UGC Vol.1 හා 2022.03.31 දිනැති ලිපියෙන් කාරක සභාව වෙත වාර්තා කර ඇත.

ii. උසස් අධ්‍යාපනයේ අනාගත ගමන් මඟ පිළිබඳ මාර්ගෝපදේශ වාර්තාව, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ඉහත ලිපිය සමඟ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

## 04. වාර්ෂික ප්‍රතිපාදන වෙන් කිරීම හා නිදහස් කිරීම

වාර්ෂිකව මුදල් වෙන් කිරීම සහ එය විශ්වවිද්‍යාල අතර බෙදා හැරීමේ ක්‍රියාවලිය පිළිබඳව ද කාරක සභාවේ අවධානය යොමු විය. විශ්වවිද්‍යාලවල ප්‍රගති සමාලෝචනයට සහ වාර්ෂික ඇස්තමේන්තුවලට යටත්ව අරමුදල් ප්‍රතිපාදන සිදු කරන බවත්, මෙම ප්‍රතිපාදන UGC යටතේ ඇති ප්‍රාග්ධන ඇගයීම් කමිටුව විසින් තීරණය කරනු ලබන බවත්, මෙම ප්‍රතිපාදනය අවසානයේ මහා භාණ්ඩාගාරය විසින් අනුමත කළ යුතු බවත් AO පැහැදිලි කළේය. අයවැයෙන් දක්වා ඇති ජාතික සැලැස්ම සඳහා අමාත්‍යාංශය, UGC සහ අදාළ විශ්වවිද්‍යාල සමඟ එක්ව ක්‍රියාත්මක වන බව ආයතනයේ සභාපති විසින් වැඩිදුරටත් සඳහන් කළේය.

## 05. 2017 පෙබරවාරි 17 වන දින පැවති රැස්වීමේදී සාකච්ඡා කරන ලද කරුණු හා නිර්දේශ

**අවිධිමත් බඳවා ගැනීම්**

නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකර අනධ්‍යාන කාර්යමණ්ඩලයේ පහළ තනතුරු වෙනුවෙන් බඳවා ගැනීමේ ගැටලුව සම්බන්ධයෙන් කමිටුව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර පුවත්පත්වලින් විවෘතව අයදුම්පත් කැඳවීමෙන් මෙම බඳවා ගැනීම් සිදු කිරීම යෝග්‍ය බව කාරක සභාවේ මතය විය.

මෙහිදී කොමිෂන් සභා සභාපති විසින් ප්‍රකාශ කරන ලද්දේ,

- ➢ මෙම බඳවා ගැනීම් සිදු කර ඇත්තේ, 1996 නොවැම්බර් 15 වැනි දින අමාත්‍ය මණ්ඩල සංදේශයට සහ 1996 දෙසැම්බර් 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව බවත්,
- ➢ දීර්ඝ කාලයක සිට මේ අනුව බඳවා ගැනීම් සිදු කිරීමට පවතින බවත් ය.

**නිර්දේශ**

i. මාණ්ඩලික නොවන නිලධාරීන් බඳවා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කර අදාළ බඳවා ගැනීම් කිරීමට කටයුතු කිරීම තුළින් මෙම ගැටළුව නිවැරැදි කිරීමට කටයුතු කිරීම.

ii. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව බඳවා ගැනීමේ පටිපාටියක් (SOR) සකස් කිරීම මඟින් අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීම් විධිමත් කිරීමට කටයුතු කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යංශය

සභාපති - විශ්වවිද්‍යාල කොමිෂන් සභාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර ඇත.

**06. පරිගණක මිලදී ගැනීම**

2017 වසරේදී කොමිෂන් සභාවට පරිගණක 7ක් මිලදී ගැනීමේ ගැටලුව පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

**නිර්දේශ**

මෙම කරුණ සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා මාසයක් ඇතුළත, කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යංශය

සභාපති - විශ්වවිද්‍යාල කොමිෂන් සභාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

i. මෙම කරුණට අදාළ නිර්දේශිත සවිස්තර වාර්තාව අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්ගේ අංක HE/FIN/02/COPE-UGC Vol.1 හා 2022.01.13 දිනැති ලිපිය සමඟ කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

ii. මෙම කමිටු වාර්තාවේ සඳහන්, පරිගණක මිලදී ගැනීමේ ක්‍රියාවලියට අදාළ ඇගැයීම් සිදු කළ ආයතන, මිල ගණන් හා කුලියට ගැනීම නිසා රජයට සිදු වී ඇති අලාභය පහත දක්වා ඇත.

iii. ඉහත කමිටු වාර්තාවේ නිරීක්ෂණ **ඇමුණුම් අංක 09** ලෙස දක්වා ඇත.

වගු අංක 3: පරිගණක මිළදී ගැනීමේ ක්‍රියාවලියට අදාළ ඇගයීම් සිදුකල ආයතන, මිළ ගණන් හා කුලියට ගැනීම නිසා රජයට සිදු වී ඇති අලාභය

| අංකය | ලංසුකරුගේ නම | ඒකකයක් සඳහා ගෙවන ලද මුදල(රු.) | සම්පූර්ණ පරිගණක 4 සඳහා මුදල (රු.) | වගකීම් කාලය (අවු.) | පරිගණක කුලියට ගැනීම නිසා රජයට සිදූ වී ඇති පාඩුව | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| 01 | M/S Office Network (Pvt.) Ltd | 143,400.00 | 573,600.00 | 5 | **564,210.00** | මෙම ලංසුව ප්‍රසම්පාදන කමිටුව මගින් ප්‍රතික්ෂේප කර ඇත (ඇමුණුම 6) |
| 02 | M/S Network Information Technologies (Pvt.) Ltd(Option I) | 178,000.00 | 712,000.00 | 5 | **425,810.00** | - |
| 03 | M/S Network Information Technologies (Pvt.) Ltd(Option II) | 183,000.00 | 732,000.00 | 5 | **405,810.00** | - |
| 04 | M/S Visual Techno Solutions (Pvt.) Ltd | 189,500.00 | 758,000.00 | 5 | **379,810.00** | - |

**07.** <u>පරිගණක මෘදුකාංග</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රවේශ අංශය සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා විශ්වවිද්‍යාල තුනකට ගෙවිය යුතු අත්තිකාරම් මුදල් නොගෙවීම පිළිබඳව සහ Unicode Addition System සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යනායතනයෙහි දායකත්වය පිළිබඳව කමිටුවේ අවධානය යොමු විය.

**<u>නිර්දේශ</u>**

Unicode Addition System සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යනායතනය දායකවීම ප්‍රාග්ධනීකරණය කිරීමට අදාළ ලියකියවිලි ගැටලු කඩිනමින් විසඳීමට කටයුතු කිරීම.

**<u>නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

සභාපති - විශ්වවිද්‍යාල කොමිෂන් සභාව

**<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>**

ප්‍රගතිය වාර්තා කර ඇත.

**08.** **<u>යෝග්‍යතා පරීක්ෂණය හරහා සිසුන් බඳවා ගැනීම</u>**

ඉසෙඩ් ලකුණු ක්‍රමයට අමතරව යෝග්‍යතා පරීක්ෂණයක් මගින් වැඩසටහන් සහ පාඨමාලා 38ක් සඳහා විශ්වවිද්‍යාල 13 සහ උසස් අධ්‍යාපන ආයතනය වෙත විශේෂ සිසුන් බඳවා ගැනීමේ ගැටලුව පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු කරනු ලැබූ අතර, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝග්‍යතා පරීක්ෂණයක් දැනටමත් තීරණය කර ඇත්තේ ඉසෙඩ් ලකුණු ක්‍රමය හරහා බැවින් තවදුරටත් යෝග්‍යතා පරීක්ෂණයක් පැවැත්වීම සාධාරණ නොවන බව කාරක සභාව විසින් පුළුල් ලෙස සාකච්ඡා කරන ලදී.

මෙහිදී විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ සභාපති විසින් අදහස් දක්වන ලදී.

i. යෝග්‍යතා පරීක්ෂණයට මුහුණ දෙන අයදුම්කරු පළමුව විභාගය සමත් විය යුතු බව,
ii. ඉන් පසුව අපේක්ෂකයා ඉසෙඩ් අගය අනුව පෙළ ගැසෙන බව,
iii. යෝග්‍යතා පරීක්ෂණය පදනම් කරගත් පාඨමාලා සංඛ්‍යාව අඩු කිරීමට උපරිම උත්සාහයක් දැරීමට මේ වන විට කොමිෂන් සභාව පැහැදිලි තීරණයකට එළඹ ඇති බව,
iv. හැකියාව තිබේ නම් යෝග්‍යතා පරීක්ෂණය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට කොමිසම කැමැත්තෙන් සිටින බව.

මෙම කරුණ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අදහස් දැක්වීම පහත පරිදි වේ.

i. මින් ඉදිරියට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝග්‍යතා පරීක්ෂණයක් නොපැවැත්විය යුතු බවට උපකුලපතිවරුන් සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව (CVCD) තීරණය කර ඇති බව,
ii. මෙම තීරණය විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින්ද අනුමත කර ඇති බව.

කාරක සභාව විසින් ද මෙම යෝජනාව අනුමත කළ අතර, නවීන වෙනස්කම්වලට අනුගතවීම සහ වර්තමානයට අදාළ විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා නව විශ්වවිද්‍යාල පනතක අවශ්‍යතාව පිළිබඳව ද කමිටුව අවධාරණය කළේය.

**09.** **<u>උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්වය</u>**

පහත කරුණ පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

i. ආචාර්යවරුන් 15දෙනෙකු පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ලබාගෙන නියමිත කාලසීමාව තුළ පාඨමාලා සම්පූර්ණ නොකර තිබීම.
ii. කථිකාචාර්යවරුන් 12දෙනෙකු සඳහා 2017 වසරේ දී රු. මිලියන 34.3ක වටිනාකමින් යුත් පර්යේෂණ අරමුදලක් ලබා දී ඇති නමුත් පසුව ඔවුන් එම විශේෂිත පර්යේෂණවලට සහභාගී නොවී ඒවා ඉවත් කර ගෙන තිබීම.

**<u>නිර්දේශ</u>**

i. පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ලබාගෙන නියමිත කාලසීමාව තුළ පාඨමාලා සම්පූර්ණ නොකර අත්හැර දැමූ ආචාර්යවරුන් 15දෙනාට අදාළව එම නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අදාළ මුදල් අය කර ගැනීමට කටයුතු කිරීම.

ii. කථිකාචාර්යවරුන් 12දෙනෙකු සඳහා 2017 වසරේ දී ලබා දී තිබූ රු. මිලියන 34.3ක වටිනාකමින් යුත් පර්යේෂණ අරමුදල ඌන උපයෝජිත වීම සම්බන්ධව, එම නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීම.
iii. මාස දෙකක කාලයක් ඇතුළත ඉහත වාර්තා කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

සභාපති - විශ්වවිද්‍යාල කොමිෂන් සභාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

මෙම ආචාර්යවරුන්ට එරෙහිව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කර ඇති බවට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් මෙම කරුණ සම්බන්ධව ප්‍රගතිය වාර්තා කරමින් කාරක සභාවට දන්වා එවා ඇත.

**10. ස්ත්‍රී - පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය**

පහත සඳහන් කරුණු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

i. ස්ත්‍රී - පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයේ ක්‍රියාකාරිත්වය, එහි වියදම් සහ වර්තමාන ප්‍රගතිය .
ii. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විසින් සප්ත වාර්ෂික නිවාඩු ලබා, වලංගු හේතුවක් නොමැතිව මෙරටට නොපැමිණීම.

**නිර්දේශ**

i. ස්ත්‍රී - පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය පිළිඳ ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධ සවිස්තර වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.
ii. සප්ත වාර්ෂික නිවාඩු ලබා වලංගු හේතුවක් නොමැතිව මෙරටට නොපැමිණි ආචාර්යවරුන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.
iii. වලංගු හේතුවක් නොමැතිව සප්ත වාර්ෂික නිවාඩු ලබා මෙරටට නොපැමිණි ආචාර්යවරුන්ගේ නාම ලේඛනය මාසයක කාලයක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

සභාපති - විශ්වවිද්‍යාල කොමිෂන් සභාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

i. ඉහත නිර්දේශ අංක (i)ට අදාළ නිර්දේශිත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.
ii. ඉහත නිර්දේශ අංක (ii)ට අදාළව ප්‍රගතිය වාර්තා කර නොමැත.
iii. ඉහත නිර්දේශ අංක (iii)ට අදාළව ප්‍රගතිය වාර්තා කර නොමැත.

**11. උප කුලපතිවරුන් පත් කිරීම**

විශ්වවිද්‍යාල සඳහා උප කුලපතිවරුන් පත්කිරීමේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු කරන ලද අතර එය විශ්වවිද්‍යාල පනතට සහ අංක 03/2021 දිනැති චක්‍රලේඛට පටහැනිද යන්න පිළිබඳව කාරක සභාව විමසීම් කරන ලදී.

මෙම ප්‍රශ්නය ද්වි මාර්ග ප්‍රවේශයකින් විසඳිය යුතු බවත්, ප්‍රථමයෙන් කොමිෂන් සභාව ගැටලුව විසඳීමේ තාක්ෂණික ගැටලුවක් තිබේද යන්න පිළිබඳව අභ්‍යන්තරව සොයා බැලිය යුතු බවත් කමිටුවේ අදහස විය. දෙවනුව මෙම කාරණය සම්බන්ධයෙන් වහාම අභ්‍යන්තර සංවාදයක් ආරම්භ කිරීම සහ ඒ පිළිබඳව අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කිරීම සහ කොමිසමට පිළිගත් තේරීම් ක්‍රමයකට ළඟා විය හැකිය. ඇතැම් සභාවල ලේකම්වරු, හිටපු මන්ත්‍රීවරු වැනි අය සිටින බව ද කාරක සභාව කොමිසමේ අවධානයට යොමු කළ අතර එම ක්‍රියාවලිය නිවැරදි කළ යුතු බවට නිර්දේශ කළේය.

**නිර්දේශ**

i. උපකුලපති තනතුරට සුදුසු අයකු තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය වඩාත් විනිවිදභාවයෙන් හා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සකස් කිරීමට කටයුතු කිරීම.

ii. රාජ්‍යයේ ජාතික ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීම සහ අභ්‍යන්තර ස්වයං පාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය ආරක්ෂා කිරීම සඳහා පනතේ අදාළ කොටස සහ අදාළ චක්‍රලේඛය පරීක්ෂා කිරීම සඳහා වෙනම සැසියක් පැවැත්වීමට කටයුතු කිරීම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

සභාපති - විශ්වවිද්‍යාල කොමිෂන් සභාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර ඇත.

**12. විශ්වවිද්‍යාල කොමිෂන් සභාවෙහි අභියාචනා මණ්ඩල**

විශ්වවිද්‍යාල කොමිෂන් සභාව වෙත ලැබෙන අභියාචනා සහ පැමිණිලි සලකා බැලීම සඳහා වෙනම අංශයක් හෝ ඒකකයක් තිබේද යන්න පිළිබඳව කාරක සභාව විසින් විමසීම් කරන ලදී.

**නිර්දේශ**

විශ්වවිද්‍යාලය වෙත ලැබෙන පැමිණිලි සහ අභියාචනා පිළිබඳව යාවත්කාලීන කරන ලද ලේඛනයක් පවත්වාගෙන යාම.

**නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

සභාපති - විශ්වවිද්‍යාල කොමිෂන් සභාව

**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**

ප්‍රගතිය වාර්තා කර නැත.

**ඇමුණුම 01**

5. <u>අපනයන සැකසුම් කලාපවල පාරිසරික බලපෑම</u>

අපනයන සැකසුම් කලාපවල පාරිසරික අනුකූලතාවයේ වත්මන් තත්ත්වය පහත දැක්වේ.

| අනු අංක | කලාපය/උද්‍යානය | පාරිසරික ආරක්ෂණ බලපත්‍රය (EPL) සතුකරගැනීමේ වත්මන් තත්ත්වය |
|---|---|---|
| 1. | කටුනායක අපනයන සැකසුම් කලාපය | පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) ලබාගෙන ඇත. |
| 2. | මීරිගම අපනයන සැකසුම් කලාපය | |
| 3. | මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය | |
| 4. | වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | |
| 5. | මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය | |
| 6. | මහනුවර කර්මාන්ත උද්‍යානය | |
| 7. | මාවතගම අපනයන සැකසුම් කලාපය | |
| 8. | පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය | |
| 9. | බියගම අපනයන සැකසුම් කලාපය | පිරිපහදු කළ අපජලයේ සහ රොන්මඩවල ගුණාත්මක භාවයේ අනුකූලතාව සටහන් වුවද, මධ්‍යම පරිසර අධිකාරියට ආයෝජන මණ්ඩලය විසින් පරිනත පොකුණෙහි (maturation pond) රොන්මඩ ඉවත් කිරීම සිදුකිරීම අවශ්‍ය වේ (විටින් විට පොකුණෙන් රොන් මඩ පිටවන බැවින්).<br><br>කෙසේ වෙතත්, පිටවන ස්ථානයේ වානේ ව්‍යූහයක් සවි කිරීම මගින් මෙය දැන් නතර කර ඇත. දැන් බැහැර කරන පිරිපහදු කළ අපජලයෙන් බලපෑමක් නැත.<br><br>තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට නියමිතය.<br><br>(අ) කලාපයෙන් පිරිපහදු කළ අපජලය මුදා හැරීම සඳහා පරිණත පොකුණ (maturation pond) |

| අනු අංක | කලාපය/උද්‍යානය | පාරිසරික ආරක්ෂණ බලපත්‍රය (EPL) සතුකරගැනීමේ වත්මන් තත්ත්වය |
|---|---|---|
| | | මහ හැර පොදු අපජල පවිත්‍රාගාරයේ (CWTP) පිටවන ස්ථානයේ සිට නල මාර්ගයක් එළනු ඇත. නල පද්ධතිය සැලසුම් කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWS&DB) වෙත භාර දී ඇති අතර එය මූලික අදියරේ පවතින අතර සැලසුම් ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.<br>මෙම ක්‍රමය මත පදනම්ව, BOI විසින් EPL නිකුත් කරන ලෙස මධ්‍යම පරිසර අධිකාරියෙන් ඉල්ලා සිටිනු ඇත.<br>(ආ)ප්‍රදේශවාසීන් විසින් මතු කරන ලද විරෝධය සමථයකට පත් කිරීමට, පිරිපහදු කළ අපජලය අඹතලේ ජල ඇතුළු-ගැනුමේ සිට තවදුරටත් පහළට මුදා හැරීමට හැකි වන පරිදි ආසන්න වශයෙන් මීටර් 75 ක ඉතිරි නල මාර්ගය එළීමෙන් අන්තර්වාරක අපවහන මාර්ගය අවසන් කිරීමට උත්සාහ කිරීම. |
| 10. | කොග්ගල අපනයන සැකසුම් කලාපය | EPL නිකුත් කිරීම සඳහා ඝන ද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානය (MRC) සහ මඩිති ගබඩා මඩුව සම්පූර්ණ කිරීම, මධ්‍යම පරිසර අධිකාරියට අවශ්‍ය වේ. ඒවා පිහිටුවීමට මේ වන විට කටයුතු සූදානම් කරමින් පවතී.<br>මඩිති ගබඩා මඩුව පිහිටුවීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති අතර MRC හි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. |
| 11. | හොරණ අපනයන සැකසුම් කලාපය | මේ වන විට පිරිපහදු කළ අපජලයේ ගුණාත්මක භාවයේ අනුකූලතාව සටහන් කර ඇති අතර පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරන ලෙස මධ්‍යම පරිසර අධිකාරියෙන් ඉල්ලා තිබේ. මෙම කලාපය තුළද පොදු අපජල පවිත්‍රාගාරය (CWTP) වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ.<br>පෙර ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 378ක් වුවද, සියලුම ලංසු මිල ගණන් ඉංජිනේරු ඇස්තමේන්තුවෙන් 15% ඉක්මවා ඇත. එබැවින්, අදාළ වත්මන් වෙළඳපල මිල ගණන් සමඟ ඉංජිනේරු ඇස්තමේන්තුව නැවත බැලීමට සහ BOI හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අදාල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියෙන් පසුව නැවත ලංසු කැඳවීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත. |

| අනු අංක | කලාපය/උද්‍යානය | පාරිසරික ආරක්ෂණ බලපත්‍රය (EPL) සතුකරගැනීමේ වත්මන් තත්ත්වය |
|---|---|---|
| 12. | සීතාවක අපනයන සැකසුම් කලාපය | රු. මිලියන 900/-ක CWTP වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව ප්‍රදානය කර, මේ වන විට ආරම්භ කිරීමට වාර්තා කර ඇත (mobilized). |
| 13. | වගවත්ත කර්මාන්ත කලාපය | මූලික මෙහෙයුම් අදියර යටතේ පවතී. සැලකිය යුතු මට්ටමකට ළඟා වූ පසු, EPL සඳහා අයදුම් කරනු ඇත. |
| 14. | බිංගිරිය කර්මාන්ත කලාපය | |

## ඇමුණුම 02

**මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ මාර්ගය ඉදිකිරීම**

එම මාර්ගයේ ඉදිකිරීම් 2012 - 2017 කාලය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) විසින් නිම කරන ලදී. මේ වන විට රු. මිලියන 516.9 ක් RDA වෙත ගෙවා ඇති අතර, රු. මිලියන 113.3 ක හිඟ මුදලක් තිබේ.

මෙම මාර්ගවල මීටර් 160ක් සංවර්ධනය කිරීමට 2021 ප්‍රාග්ධන අයවැයෙන් මුදල් වෙන් කර ඇත. කෙසේ වෙතත්, ආසන්න වශයෙන් කිලෝමීටර් 10ක් නැවත සංවර්ධනය/භාවිතා කළ හැකි තත්ත්වයේ නොතිබූ අතර, එයින් කිලෝමීටර් 5.7ක් ABC යොදා ද, කිලෝමීටර 4.3ක් පමණ බොරළු යොදා ද, නිම කර ඇත. කිලෝමීටර් 10.8 ක මාර්ග දිගුව 2012 වසරේ දී කලාපයේ ඉඩම් කට්ටි කිරීමකට අදාළව සිදු කර ඇති අතර, මේ වන විට මෙම ඉඩම්, විශාල කැබලි ලෙස ආයෝජකයන් වෙත මහා පරිමාණ කර්මාන්ත සඳහා ආයෝජනය කිරීමට ලබා දීමට සැලසුම් කරමින් ඇත.

ඒ අනුව හඳුනාගත් මහා පරිමාණ කර්මාන්ත සඳහා ඉඩම් ලබාදීමේදී එවැනි ඉඩම් කට්ටිවලට අයත් වන කොටස් අත්හැර, එම ඉඩම් කැබලිවලට ප්‍රවේශය සැපයීමට අවශ්‍ය මාර්ගවල කොටස් පමණක් සම්පූර්ණයෙන් සංවර්ධනය කරනු ඇත.

කිලෝමීටර් 10.8 ක මාර්ගයේ හිඟ මුදල් ගෙවීමට පෙර ඉදිකරන ලද මාර්ගවල උප පාදම (sub base) සඳහා භාවිතා කරන බොරළුවල (gravel) ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය එකඟ වී තිබේ.

**ඇමුණුම 03**

| | | |
|---|---|---|
| 21 | <u>යොවුන්පුර වැඩසටහන</u><br><br>කමිටුව නිරීක්ෂණය කළ පරිදි 2018 සහ 2019 වර්ෂයේ යොවුන් පුර වැඩසටහන සඳහා රුපියල් මිලියන 350 ක ඇස්තමේන්තු කළ පිරිවැය ඉක්මවා රු. 80,560,914/= ප්‍රමාණයක් වියදම් කර ඇත. මෙහි දී රුපියල් 2,227,400/= ක ප්‍රමාණයක් ප්‍රසම්පාදන ක්‍රියාවලියට පරිබාහිරව ගබඩා නේවාසිකාගාර දෙකක් කුලියට ගැනීම සඳහා කළ වැඩිපුර ගෙවීම, තාක්ෂණ ඇගයීම් කමිටුවෙහි අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ටී ෂර්ට් ඇණවුමක් සඳහා රු. 1,932,500/= මුදලක් ගෙවීම ආදිය මීට ඇතුළත් වේ.<br><br>මෙම කරුණ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට 2020.12.30 වන දින අමාත්‍යංශ අතිරේක ලේකම්වරයා ප්‍රධාන කමිටුවක් පත් කර ඇති බවත් මේ වන විට කමිටුවේ නිර්දේශ පදනම් කරගෙන මෙම ගැටලුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකර ඇති බව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා සහ ගණන් දීමේ නිලධාරියා විසින් කමිටුවට දැනුම් දෙන ලදී.<br><br>මෙම කරුණ සඳහා අභ්‍යන්තර පරීක්ෂණයක් ආරම්භ කර පොලිස් පරීක්ෂණ සමඟ ඉදිරියට කරගෙන යන ලෙස කමිටුව විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා/ගණන් දීමේ නිලධාරියා වෙත උපදෙස් ලබා දෙන ලදී. මෙම ගැටලුව විසඳෙන තෙක් යොවුන්පුර වැඩසටහනට අදාළව ගෙවීම් සම්බන්ධව ඉල්ලීම් නොකරන මෙන් කමිටුව විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා/ගණන් දීමේ නිලධාරියා වෙත උපදෙස් ලබා දෙන ලදී. | යොවුන්පුර වැඩසටහනට අදාලව ටී ෂර්ට් මිලදී ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කටයුතු කර ඇති අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පරීක්ෂා කර ඔවුන්ගේ නිර්දේශ ප්‍රසම්පාදන මණ්ඩලය වෙත ලබා දීමෙන් අනතුරුව ප්‍රසම්පාදන මණ්ඩලය විසින් ලබා දී ඇති අනුමැතිය ප්‍රකාරව සඳරුවන් ෆැෂන් ආයතනය වෙතින් රු.8,823,000 ටී ෂර්ට් මිලදී ගෙන ඇත.එසේ මිලදී ගත් ටී ෂර්ට් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බවට අදාල විෂය භාර නිලධාරින් විසින් අධ්‍යක්ෂ ජනරාල් වෙත කරන ලද ඉල්ලීමකට අනුව තිබූ හදිසි අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන අතිරේක වශයෙන් රු. 1,401,300 ඇණවුම උක්ත ආයතනය සඳහා ම ලබා දීමට ප්‍රසම්පාදන මණ්ඩලය අනුමැතිය මත ලබා දීමට කටයුතු කර ඇත.මෙහිදී ප්‍රසම්පාදන මණ්ඩලය විසින් නැවත ඇණවුමක් නිසා පිරිවිතරයන්ගේ සංශෝධන නොමැති නිසා තාක්ෂණික කමිටු නිර්දේශ ලබා ගැනීමට කටයුතු කර නැත.<br><br>ඒ අනුව මෙම කාරක සභා නිර්දේශයේ සටහන පරිදි තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතියක් (නිර්දේශ) ලබා නොගෙන කටයුතු කිරීම පිළිබඳව පෙන්වා දුන්නද මෙම ගනුදෙනුවේදී නැවත ඇණවුමක් බැවින් (Reorder) තාක්ෂණික කමිටු අනුමැතියක් (නිර්දේශයක්) අවශ්‍ය නොවන බව පෙන්වා දෙමි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 වගන්තිය ප්‍රකාරව නැවත ඇණවුම් කිරීම සිදු කල හැකි බව පෙන්වා දී ඇති අතර එම වගන්තියේ 3.6.1 (ඇ) අනුව මුල් කොන්ත්‍රාත් වටිනාකමින් 50% ක සීමාවක් දක්වා නැවත ඇණවුම් කිරීම සිදු කල හැකි බව දක්වා ඇති හෙයින් ඒ අනුව කටයුතු කර ඇති බැවින් මෙම ගනුදෙනුවේ නිවැරදිතාවය තහවුරු වන බව කාරුණිකව දන්වා සිටි.<br><br>මෙම ඡේදයේ දක්වා ඇති පරිදි යොවුන්පුර වැඩසටහනට අදාලව ඩෝම් කුලී පදනම මත ලබා ගැනීම සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපාටියට අනුගමනය කරමින් southern rentals ආයතනය වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.එම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී එක් එක් ඩෝම් හි වර්ග අඩි ප්‍රමාණය මත පදනම්ව ගෙවීම් කිරීමට පෙර එක් එක් ඩෝම් හි ප්‍රමාණයන් මැන ගෙවීම් කිරීම සිදු කර ඇත.(measure and pay )<br><br>නමුත් යොවුන්පුර වැඩසටහන කරගෙන යෑමේදී මෙහෙයුම් කමිටුව විසින් හා තාක්ෂණිකව හදිසි අවශ්‍යතා සේ සලකා බලා තවදුරටත් අත්‍යවශ්‍ය යැයි සලකා වර්ග අඩි 40 x 120 ඩෝම් 01 ක්ද 30 x 100 ඩෝම් 01 ක්ද අමතර දින ගණනක් සඳහා අවශ්‍යතාවය මත අමතර දින 10 ක් හා දින 08 ක් සඳහා ඉල්ලීම් කර ඇත.එම ඉල්ලීම සලකා බලා ප්‍රසම්පාදන මණ්ඩලය විසින් නැවත ප්‍රසම්පාදන කමිටු තීරණයක් 2019.05.14 දින ප්‍රසම්පාදන තීරණ 128 යටතේ අනුමැතිය ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| | | ඒ අනුව ඉහත ප්‍රසම්පාදන කාර්යයන් දෙකම ඇති වූ හ... අවශ්‍යතා මත සිදු කර ඇති අතර ඒවා ප්‍රසම්පාද... මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව සිදු කර ඇති ... තවදුරටත් දන්වා සිටිමි. ඒ කෙසේ වුවද කාරක සභාවේ... පෙන්වා දී ඇති පරිදි මේ පිළිබඳව විමර්ශනය කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස කර ඇති නිර්දේශ පරිදි දැනටමත් ලිඛිත පැමිණිල්ලක් අමාත්‍යාංශය විසින් සිදු කර ඇත.මීට අමතරව අභ්‍යන්තර විමර්ශනයක් සිදු කිරීම සම්බන්ධව ගත යුතු පියවර සම්බන්ධව සාකච්ඡා කල අතර සභාවේ නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් මඟින් විමර්ශනය සිදු කිරීම ප්‍රායෝගික හා ලබැදියාවන් පිළිබඳ ගැටළුවක් ඇති වන බැවින් (conflicts of interest ) විනිවිදභාවයෙන් මෙම කටයුතු සිදු කිරීමට අමාත්‍යාංශය වෙත දැන්වීමටත් කටයුතු කර ඇත.<br><br>ඒ පිළිබඳ ප්‍රගතිය ඉදිරියේදී විගණකාධිපතිවරයා වෙත යොමු කරන බව කාරුණිකව දන්වමි. එතෙක් මීට අදාල ගෙවීම් නවතා ඇති බවද කාරුණිකව දන්වමි. |

**ඇමුණුම 04**

| | |
|---|---|
| <u>තරුණ තොරතුරු පත්‍රිකා</u><br><br>2017 වර්ෂයේ දී රු. 1,822,400/= පිරිවැයක් දරා දැනට ඉවත දැමීමට සිදුව ඇති 268, 000 ප්‍රමාණයක තරුණ තොරතුරු පත්‍රිකා රැසක් මුද්‍රණය කරමින් මහජන මුදල් අවභාවිත කළ නිලධාරීන් හඳුනා ගැනීමට කිසිදු පියවරක් ගෙන නැති බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.<br>මෙම කාරණාවට අදාළව වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමට කමිටුවක් පත්කර ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන , අවසාන තීරණය පිළිබඳ මාස 03 ක් ඇතුළත කමිටුවට නැවත දන්වන ලෙස ප්‍රධාන ගණන් තැබීමේ නිලධාරි/ගණන් තැබීමේ නිලධාරි වෙත කමිටුව මඟින් උපදෙස් ලබා දෙන ලදී. | මෙම වියදම සම්බන්ධව සභාවේ නීති අංශය මඟින් විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට උපදෙස් ලබා දී ඇති අතර එම අංශය මඟින් දැනටමත් මේ සම්බන්ධයෙන් මූලික කටයුතු සිදු කරමින් පවතී . ඒ අනුව මූලික විමර්ශනය හා විනය පරීක්ෂණය පැවැත්වීම සඳහා බාහිර විනය පරීක්ෂණ නිලධාරියෙකු වෙත යොමු කිරීමට පියවර ගෙන ඇත. මෙම වියදම සම්බන්ධයෙන් සලකා බලන විට බැලූ බැල්මට මෙම කරුණ පිළිබඳව සිදු කරන ලද සන්නිරීක්ෂණ පරීක්ෂාවේදී මුදල් අවභාවිතාවක් සිදු වී ඇති බවට කරුණු පෙනී යන හෙයින් මූලික විමර්ශනය හා විධිමත් විනය පරීක්ෂණය පැවැත්වීම සඳහා බාහිර නිලධාරියෙකු වෙත පැවරීමට මේවන විට කටයුතු කර ඇත. (ඇමුණුම 13) |

**ඇමුණුම 05**

| | |
|---|---|
| <u>ආයතන හතරකින් අරමුදල් ලැබීම.</u><br><br>බාහිර ආයතන 04 කින් 2015 වර්ෂයේ ලද රු. 4,959,409/= මුදල අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොමැති බවත් රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන පරිදි රාජ්‍ය නොවන සංවිධානයකට එකතුව රු. 1005,000/= මුදලක් ගෙවා ඇති බව ද කමිටුව නිරීක්ෂණය කරන ලදී.<br><br>එම කාල සීමාව තුළ ගිණුම් සම්බන්ධව කටයුතු කළ නිලධාරීයාට එරෙහිව පරීක්ෂණයක් පැවැත්වීමට සහ මසක් තුළ මොවුන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව කමිටුවට දැනුම් දෙන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා/ ගණන් දීමේ නිලධාරියා වෙත දැනුම් දෙන ලදී. | මෙම අරමුදල් භාවිතා කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ (මුදල්) විසින් පසුගිය වර්ෂ වලට අදාල මුදල් පොත් හා බැංකු ප්‍රකාශ දීර්ඝ වශයෙන් පරීක්ෂා කර ඇති අතර එහිදී භාණ්ඩාගාරයේ අක් මුදල් ලැබීම් වල ප්‍රමාද වීම හා සීමාවන් හේතුවෙන් සභාවේ හදිසි අවශ්‍යතා සඳහා වියදම් දැරීමට එම අරමුදල් භාවිතා කර ඇති බව සොයාගෙන ඇත. මෙහිදී එම හදිසි අවශ්‍යතා වියදම් දැරීම අනිවාර්යය හා කල් දැමිය නොහැකි තත්ත්වයන් මත සභාවේ කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා කටයුතු කර ඇති බව පෙනේ.<br><br>තවද මෙම කාල වකවානුව තුල නිසි පරිදි භාණ්ඩාගාර අක් මුදල් ලැබීම් සිදු වී නොමැති බවට වාර්තා වී ඇති අතර ඒ නිසා උක්ත බාහිර පාර්ශවයන්ගේ ලැබීම් වලින් කරන ලද වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී ඇති බව වාර්තා කරමි.<br><br>තවදුරටත් මේ සම්බන්ධයෙන් විෂය භාරව කටයුතු කල නිලධාරිනිය කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මිය ගොස් ඇත. එම නිසා මේ පිළිබඳව ක්‍රියා මාර්ග ගැනීමට අපහසු තත්ත්වයක් මතු වී ඇත . නමුත් මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කර ඉදිරියේදී මෙවැනි සිදු වීම් සිදු නොවීමට වගබලා ගනු වස් අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් දැනටමත් ගිණුම් අංශයේ ගිණුම් නිලධාරින් වෙත හඳුන්වා දීමට පියවර ගෙන ඇත. ඒ අනුව ඉදිරියේදී මෙවැනි දුර්වලතා නැති කර ගැනීමට හැකි බව පෙන්වා දෙමි.<br><br>අභ්‍යන්තර විගණන අංශය විසින් මෙම කරුණ සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේදී මෙම ප්‍රසම්පාදන කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව සිදු කර ඇද්ද යන්න පරීක්ෂා කර ඇති අතර කරන ලද දීර්ඝ විමර්ශනයට අනුව ඉදිරිපත් කර ඇති එම වාර්තාවේ නිර්දේශ සලකා බලා ඉදිරි පියවර ගැනීම සඳහා නීති අංශය වෙත යොමු කර ඇති අතර ඉදිරි කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. |

**ඇමුණුම 06**

ලේකම් / செயலாளர் 011-2381798, 011-2321222
කාර්යාලය / அலுவலகம் / Office 011-2321222
ෆැක්ස් / பெக்ஸ் / Fax 011-2436672, 011-2324131
විද්‍යුත්තැපැල / மின்னஞ்சல் / E-mail secretary@tourismmin.go
වෙබ්අඩවිය / இணையம் / Web Site www.tourismmin.gov.lk

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
சுற்றுலாத்துறைமற்றும் காணிஅமைச்சு
MINISTRY OF TOURISM AND LANDS
සංචාරක අංශය
சுற்றுலாத்துறைபிரிவு
Tourism Section
දෙවන මහල, ඇසෙට් ආකේඩ් ගොඩනැගිල්ල, 51/2/1, යෝර්ක් වීදිය, කොළඹ 01.
2 ஆம்மாடி, எஸட்ஆகேட் கட்டிடம், 51/2/1,யோர்க் வீதி, கொழும்பு 01.
2nd Floor, Asset Arcade Building, 51/2/1, York Street, Colombo 01.

මගේඅංකය / எனது இல / My No. MT/IAI/1/4/COPE-SLTDA
ඔබේඅංකය / உமது இல / Your No
දිනය / திகதி / Date 29.08.2022

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාංශය
R-6835
3797
07 SEP 2022
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

Secretary
Committee on Public Enterprises
Parliament of Sri Lanka
Sri Jayewardenepura Kotte

**Responses for the Minutes of COPE Meeting held on 26th November 2021**

With reference to the minutes date on 10th December 2021, the necessary actions taken on the recommendations made by the minutes are submitting for your perusal as update 1 to the reply submitted with reference no MT/IAI/1/4COPE/-SLTDA on 10.02.2022.

1. **Minutes No. 1 - NEW TOURISM ACT 2022**

   Update 1: Since the preparation work of the Tourism Act is still being done, it was requested an extra time period of three months to submit the same to the Parliament from May to July 2022.

2. **Minutes No. 02 - Submission of annual reports 2019 to the parliament**

   Update 1: Annual report 2019 has been submitted to the Parliament.

3. **Minutes No.03 - Comprehensive plan**

   Update 1: Comprehensive plan has been submitted.

4. **Minutes No.04 - Action plan**

   Update 1: The Action Plan has been submitted.

5. **Minutes No. 5 KALPITIYA ISLAND RESORT**

   Update 1 : Current progress status of the 12 islands as at June 2022 are as follows:

   Island 1 - Ippanthivu (Tourist Resort)

   Agreement was signed on 2 September, 2010 with the investor Qube Lanka Leisure Propreties (Pvt) Ltd. The investor demands relocating the fishermen. Since this is not possible, as a solution, the SLTDA suggested making use of fishermen's activities as tourist attractions. As the investor is keeping rejecting the solution, discussions are being

held to solve out the solution and SLTDA had a zoom meeting with the investor and subsequently they have informed the SLTDA in writing that as per the current circumstances, moving ahead with the Ippantivu island project is not feasible for them and thus requested SLTDA to consider exchanging it for a more suitable land somewhere else in the country. We have asked them for their interested areas/locations and the required land extent in order to check with Ministry of Tourism and Lands for any possibility of the same.

Island 2 – Vellai I (water banglow)
Island 3 – Vellai II (water banglow)
Island 4 - Vellai II (water banglow)

Agreements were signed on 13 July, 2011 with the investor Sun Resort Investment Lanka (Pvt) Ltd. Cabinet approval has been given and the contractors have been shortlisted. Construction work will be commenced as soon as the fuel crises ended.

Island 5 – Sinna Iramative (star hotel)

Update-1: Agreements were signed on 14 December, 2020 with the investor Samagi Hotels and Travels (Pvt) Ltd and they confirmed the design and documentation work is ongoing for submitting the IRU application for approvals.

Island 6 – Eramative West (star hotel)

Update-1: Agreements were signed on 7 March, 2022 with the investor Samagi Hotels and Travels (Pvt) Ltd and they confirmed the design and documentation work is ongoing for submitting the IRU application for approvals

Island 7 – Sinnarachchal (star hotel)

Update-1: Agreements were signed on 20 April, 2022 with the investor Nucleus International (Pvt) Ltd and there is a delay in finalizing documents for IRU application submission due to travel limitation/fuel crisis.

Island 8 – Uchchamunai (Integrated Resort Development Project)

Update-1: Agreements were signed on 11 May, 2022 with the investor Blue Ocean Island Resort and although the lease documents were signed on 11th May 2022, since the investor failed to make the relevant stamp duty and rental payments within the given time period, the signed document became null and void as it was not registered. We have got instructions from the Secretary, Ministry of Tourism to cancel this project and look for new investors for this island.

Island 9 – Eramative (Kalpitiya Integrated Tourism Resort Project)

Update 1: The lease agreement was signed and the design work/documentation is in process for submitting IRU application for approvals.

Island 10 –Periyaachchal ( Kalang Water Villa)

Update 1: The lease agreement signing got delayed due to fuel crisis and now it is expected to be completed by September week 1 with the investor 365 Construction (Pvt) Ltd.

Island 11 –Kakative – (Semi Luxury Adventure Camping)

Update 1: Following up with investor and the signing of the lease agreement is expected to be completed by September 2022 with the investor Capital Corp International (Pvt) Ltd.

Island 12 –Baththalangunduwa

Update 1: Available for potential investors.

**ඇමුණුම 07**

**Minutes No.14 –Rest houses owned by SLTDA**

Update-1 :The explanations for not being able to lease the same are as follows:

i. Nalanda Rest House –In 2008, lease agreements were terminated due to long overdue lease arrears and possession was taken over. Bids were called again with lease rentals mentioned in the paper advertisements, but no bid was received. By now the SLTDA has unsuccessfully called for bids several times and one key reason for this could be the current political and economic situation in the country.

ii. Bibila Rest House –Previous lease agreement started in 2016 and it failed its continuation due to encroachment issues created by the Bilila Pradeshiya Sabha. To handle the Bibila Pradesiya Sabha encroachment issue, the SLTDA requested the Bibila Divisional Secretary (DS) to assist us in preparing a survey plan to clearly demarcate the encroached land areas. Once this is done, SLTDA intends to hand over the encroached land area to the Bibila DS and take necessary action to find an investor to develop the remaining property. Accordingly, the DS of Bibila has issued a survey order and initiated the survey, which is expected to be carried out soon.

iii. Baththuluoya Rest House –Previous agreement was in 2016 and the investor has handed back the property due to reservation and community issues. Bids were called again with lease rentals mentioned in the paper advertisements, but no bid was received. By now the SLTDA has unsuccessfully called for bids several times and one key reason for this could be the current political and economic situation in the country.

iv. Anamaduwa Rest House – Possession was handed over back to SLTDA and Bids were called again with lease rentals mentioned in the paper advertisements, but ONLY one bid was received and that too was rejected by the TEC stating it was not upto the required standard. By now the SLTDA has unsuccessfully called for bids several times and one key reason for this could be the current political and economic situation in the country.

v. Ragala Rest House – After the possession was handed over in 2010, an encroachment issue was found and a court case has been filed to evacuate the encroacher. In the court proceedings so far, the SLTDA had filed objections and the court decision can be expected after the illegal occupant completes his submissions to court.

vi. Weeraketiya Rest House –The property was taken back and the legal action is underway to recover long overdue lease arrears. Since suitable investors were not found, SLTDA re-called with lease rental details but not receive any tender due to current political and economic situation in the country.

vii. Hettipola Rest House –New investor was found and Lease agreement is ready and is expected to be signed during August 2022.

**viii.** Galgamuwa Rest House –Two court cases were going on against the former lessee and the encroacher and it was obtained from earlier lessee through court procedure. The alternative land proposed by the DS was not suitable and acceptable to the SLTDA. Meanwhile, the Galgamuwa Pradeshiya Sabha who had encroached part of the property, where they operate a library, playground and a pre-school initiated discussions with SLTDA and agreed to lease out the said encroached area from SLTDA as per government valuation. The SLTDA is in the process of obtaining the board approval for this request to proceed

ix. Ulankulama Rest House –Since the rest house occupant did not pay past arrears as discussed and mutually agreed, the SLTDA decided not to extend the lease and issued quit notice to them to handover the legal possession of the rest house back to SLTDA on or before 25th June 2022. Since this was not done, the SLTDA's legal division had started and will continue legal proceedings to get back the property.

**ඇමුණුම 08**

**Minutes No.20 - Digital Nomads**

**Minutes of the COPE MEETING HELD ON 26TH November 2021 Minutes No.20 – Digital Nomads**

Update- 1:

**Progress 2020-21**

Sri Lanka Tourism identified the potential in digital nomads. In this regard a cabinet paper MT/2021/41 was submitted and cabinet approval number අමප /21 /1160 /327/037 dated 20th July 2021 is attached.

Thereafter, together Ministry of Technology a joined Cabinet paper has been submitted to the Ministry of Tourism which is being finalized with the department of immigration and Emigration.

Digital Nomads

Sri Lanka was recently recognized as one of the top destinations for digital Nomads. Emerging second in Club Med's index of the best places and countries around the world to become Digital Nomad. Club Med collected at assessed data in line with growing demand for the nomadic lifestyle enables travelers to escape to picturesque locations where they can work remotely from. This recognition comes just as Sri Lanka Tourism is charting a new part and offers yet another avenue to market the island in a bid to boost Tourism.

Sri Lanka is positioned well to promote the "work from your own tropical paradise ''concept and Sri Lanka Tourism recognizing is facilitating the expansion of the digital Nomad market part of its sustainable strategies.

This strategy hasreceived prominence globally with inclusions listings such as the Club Med listing with cabinet paper being approved by the government, Sri Lanka Tourism is currently working on securing the necessary framework to support the expansion of this market and accordingly the introduction of the special visa category for one year was approved for digital nomads which is essential to secure segment.

**Way forward 2022/23**

**ENABLERS TO ATTRACT DIGITAL NOMADS**

- Facilitate to grant long visa category to applicant and partner? Spouse/family
- Facilitate strong and stable WIFI connectivity and technical supported by ICTA and TRC
- Support of the Department of Immigration and Emigration
- Launch a Promotional Campaign
- Double taxation arrangement

## ඇමුණුම 09

<u>**නිරීක්ෂණ**</u>

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශිත අවම මිල ගණන් සහිත සැපයුම්කරු ප්‍රසම්පාදන කමිටුව මගින් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව සාධාරණ හේතුවක් දක්නට නොමැත.

එසේම එලෙස අවම මිල ගණන් සහිත ලංසුව ප්‍රතික්ෂේප කළේ නම් තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් නිර්දේශිත ඊළගට සුදුසුකම් ලත් ආයතනයට මෙම ටෙන්ඩරය ප්‍රදානය නොකර, අලුතින් මිල ගණන් කැදවීමට තීරණය කිරීමේ ක්‍රියාවලියට කිසිදු සාධාරණ හේතුවක් දක්වා නොමැත.

අවම ලංසුකරුගේ සේවා ප්‍රශ්නයක් තිබේ නම් එය ප්‍රතික්ෂේප කිරීම වෙනුවට අමතරව බැඳුම්කරයක් තබාගැනීම වැනි විකල්ප ක්‍රමවේදයක් භාවිතා කර ලංසුව ප්‍රදානය කිරීමට අවස්ථාව තිබුණි.

තවද, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය වූයේ නැවත ලංසු කැඳවීම වන බැවින් පරිගණක කුලියට ගැනීම වෙනුවට ආයතනයේ භෞතිකව පවතින පරිගණක ලබාගත හැකිව තිබූ බව නිරීක්ෂණය කරමු. එසේම පළමු ප්‍රසම්පාදන කමිටුව 2018 ජනවාරි 25 වන දින කැඳවන ලද අතර මෙහි සාමාජිකයකු වූ මානව සම්පත් අංශයේ ප්‍රධානී විසින් 2018.01.24 දින එහි පවතින අඩුපාඩු සම්බන්ධයෙන් ලිඛිත ලියවිල්ලක් (ඇමුණුම 6) ලබාදීම සදාචාරාත්මකව සුදුසු නොවන බවද නිරීක්ෂණය කරමු.

තවද, තාක්ෂණික ඇගයීම් කමිටුව ලංසු පරීක්ෂා කර 2017.12.28 දින ලබාදුන් නිර්දේශ අනුව පරිගණක මිලදී ගත්තේ නම් එම පරිගණක සඳහා අවුරුදු 5 ක පූර්ණ වගකීම් කාලසීමාවක් පවතින හෙයින් (ඇමුණුම 5) 2018.02.01 දින පරිගණක මිලදී ගත්තේ නම් 2023.02.01 දින දක්වා එම පූර්ණ වගකීම් කාල සීමාව වලංගුවේ. 2018.10.19 දින ඇණවුම් කළ (ඇමුණුම 19), 2018.12.31 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබා දුන් (ඇමුණුම 20) පරිගණක සඳහා අවුරුදු 3 ක පූර්ණ වගකීම් කාල සීමාවක් පවතින හෙයින් 2021.12.31 දක්වා එම පූර්ණ වගකීම් කාල සීමාව වලංගු වේ.

වගු අංක 1 හි අංක 1 යටතේ සඳහන්, පරිගණක 7ක් මිළදී ගැනීමේ ක්‍රියාවලියට අදාලව පරිගණක මිළදී ගත්තේ නම් එම පරිගණක තවමත් පූර්ණ වගකීම් කාලසීමාවක් සහිතව භාවිත කළ හැකිව තිබුණි.

ඉහත කරුණු විධිමත් ලෙස විශ්ලේෂණය කිරීමේදී, ප්‍රසම්පාදන මූලධර්ම විධිමත් ආකාරයට අනුගමනය නොකිරීම, නොසැලකිලිමත්කම හා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් නොමැතිවීම නිසා රජයට මූල්‍යමය පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය කරමු.

එබැවින් රජයට සිදුවූ මූල්‍යමය පාඩු හඳුනා ගැනීම සඳහා මු. රෙ. 104 ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කිරීම සුදුසු බව නිර්දේශ කරමු.

## වාර්තාවේ ඇතුළත් ආයතනයන්හි බදු පෙර ලාභය/ (අලාභය) හෝ අතිරික්තය/ (ඌණතාවය)

## Profit/ (Loss) – Before Tax or Surplus/ (Deficit)

| අනු අංකය | ආයතනය | බදු පෙර ලාභය/ (අලාභය) (රු.) | | |
|---|---|---|---|---|
| | | **2018** | **2019** | **2020** |
| 1 | සීමාසහිත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම | (1,814,145,920) | (1,430,139,698) | 749,367,009 |
| 2 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 294,903,720 | 133,531,433 | (101,499,213) |
| 3 | ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය | 30,259,836 | 79,270,675 | 161,112,102 |
| | | අතිරික්තය/ (ඌණතාවය) (රු.) | | |
| | | **2018** | **2019** | **2020** |
| 7 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 851,416,121 | 1,273,511,883 | 968,139,227 |
| 8 | ජාතික තරුණ සේවා සභාව | (109,356,000) | (330,627,000) | (198,007,000) |
| 9 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 121,635,246 | 1,291,127 | 285,236,301 |
| 10 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 74,704,144 | 12,267,136 | 29,882,647 |